71 වන කාණ්ඩය
25 වන කලාපය

ඉරිදා
1967 මැයි 21

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

## නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ

## නිල වාර්තාව

3408

### අන්තර්ගත ප්‍රධාන කරුණු

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [තී. 3998]

පරිපූරක මුදල [තී. 4029]

තේ (විකුණුම් බදු) පනත් කෙටුම්පත [තී. 4094] :
දෙවන වර කියවා කාරක සභාවෙහිදී සලකා බලන ලදී.

කල් තැබීමේ යෝජනාව [තී. 4133]

ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු [තී. 4145]

PUBLIC LIBRARY
JAFFNA.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 71
இல. 25

ஞாயிற்றுக்கிழமை
21 மே 1967

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

## பிரதிநிதிகள் சபை

அதிகார அறிக்கை

பிரதான உள்ளடக்கம்

வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப. 3998]

குறைநிரப்புத் தொகை [ப. 4029]

தேயிலை (விற்பனை வரி) மசோதா [ப. 4094] :
இரண்டாம் முறை மதிப்பிடப்பட்டு குழுவில் ஆராயப்பட்டது

ஒத்திவைப்புப் பிரேரணை [ப. 4133]

வினாக்களுக்கு எழுத்துமூல விடைகள் [ப. 4145]

---

Volume 71
No. 25

Sunday,
21st May 1967

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## HOUSE OF REPRESENTATIVES

OFFICIAL REPORT

PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS [Col. 3998]

SUPPLEMENTARY SUPPLY [Col. 4029]

TEA (SALES TAX) BILL [Col. 4094]
Read a Second time, and considered in Committee

ADJOURNMENT MOTION [Col. 4133]

WRITTEN ANSWERS TO QUESTIONS [Col. 4145]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලිපිලේඛනාදිය පිළිගැන්වීම

# නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

பிரதிநிதிகள் சபை

*House of Representatives.*

1967 මැයි 21 වන ඉරිදා

ஞாயிற்றுக்கிழமை, 21 மே 1967

*Sunday, 21st May 1967*

---

**පූ. භා. 10ට මන්ත්‍රී මණ්ඩලය රැස් විය. නියෝජ්‍ය කථා නායකතුමා [සී. එස්. ෂර්ලි කොරයා මහතා] මූලාසනාරූඪ විය.**

சபை மு.ப. 10 மணிக்குக் கூடியது. உப சபாநாயகர் [திரு. சி. எஸ். ஷெர்லி கொறயா] தலைமை தாங்கினர்.

*The House met at 10* A.M., MR. DEPUTY SPEAKER [MR. C. S. SHIRLEY COREA] *in the Chair.*

---

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම

சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்

PAPERS PRESENTED

Addendum to Annual Report of the River Valleys Development Board for 1964-65 Audited Accounts and Balance Sheets of Gal Oya, Udawalawe and Sugar Industries with the Auditor-General's Reports and the Chairman's comments thereon.—

[ගරු එම්. ඩී. බණ්ඩා, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමති වෙනුවට]

**සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

சபாபீடத்தில் இருக்க கட்டளையிடப்பட்டது.

*Ordered to lie upon the Table.*

1966-67 අංක 15 දරණ පරිපූරක ඇස්තමේන්තුව —[ගරු ආචාර්ය දහනායක]

**සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

சபாபீடத்தில் இருக்க கட்டளையிடப்பட்டது.

*Ordered to lie upon the Table.*

Regulations made under Section 63 of the Wages Boards Ordinance (Cap. 136). —[ගරු එම්. එච්. මොහමඩ්]

**සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

சபாபீடத்தில் இருக்க கட்டளையிடப்பட்டது.

*Ordered to lie upon the Table.*

වාචික පිළිතුරු

Accounts of Air Ceylon Ltd., for the year ended March 31, 1964, together with the Auditor-General's Report thereon.— —[ගරු හුරුල්ලෙ]

**සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

சபாபீடத்தில் இருக்க கட்டளையிடப்பட்டது.

*Ordered to lie upon the Table.*

1964 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ලංකා පොල් මණ්ඩලයේ ගණන් හිලව් පිළිබඳ පරීක්ෂිත ප්‍රකාශය.—[එස්. ඒ. පීරිස් මයා.]

**සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

சபாபீடத்தில் இருக்க கட்டளையிடப்பட்டது.

*Ordered to lie upon the Table.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු

வினாக்களுக்கு வாய்மூல விடைகள்

ORAL ANSWERS TO QUESTIONS

### පැට්රල් ගබඩා සේවකයන්ට පඩි පාලක සභාවක්

பெற்ரோல் நிரவுநிலைய ஊழியர்களுக்கு சம்பள நிர்ணயச் சபை

WAGES BOARD FOR EMPLOYEES OF PETROL FILLING STATIONS

2. **සී. එන්. මැතිව් මයා.** (කොලොන්න)
(திரு. சீ. என். மதியூ—கொலன்ன)
(Mr. C. N. Mathew—Kolonna)

**කම්කරු, රැකීරක්ෂා හා නිවාස ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය:** (අ) පැට්රෝල් ගබඩාවල සේවය කරන සේවකයින්ගේ පඩි සහ වෙනත් සේවා කොන්දේසි නිගමනය කරන පිණිස පඩි පාලක සභාවක් පිහිටුවා තිබේදැයි, එතුමා මන්ත්‍රී මණ්ඩලයට දන්වනවාද? (ආ) නො එසේ නම්, එසේ පත් කිරීම ප්‍රමාද වීමට හේතු කවරේද? (ඉ) පඩි පාලක සභාවක් පිහිටුවීමට එතුමා බලාපොරොත්තු වන්නේ කවදාද?

தொழில், தொழில்வசதி, வீடமைப்பு அமைச்சரைக் கேட்ட வினா: (அ) பெற்ரோல் நிரவு நிலையங்களில் கடமைபுரிவோரின் சம்பளம், ஏனைய சேவை நிபந்தனைகள் ஆகியவற்றை நிர்ணயிக்க ஒரு சம்பள நிர்ணயச் சபை நிறுவப்பட்டிருக்கின்றதா என இச்சபைக்கு அவர் தெரிவிப்பாரா? (ஆ) இல்லையெனில் தாமதத்திற்கான காரணம் என்ன? (இ) சம்பள நிர்ணயச் சபையொன்றை எப்பொழுது நிறுவ உத்தேசிக்கின்றார்?



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මැතිව් මයා.]

asked the Minister of Labour, Employment and Housing: (a) Will he inform the House whether a wages board has been established to determine the wages and other conditions of service of employees in petrol filling stations? (b) If not, what is the reason for the delay? (c) When does he propose to establish a wages board?

**එස්. ද එස්. ජයසිංහ මයා. (කම්කරු, රැකීරක්ෂා හා නිවාස ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. எஸ். டி எஸ். ஜயசிங்ஹ—தொழில், தொழில் வசதி, வீடமைப்பு அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. S. de S. Jayasinghe—Parliamentary Secretary to the Minister of Labour, Employment and Housing)

(අ) නැත. පෙට්රෝල් සේවා ස්ථානයන්හි සේවය කරන සේවකයින් ආවරණය වන්නේ සාප්පු හා කාර්යාල සේවක පණත යටතේ වන අතර, පඩි පාලක සභා ආඥා පනතින් නොවේ. එම නිසා ඔවුන් සඳහා පඩි පාලක සභාවක් පිහිටුවීමේ ප්‍රශ්නය පැන නොනගී. කෙසේ වෙතත්, සාප්පු හා කාර්යාල සේවක පණතේ 25 (1) වැනි වගන්තිය යටතේ පෙට්රෝල් සේවා ස්ථානයන්හි සේවකයින් වෙනුවෙන් අවම වේතනය තීරණය කිරීම සඳහා වේතන විනිශ්චය සභාවක් පිහිටුවීමට කට යුතු සලස්වා ඇත. එම සේවකයින් ගේ අනිකුත් සේවා තත්ත්වයන් පිළිබඳ තීරණයන් සාප්පු හා කාර්යාල සේවක පණතේ ඇති ප්‍රතිපාදනයන් අනුව දැනට තීරණය කරනු ඇත. (ආ) පැන නොනගී. (ඉ) පැන නොනගී.

**බී. වයි. තුඩාවේ මයා.** (මාතර)

*(திரு. பி. வை. துடாவ—மாத்தறை)*

(Mr. B. Y. Tudawe—Matara)

දේශපාලන කටයුතුවල නිරත වීමට මෙම සේවකයන්ට ඉඩ තිබෙනවද?

**එස්. ද එස්. ජයසිංහ මයා.**

*(திரு. எஸ். டி எஸ். ஜயசிங்க)*

(Mr. S. de S. Jayasingha)

තියෙනව. පෙට්රෝල් ගබඩාවල සේවකයින් රජයේ අය නොවෙයි. එම නිසා දේශපාලන කටයුතු කිරීමට නිදහස ඒ අයට තියෙනව.

## වලපනේ සෙන්ට් ලෙනාඩ්ස් රජයේ බදු ඉඩම් හිමි ඊ. අබ්දුල් රහීම් මහතා

ஜனாப் ஈ. அப்துல் றஹீம், அரசாங்க குத்தகையாளர், சென்ற் லெனுட்ஸ், வலப்பனை

MR. E. ABDUL RAHIM, CROWN LESSEE, ST. LEONARDS, WALAPONE

7. **ටී. බී. එම්. හේරත් මයා.** (වලපනේ)

*(திரு. ரி. பி. எம். ஹேரத்—வலப்பனை)*

(Mr. T. B. M. Herath—Walapane)

ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) වලපනේ සෙන්ට් ලෙනාර්ඩ්ස් රජයේ බදු ඉඩම් අංක 9 හිමි ඊ. අබ්දුල් රහීම් මහතා උපදෙස් අනුව ගෙයක් සාදා වහල සෙවිලි කර ඇති බව එතුමා දන්නවාද? (ආ) මොහුට මෙතෙක් ශතයක්වත් ගෙවා නැත්තේ මන්ද? (ඉ) මෙම බදු ඉඩම්වල ගෙවල් සාදා ඇති වෙනත් කට්ටිකරුවන්ට කලට වේලාවට මුදල් ලැබීමටත් මොහුට නොලැබීමටත් හේතු කවරේද? (ඊ) මෙම කට්ටිකරුට වහාම මුදල් ලබා දීමට එතුමා ක්‍රියා කරනවාද? (උ) නො එසේ නම්, ඒ මන්ද?

*காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரைக் கேட்ட வினா: (அ) வலப்பனை சென்ற் லெனுட்ஸ் அரசாங்க குத்தகைக் காணி 9 ஆம் இலக்கச் சொந்தக்காரரான ஈ. அப்துல் றஹீம் ஆலோசனைப்படி வீடொன்றமைத்துக் கூரை வேய்ந்துள்ளாரென்பதை அவர் அறிவாரா? (ஆ) அவருக்கு இதுவரை ஒரு சதமேனும் கொடுக்கப்படாததேன்? (இ) இக் குத்தகைக் காணிகளில் வீடமைத்துள்ளவர்களுக்கு நேரகாலத்திற்குப் பணங்கிடைத்ததற்கும் அவருக்குக் கிடைக்காததற்கும் காரணமென்ன? (ஈ) இக்காணித்துண்டுக் காரருக்கு உடனடியாகப் பணம் பெற்றுக் கொடுக்க அவர் நடவடிக்கை எடுப்பாரா? (உ) இன்றேல், ஏன்?*

asked the Minister of Land, Irrigation and Power: (a) Is he aware that Mr. E. Abdul Raheem, lessee of lot Number 9 of Crown land St. Leonards, Walapane, on advice given to him has constructed a house and completed its roof? (b) Why has he not been paid any money so far? (c) Why has no payment been made to him while other allottees who have constructed houses on this land have been paid in time? (d) Will he take

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

action to obtain money for this allottee immediately? (e) If not, why?

**ගරු එම්. ඩී. බණ්ඩා (කෘෂිකර්ම හා ආහාර ඇමති—ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමති වෙනුවට)**

*(கௌரவ எம். டீ. பண்டா—விவசாய, உணவு அமைச்சர்—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சர் சார்பாக)*

(The Hon. M. D. Banda—Minister of Agriculture and Food on behalf of the Hon. Minister of Land, Irrigation and Power)

(අ) 1966-67 වර්ෂය වන තුරු අනුමත සැලැස්මානුකූල ගෙවල් තැනීමේ ලැයිස්තුවට ඊ. අබ්දුල් රහිම් මහතාගේ නම ඇතුළත් කර නැත. නමුත් මොහු 1966 ඔක්තෝබර් මාසය වන විට තමාගේ මතයටම අනුමත සැලැස්මානුකූල නොවූ ගෙයක් තනා තිබේ. ඊට පසු මෙම කට්ටිකරු 1966-67 වර්ෂයේ තැනීමේ ලැයිස්තුවට ඇතුළත් කරගෙන ඇත. මෙම නිවස පරීක්ෂා කොට අඩුම අවශ්‍යතාවන් සපුරා ලන්නේ නම් මුදල් ගෙවීමට කටයුතු කරගෙන යනු ලැබේ. (ආ) මෙය පැන නොනගී. (ඉ) මෙය පැන නොනගී. (ඊ) මෙය පැන නොනගී. (උ) මෙය පැන නොනගී.

**ටී. බී. එම්. හේරත් මයා.**

*(திரு. ரி. பி. எம். ஹேரத்)*

(Mr. T. B. M. Herath)

අතුරු ප්‍රශ්නයක් අහන්නට තියෙනව. මෙම කට්ටිකරුට තවම මුදල් ගෙවා නැති බවයි මා ගරු ඇමතිතුමාට දන්වා සිටින්නෙ. 1966-67 ලැයිස්තුවට මොහු ඇතුළත් වී සිටින නිසාත්, මොහු විසින් සාදා තිබෙන ගෙයි දැනට වහලද ගසා සම්පූර්ණ කර තිබෙන නිසාත්, මොහුට ලැබිය යුතු කොටස් මුදල් හැකි තාක් ඉක්මනින් ගෙවන ලෙස නුවරඑළියෙ ඉඩම් අංශයට ගරු ඇමතිතුමා දන්වනවද?

**ගරු එම්. ඩී. බණ්ඩා**

*(கௌரவ எம். டீ. பண்டா)*

(The Hon. M. D. Banda)

මා මෙම ප්‍රශ්නයට පිළිතුරු දුන්නෙ ගරු ඉඩම් ඇමතිතුමා වෙනුවටයි. එම නිසා අතුරු ප්‍රශ්නයකට මා දෙන පිළිතුර සම්පූර්ණ නොවන්නට පුළුවනි. ගෙයි අවශ්‍යතාවන් සපුරාලනව නම් කොටස් මුදල් ගෙවන බවයි කලින් දුන් පිළිතුරෙන් කියැවෙන්නෙ.

**ටී. බී. එම්. හේරත් මයා.**

*(திரு. ரி. பி. எம். ஹேரத்)*

(Mr. T. B. M. Herath)

තවත් අතුරු ප්‍රශ්නයක් අසන්ට තිබෙනව. අනුමත කළ ගෙවලට මුදල් ගෙවීමේදි මෙම ක්ෂේත්‍ර නිලධාරි මහතුන් බොහෝ විට කරන්නෙ තම තමන්ට ඕනෑ ඕනෑ උදවියටට මුදල් ගෙවීමයි. ඒ බවට නොයෙකුත් උදවියගෙන් පැමිණිලි ලැබී තිබෙනව. යම් යම් අයට නොගෙවීම පිළිබඳව අවසානයෙදි ඒ උදවිය කියන්නෙ තම ලැයිස්තුවෙ එම අයගෙ නම් තිබුණෙ නැති බවයි. එම නිසා ඒ ඒ අවුරුද්ද සඳහා අනුමත කරන ලද ලැයිස්තුවල පිටපතක් සෑම අවුරුද්දකදීම පළාතෙ මන්ත්‍රීවරයා වෙත ලැබෙන්නට සලස්වනවද?

**ගරු එම්. ඩී. බණ්ඩා**

*(கௌரவ எம். டீ. பண்டா)*

(The Hon. M. D. Banda)

ලැබෙයිද නොලැබෙයිද කියන එක මට කියන්ට බැහැ. නමුත් නාන්සෙගෙ ඉල්ලීම ගරු ඇමතිතුමාට දන්වන්ට පුළුවනි.

## කුඹල්ගමුව, ඉහල පන්නල යූ. ජී. පුංචිබණ්ඩාට යවන ලද මුදල් ඇණවුම

கும்பல்கமுவ, இஹலபன்னலவைச் சேர்ந்த திரு. யூ. ஜீ. புஞ்சி பண்டாவிற்கு அனுப்பப்பட்ட காசுக் கட்டளை

## MONEY ORDER SENT TO MR. U. G. PUNCHIBANDA OF IHALA PANNALA, KUMBALGAMUWA

8. **ටී. බී. එම්. හේරත් මයා.**

*(திரு. ரி. பி. எம். ஹேரத்)*

(Mr. T. B. M. Herath)

රජයේ වැඩ, තැපැල් සහ විදුලි සංදේශ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) කොළඹ (හෙට්ටි වීදිය) තැපැල් කාර්යාලය 20.5.66 දින නිකුත් කළ අංක 160917 මුදල් ඇණවුම කා විසින් කා වෙත යවන ලද්දක්ද? (ආ) කුඹල්ගමුව, ඉහල පන්නල, දවකැවියේ ගෙදර, යූ. ජී. පුංචිබන්ඩාට යවන ලද එම මුදල් ඇණවුම වෙනත් අයෙකු විසින් මාරු කර ඇති බව එතුමා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටී. බී. එම්. හේරත් මයා.]
දන්නවාද? (ඉ) මෙම මුදල් ඇණවුම වෙනත් අයෙකුට මාරු කර දුන් කුඹල් ගමුව උප තැපැල් පතිනියට විරුද්ධව කුමක් කරන ලදද? (ඊ) මෙම මුදල් ඇණවුම පිළිබඳ වංචාවට සහභාගි වූ උප තැපැල් පතිනියට විනයානුකූලව දඬුවම් දීමට එතුමා ක්‍රියා කරනවාද? (උ) නො එසේ නම්, ඒ මන්ද?

*அரசாங்க கட்டுவேலை, தபால், தந்திப் போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா: (அ) கொழும்பு (செட்டித் தெரு), தபாற் கந்தோர் 20.5.66 இல் வழங்கிய 160917 ஆவது இலக்க முடைய காசுக் கட்டளை யாரால் யாருக்கு அனுப்பப்பட்டது? (ஆ) கும்பல்கமுவ, இஹலபன்னல, தறுகெடியே கெதற, யூ. ஜீ. புஞ்சிபண்டாவிற்கு அனுப்பப்பட்ட அக் காசுக் கட்டளையை வேறு ஒருவர் மாற்றி உள்ளார் என்பதை அவர் அறிவாரா? (இ) இக்காசுக் கட்டளையை வேறு ஒருவருக்கு மாற்றிக் கொடுத்த கும்பல்கமுவ உபதபால் அதிபருக்கு எதிராக என்ன நடவடிக்கை எடுக்கப்பட்டது? (ஈ) இக்காசுக் கட்டளை சம்பந்தமான மோசடியிலீடுபட்ட உப தபால் அதிபர் மீது அவர் ஒழுங்கு நடவடிக்கை எடுப்பாரா? (உ) இன்றேல், ஏன்?*

asked the Minister of Public Works, Posts and Telecommunications: (*a*) By whom and to whom was the money order number 160917 issued on 20.5.66 from the Post Office (Sea Street), Colombo, sent? (*b*) Is he aware that this money order sent to U. G. Punchibanda of Devakeliyegedara, Ihala Pannala, Kumbalgamuwa, has been encashed by some other person? (*c*) What action has been taken again the Sub-Post Mistress, Kumbalgamuwa, who encashed this money order in favour of some other person? (*d*) Will he take disciplinary action against the sub-post mistress who was a party to the fraud pertaining to this money order? (*e*) If not, why?

**විජයපාල මෙන්ඩිස් මයා. (රජයේ වැඩ, තැපැල් සහ විදුලි සන්දේශ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. விஜயபால மெண்டிஸ்—அரசாங்கக் கட்டுவேலை, தபால் தந்திப் போக்குவரத்து அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. Wijayapala Mendis—Parliamentary Secretary to the Minister of Public Works, Posts and Telecommunications)

(අ) හෙට්ටි වීදිය, අංක 160917 හා 66.5.20 දින දරණ රු. 100.00 මුදල් ඇණවුම, පිටකොටුවේ නව වෙළඳපොළෙහි ඒ. පී. සුවාරිස් පෙරේරා මහතා විසින් කුඹල් ගමුව උප තැපැල් කාර්‍යාලයෙන් ගෙවීම සඳහා යූ. ජී. පුංචිබණ්ඩා යන අයෙකු වෙත යවා තිබේ. (ආ) ඔව්. (ඉ) මෙම මුදල් ඇණවුම වෙනත් අයෙකුට ගෙවීම ගැන පරීක්ෂණයක් පවත්වාගෙන යන අතර, එම මුදල ආපසු ලබාගැනීමට ක්‍රියා කරගෙන යනු ලැබේ. (ඊ) මෙම පරීක්ෂණය අනුව කුඹල්ගමුව උප තැපැල් ස්ථානාධිපතිනිය වංචාවකට සහභාගි වී ඇතැයි හෙළි වුවහොත් ඇයට විරුද්ධව විනයානුකූලව ක්‍රියාකරනු ලැබේ. (උ) පැන නගින්නේ නැත.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

චෝදනා පත්‍රවලින් නිවැරදිකරු වූ කුරුපනාවෙල උප තැපැල්පතිවරයාට තව මත් වැඩ නොදී තිබෙන නමුත් චෝදනා වකට ලක් වී සිටින මේ තැපැල්පතිනියගේ වැඩ තහනම් නොකරන්නෙ දේශපාලන හේතූන් උඩද?

**විජයපාල මෙන්ඩිස් මයා.**
*(திரு. விஜயபால மெண்டிஸ்)*
(Mr. Wijayapala Mendis)

වංචා කිරීම්වලදී දේශපාලන හේතූන් බලපාන්නෙ නැහැ. යමෙකුගෙ වංචාවක් අසු වුණොත් මේ දෙපාර්තමේන්තුව ඔහුට විරුද්ධව තදින් ක්‍රියා කරන බව මම ප්‍රකාශ කර සිටිනවා. මැය වැරදි කාරියක්ද, නිවැරදිකාරියක්ද කියන එක තවම ඔප්පු වී නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## මහකුඹුක්කඩවල පාරේ 5 කනුව අසල ඉඩම් බෙදා දීම

மஹக்கும்புக்கடவல தெருவில் 5 ஆம் கட்டைக்கு அண்மையிலுள்ள காணி : பராதீனம்

**LAND NEAR 5TH MILE-POST MAHAKUMBUK-KADAWELA ROAD : ALIENATION**

9. **ලක්ෂ්මන් ජයකොඩි මයා.** (දිවුලපිටිය)

*(திரு. லக்ஷ்மன் ஜயக்கொடி—திவுலுபிட்டிய)*

(Mr. Lakshman Jayakody—Divulapitiya)

ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) පුත්තලම් දිස්ත්‍රික්කයේ සීමාන්තික ඉඩම් දීමේ ක්‍රමය යටතේ දාගොන්න පදිංචි පී. ඩී. නෝරිස් සහ තවත් අයට මහ කුඹුක්කඩවල පාරේ 5 කනුව අසල ඉඩම් දීමට කටයුතු කර එම ඉඩම් අනුමතවී වාර්ෂික බදු මුදල්ද ඔවුන්ගෙන් අය කළ බව එතුමා දන්නවාද? (ආ) එම ඉඩම් අද වනතෙක් නුදුන් බවද මුදල් ආපසු නොදුන් බවද එතුමා දන්නවාද? (ඉ) එම ඉඩම් දීමට කටයුතු කරනවාද? එසේ නොවේ නම්, ඒ මන්ද? (ඊ) ඉඩම් දීමට නොහැකි නම් මුදල් ආපසු දෙනවාද? (උ) එසේ නම් කවදාද? එසේ නොවේ නම්, ඒ මන්ද?

*காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரைக் கேட்ட வினா : (அ) புத்தளம் மாவட்டத்தில் குறிப்பிட்டளவு காணி கொடுக்கும் திட்டத்தின்கீழ் தாகொன்னவில் குடியிருக்கும் பீ. டீ. நோரிஸ் என்பவருக்கும் மற்றவர்களுக்கும் மஹக்கும்புக்கடவல தெருவில் 5 ஆவது கட்டைக்குச் சமீபமாக காணி கொடுக்க ஒழுங்கு செய்து அக்காணியின் வருடாந்தக் குத்தகையையும் அவர்களிடம் அறவிட்டதை அவர் அறிவாரா? (ஆ) அக்காணி இன்றுவரை கொடுபடவில்லையென்பதையும் பணம் திருப்பிக் கொடுபடவில்லையென்பதையும் அவர் அறிவாரா? (இ) அக்காணியைக் கொடுக்க நடவடிக்கை எடுப்பாரா? இன்றேல், ஏன்? (ஈ) காணியைக் கொடுக்க முடியாவிட்டால் பணத்தைத் திருப்பிக் கொடுப்பாரா? (உ) அவ்வாறெனில் எப்போது? அன்றேல் ஏன்?*

asked the Minister of Land, Irrigation and Power : (*a*) Is he aware that action was taken to alienate land near the 5th mile-post Mahakumbukkadawala road to P. D. Noris and some others of Dagonna, under the marginal land alienation scheme, Puttalam District, and that the alienation was approved and the annual levy was charged from them ? (*b*) Is he aware that these lands have not been alienated up to now, and that the money charged has not been refunded ? (*c*) Will he take action to alienate these lands ; if not, why ? (*d*) If these lands cannot be alienated, will the money charged in respect of these lands be refunded ? (*e*) If so, when ; if not, why ?



**ගරු එම්. ඩී. බණ්ඩා (ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති වෙනුවට)**

*(கௌரவ எம். டீ. பண்டா—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சர் சார்பாக)*

(The Hon. M. D. Banda—on behalf of the Minister of Land, Irrigation and Power)

(අ) ඔව්. විශ්වාස තැන්පත් මුදල් පමණක් අය කරන ලදී. (ආ) ඉඩම් භාරදී නැත. විශ්වාස තැන්පත් මුදල් වශයෙන් අයකළ මුදල ආපසු ගෙවන ලදී. (ඉ) නැත. බෙදාදීමට යෝජනා කර ඇති මහකුඹුක්කඩවල ඉඩම් රක්ෂිත කැලෑවක කොටසක් වන අතර, එම රක්ෂිත කැලෑවෙන් දැනටමත් විශාල ඉඩම් ප්‍රමාණයක් බෙදා දී තිබේ. මෙම රක්ෂිත කැලෑවේ ප්‍රමාණය තවදුරටත් අඩු කිරීම යෝග්‍ය නොවේ. (ඊ) ඉහත (ආ) අනුව මෙය පැන නොනගී. (උ) ඉහත (ආ) අනුව මෙය පැන නොනගී.

**ජයකොඩි මයා.**

*(திரு. ஜயக்கொடி)*

(Mr. Jayakody)

මෙම ප්‍රශ්නයෙ (උ) කොටසින් අසා තිබෙන්නෙ, “ එසේ නම් කවදාද ” කියන එකයි. ඒකෙන් අහන්නෙ ගෙව්වෙ කවදද කියායි. අද වන තුරු ලැබී නැති නිසයි අහන්නෙ.

**ගරු එම්. ඩී. බණ්ඩා**

*(கௌரவ எம். டீ. பண்டா)*

(The Hon. M. D. Banda)

“ අය කළ මුදල ආපසු ගෙවන ලදී ” යනුවෙන් පිළිතුරෙහි සඳහන් වෙනවා. දිනය කවදාද යන්න ප්‍රකාශ කිරීම අප

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු එම්. ඩී. බණ්ඩා]
හසුයි. පසුව දන්වන්ට පුළුවනි. [බාධා කිරීමක්] මා උත්තර දෙන්නෙ ඉඩම්, වාරි මාර්ග හා විදුලිබල ඇමතිතුමා වෙනුවෙනුයි. අසුවල් දිනයෙ දුන්නය යන්න මෙහි සඳහන් වෙලා නැහැ. ආපසු දෙන ලද බවයි සඳහන් කර තිබෙන්නෙ. දිනය පසුව දන්වන්ට පුළුවනි.

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)
ආපසු ලැබී නැති නිසයි අහන්නෙ. ගෙවා නැති නම් ඉතා ඉක්මණින් ගෙවන්ට කටයුතු යොදනවද ?

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
උත්තරයෙන් පෙනෙන්නෙ ගෙවා තිබෙන බවයි. දිනය මේ වෙලාවෙ කියන්ට අපහසුයි. පසුව දන්වන්ට පුළුවනි.

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)
මට නොවෙයි ඒ උදවියට දන්වන්න.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
ආපසු දුන් දිනය ඒ උදවියට දන්වීන් නම්.

### ර. වැ. දෙ. පාරවල නාම පුවරු

அ. கவே. ப. பாதைகளின் பெயர்ப்பலகைகள்

NAME-BOARDS ON P. W. D. ROADS

10. **ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

රජයේ වැඩ, තැපැල් සහ විදුලි සංදේශ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) ලංකාවේ සියළුම ප්‍රදේශවල රජයේ වැඩ දෙපාර්තමේන්තු පාරවල් වල නාම පුවරු රාජ්‍ය භාෂාවට මුල්තැන නොදී සවි කරණ බව එතුමා දන්නවාද ? (ආ) යාපනේ අර්ධද්වීපයේ නාම පුවරුවල මුලින් ද්‍රවිඩ බසින් යොදා දෙවනුව සිංහල හා තෙවනුව ඉංග්‍රීසියෙන් යොදවින බව දන්නවාද ? (ඉ) මෙම නාම පුවරු වල සිංහලයට ප්‍රමුඛ ස්ථානය දීමට කටයුතු කරණවාද ? (ඊ) නො එසේ නම්, ඒ මන්ද ?

*அரசாங்க கட்டுவேலை, தபால், தந்திப் போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா: (அ) இலங்கையின் சகல பிரதேசங்களிலும் அரசாங்க கட்டுவேலைப் பகுதிப் பாதைகளின் பெயர்ப்பலகைகள் அரசகரும மொழிக்கு முதலிடம் கொடாமல் பொருத்தப்படுகின்றன வென்பதை அவர் அறிவாரா? (ஆ) யாழ்ப்பாணக் குடா நாட்டில் பெயர்ப்பலகைகள் முதலில் தமிழிலும், இரண்டாவதாக சிங்களத்திலும், மூன்றாவதாக ஆங்கிலத்திலும் எழுதப்பட்டிருக்கின்றன வென்பதை அறிவாரா? (இ) இப்பெயர்ப்பலகைகளில் சிங்களத்திற்கு முதலிடம் கொடுப்பதற்கு அவர் நடவடிக்கை யெடுப்பாரா? (ஈ) அப்படியின்றேல், ஏன்?*

asked the Minister of Public Works, Posts and Telecommunications : (*a*) Is he aware that the official language has not been given priority in the name-boards on P. W. D. roads throughout the Island ? (*b*) Is he aware that on name-boards in the Jaffna Peninsula first place has been given to Tamil and second and third place to Sinhala and English respectively ? (*c*) Will action be taken to give first place on these name-boards to Sinhala ? (*d*) If not, why ?

**විජයපාල මෙන්ඩිස් මයා.**
*(திரு. விஜயபால மெண்டிஸ்)*
(Mr. Wijayapala Mendis)
(අ) දිවයින මුළුල්ලේම ඇති නාම සහ මාර්ග උපදෙස් පුවරුවල රාජ්‍ය භාෂාවට දැන් මුල්තැන දී ඇත. (ආ) රාජ්‍ය භාෂා කොමිෂම විසින් කලින් නිර්දේශ කර තිබුණ පරිදි, දෙමල කතාකරන ප්‍රදේශවල මාර්ග උපදෙස් පුවරු මෑතක් වනතුරු, දෙමල, සිංහල සහ ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම තිබුණි. යාපනේ අර්ධද්වීපයේ හැර, මේවා දැන් සම්පූර්ණයෙන්ම වෙනස් කර ඇත. (ඉ) යාපනේ අර්ධද්වීපයේ ඇති නාම සහ මාර්ග උපදෙස් පුවරුවල සිංහලට මුල් තැන දී ඒවා නැවත ඇඳීමට දැනටමත් කටයුතු කර තිබේ. (ඊ) පැන නොනඟී.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රාජ්‍ය භාෂා කොමිෂම විසින් තමුන්නාන්සේලාගේ කාලයේදී 1962 දී කරන ලද නිර්දේශයක් අනුවයි, මෙතෙක් ඒ ක්‍රමය අනුගමනය කර තිබෙන්නෙ.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

යාපනේ අර්ධද්වීපයේ ඇති නාම සහ මාර්ග උපදෙස් පුවරුවල සිංහලට මුල් තැන දී ඒවා නැවත ඇඳීමට දැනටමත් කටයුතු කර තිබෙනවා යයි පාර්ලිමේන්තු ලේකම්තුමා කිව්ව. ඒ කටයුතු මොනවා දැයි මා දැන ගන්නට කැමතියි.

**විජයපාල මෙන්ඩිස් මයා.**
*(திரு. விஜயபால மெண்டிஸ்)*
(Mr. Wijayapala Mendis)

ඒ නාමපුවරු, සිංහල භාෂා ප්‍රතිපත්තිය අනුව සිංහලට මුල් තැන දී නැවත ඇඳීමට දැන් ආරම්භ කර තිබෙනව. සමහර නාමපුවරු දැනටමත් වෙනස් කර තිබෙනව. ගිහින් බැලුවොත් හොඳයි. හැබැයි, තමුන්නාන්සේලාට ඒ පළාත් වලට යන්ට පුළුවන්ද දන්නෙ නැහැ. [බාධා කිරීමක්]

**ගංගා නිම්න සංවර්ධන මණ්ඩලය : සේවකයින් උසස් කිරීමේ අක්‍රමිකතා**

ஆற்றுப்படுக்கை அபிவிருத்திச் சபை : பதவி உயர்ச்சியில் முறையற்ற வழிகள்

**RIVER VALLEYS DEVELOPMENT BOARD'S IRREGULARITIES IN PROMOTIONS**

11. **සෝමරත්න සෙනරත් මයා.** (අම්පාරෙයි)
*(திரு. சோமரத்ன செனரத்—அம்பாறை)*
(Mr. Somaratne Senerath—Amparai)

ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයේ ස්ථිර සේවකයින් උසස් කිරීමේදී නොයෙක් විධියේ අක්‍රමිකතාවයන් සිදුවී ඇති බව එතුමා දන්නවාද? (ආ) නවවෙනි ශ්‍රේණියේ සේවකයින් 8 වෙනි ශ්‍රේණියට උසස් කිරීමේදී ජ්‍යෙෂ්ඨත්වය සලකා නැති බව එතුමා දන්නවාද? (ඉ) නව වෙනි ශ්‍රේණියේ අවුරුදු පහක් පමණ සේවය කළ ඩබ්ලිව්. ඒ. අබේපාල සහ නව වෙනි ශ්‍රේණියේ උපරිම වේතනය ලබන ඊ. ඒ. එලාරිස් යන අයට ඊළඟ ශ්‍රේණියට උසස්වීම් නො ලැබී ඇති අතර දෛනික වැටුප් රු. 2.10 බැගින් ලබන සේවකයින් කෙළින්ම 8 වෙනි ශ්‍රේණියට උසස් කර ඇති බව එතුමා දන්නවාද? (ඊ) මෙම අක්‍රමිකතාවයන් හරිගැස්සීමට සහ නැවතත් සිදු නොවීමට එතුමා විගබලා ගන්නවාද?

*காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரைக் கேட்ட வினா: (அ) ஆற்றுப்படுக்கை அபிவிருத்திச் சபையின் நிரந்தரச் சேவையாளரைப் பதவி உயர்த்துவதில் பலவிதமான முறையற்ற வழிகள் கையாளப்பட்டிருப்பதை அவர் அறிவாரா? (ஆ) 9 ஆந் தர ஊழியர்கள் 8 ஆந் தரத்திற்குப் பதவி உயர்த்தப்பட்ட பொழுது சிரேஷ்டத்துவம் கவனிக்கப்படவில்லை என்பதை அவர் அறிவாரா? (இ) 9 ஆந் தரப் பதவியில் சுமார் ஐந்து வருடங்கள் கடமையாற்றிய டப்ளியூ. ஏ. அபேபால என்பவருக்கும், 9 ஆந் தரப் பதவியின் உச்சச் சம்பளம் பெறும் ஈ. ஏ. எலாரிஸ் என்பவருக்கும் அடுத்த தரத்திற்கு பதவி உயர்வு கிடைக்காதிருக்கையில் ரூபா 2.10 விகிதமாக அன்றாடச் சம்பளம் பெறும் ஊழியர்களுக்கு நேரே 8 ஆந் தரப் பதவி உயர்வு கிடைத்திருக்கின்றதென்பதை அவர் அறிவாரா? (ஈ) இந்த முறையற்ற வழிகளைத் திருத்துவதற்கும், மீண்டும் அவ்விதம் நடவாமலிருப்பதற்கும் அவர் பொறுப்பேற்பாரா?*

asked the Minister of Land, Irrigation and Power: (*a*) Is he aware that there have been various forms of irregularities in the promotion of permanent employees in the River Valleys Development Board? (*b*) Is he aware that seniority has not been taken into consideration when employees of Grade 9 were promoted to Grade 8? (*c*) Is he aware that while W. A. Abeypala, who has been in Grade 9 for about five years, and E. A. Elaris, who is on the maximum of the Grade 9 salary scale, have not got their promotions to the next grade, employees drawing a daily wage of Rs. 2.10 have been promoted direct to Grade 8? (*d*) Will he take action to rectify this and to prevent a recurrence of these irregularities?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු එම්. ඩී. බණ්ඩා (ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති වෙනුවට)**

*(கௌரவ எம். டீ. பண்டா—காணி, நீர்ப் பாசன, மின்விசை அமைச்சர் சார்பாக)*

(The Hon. M. D. Banda—on behalf of the Minister of Land, Irrigation and Power)

(*a*) No. (*b*) No. (*c*) There is no automatic promotion from grade to grade in the Board Service. Mr. W. A. Abeypala did not have the required 3 years of service in Grade IX on 1.1.65 and was therefore not eligible for consideration for promotion to the next grade. The Board has since increased this qualifying period to 5 years and his case along with several others similarly placed will be considered. The case of B. A. Elaris, along with others who have reached the maximum of their salary scale, is being looked into by the Promotion Committee. (*d*) Does not arise.

**නියෝජ්‍ය කථානායකතුමා**

*(உப சபாநாயகர் அவர்கள்)*

(Mr. Deputy Speaker)

Question No. 12.

**ගරු එම්. ඩී. බණ්ඩා**

*(கௌரவ எம். டீ. பண்டா)*

(The Hon. M. D. Banda)

I require two weeks' time to answer this question.

**ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.**

வினாவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.

*Question ordered to stand down.*

## නාමල් ඔය ව්‍යාපාරය : දකුණු ඉවුරේ ගොවීන් පදිංචි කිරීම

*நாமல் ஓயத் திட்டம் : தென்கரையில் குடியேற்றம்*

**NAMAL-OYA PROJECT: COLONIZATION OF RIGHT BANK**

**13. සෙනරත් මයා.**

*(திரு. செனரத்)*

(Mr. Senerath)

ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිගෙන් **ඇසූ ප්‍රශ්නය**: (අ) නාමල්ඔය ව්‍යාපාරය යටතේ පදිංචිකොට ඇති 8බී 9බී යන ජනපදවල ගොවීන් වාරිමාර්ග පහසුකම් නොමැතිකම නිසා දකුණු ඉවුරේ පදිංචි කිරීමට කටයුතු යොදා තිබෙන බව එතුමා දන්නවාද? (ආ) 1967 එන යල්කන්නයට පෙර දකුණු ඉවුරේ පදිංචියට යාමට ලැස්ති වී සිටිය යුතු බව දන්වා ගංගා නිම්න සංවර්ධන මණ්ඩලය මගින් ගොවීන්ට ලියුම් මගින් දන්වා තිබෙන බව එතුමා දන්නවාද? (ඉ) දකුණු ඉවුරේ ඉඩම මෙම ගොවීන් සඳහා තවමත් සූදානම් නැති බව එතුමා දන්නවාද? (ඊ) 8බී 9බී ජනපද වැසියන් සඳහා ඉඩම් සූදානම් වන්නේ කවදාද? (උ) ඉඩම් සූදානම්ව නොතිබෙද්දී යල්කන්නයට පෙර සිට ගොවීන්ට අලුත් ඉඩම්වලට යාමට දන්වා තිබීමෙන් ඔවුන්ට විශාල කරදරයකට මුහුණ පාන්නට සිදුවූ බව එතුමා දන්නවාද? (ඌ) සථිර වශයෙන් මෙම ගොවීන් දකුණු ඉවුරේ පදිංචි කරනවාද? (එ) එසේ නම්, ඒ කවදාද?

*காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரைக் கேட்ட வினா: (அ) நாமல் ஓயத் திட்டத்தின்கீழ் குடியேற்றப்பட்டிருக்கும் 8 பி, 9 பி குடியேற்றத்திட்டங்களில் உள்ள விவசாயிகளுக்கு நீர்ப்பாய்ச்சல் வசதிகளில்லாததனால் அவர்களைத் தென் கரையில் குடியேற்றுவதற்கு நடவடிக்கை எடுக்கப்பட்டிருப்பதை அவர் அறிவாரா? (ஆ) 1967 இல் வரும் சிறுபோகத்திற்கு முன் தென்கரையில் குடியேறுவதற்குத் தயாராயிருக்குமாறு ஆற்றுப்படுக்கை அபிவிருத்திச்சபையினால் விவசாயிகளுக்குக் கடித மூலம் தெரிவிக்கப்பட்டிருக்கின்றதென்பதை அவர் அறிவாரா? (இ) தென்கரையில் உள்ள காணிகள் இந்த விவசாயிகளுக்காக இன்னும் தயாராயில்லையென்பதை அவர் அறிவாரா? (ஈ) 8 பி, 9 பி குடியேற்றவாசிகளுக்காக காணிகள் ஒழுங்கு செய்யப்படுவதெப்பொழுது? (உ) காணிகள் ஒழுங்கு செய்யப்படாதிருக்கும் பொழுது சிறுபோகத்திற்கு முன்னரே விவசாயிகளைப் புதிய காணிகளுக்குப் போகச் சொல்லியிருப்பதனால், அவர்கள் பலவித கஷ்டங்களுக்காளாகினரென்பதை அவர் அறிவாரா? (ஊ) இவ் விவசாயிகள் நிரந்தரமாகத் தென் கரையில் குடியேற்றப்படுவார்களா? (எ) அப்படியின்றேல், ஏன்?*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

asked the Minister of Land, Irrigation and Power : (*a*) Is he aware that due to lack of irrigation facilities, action has been taken to settle the cultivators already settled in 8 B and 9 B colonies under the Namal-Oya project, on the right bank? (*b*) Is he aware that the River Valleys Development Board has informed the cultivators by letter that they should be in readiness to go and settle down on the right bank before the next Yala season? (*c*) Is he aware that the land on the right bank is not yet ready for the cultivators? (*d*) When will the land be ready for cultivators of 8 B and 9 B colonies? (*e*) Is he aware that the fact that these cultivators have been asked to move into new land before the Yala season, while such land is not ready for occupation, has caused great hardship to them? (*f*) Will these cultivators be settled on the right bank definitely? (*g*) If so, when?

**ගරු එම්. ඩී. බණ්ඩා (ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති වෙනුවට)**

*(கௌரவ எம். டீ. பண்டா—காணி, நீர்ப் பாசன, மின்விசை அமைச்சர் சார்பாக)*

(The Hon. M. D. Banda—on behalf of the Minister of Land, Irrigation and Power)

(අ) නැත. වාරිමාර්ග දුෂ්කරතා පැවතීන. යෝජනා වී ඇත්තේ 8බී සහ 9බී ජනපද වැස්සන්, (1) ජූනි පළමුවෙනිදා පටන්ගැනෙන උක් කැපීම අවසන් වූ විට හා (2) ප්‍රමාණවත් වාරිමාර්ග පහසුකම් සලසනු ලැබ කට්ටිකිරීමේ සැලසුම් සූදානම් වූ විට, දකුණු ඉවුරේ පදිංචි කරවීමටයි. (ආ) යල කන්නයේ ආරම්භයේ පටන් සුදුසු වෙනත් ඉඩම් සපයා ගැනීමට හැම ප්‍රයත්නයක්ම දරන බව 8බී හා 9බී ජනපදවාසීන්ට මාර්තු මුල භාගයේදීම දන්වන ලදී. ඒ නිසා අප්‍රියෙල් මැද හරියේ දීම (අ) (1) ඉහත සඳහන් කොන්දේසි අනුව ඔවුන්ට දැනුම් දෙන ලදී. (ඉ) එසේ ය. ඉහත දැක්වෙන (අ) (1) හා (අ) (2) සඳහන් හේතු අනුවයි. (ඊ) ලඟ එන මහ කන්නය සඳහා ජනපදවාසීන්ට තම තමන්ට වෙන් කළ ඉඩම් කට්ටි පැවරීමට බලාපොරොත්තු වනු ලැබේ. (උ) නැත. යල කන්නයට කලින් ජනපදවාසීන් සිටින තැන් වෙනස් කිරීමට බැඳීමක් නැති හෙයිනි. (ඌ) එසේ ය. ඔවුන් තවදුරටත් දැනට ඇති ඉඩම් කට්ටි අත්හැර යාමට වුවමනායයි තරයේ කියා සිටිතොත්. (එ) ඉහත (ඊ) කොටසේ දැක්වුන අන්දමටය.

**සෙනරත් මයා.**

*(திரு. செனரத்)*

(Mr. Senarath)

අතුරු ප්‍රශ්නයක් අහන්න තියෙනව. වාරිමාර්ග පහසුකම් නැති නිසා, වෙන ඉඩම් දෙන ලෙස ජනපදවාසීන් ස්ථිර වශයෙන්ම කියා සිටිනව.

**ගරු ඩඩ්ලි සේනානායක (අග්‍රාමාත්‍ය, ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති, ක්‍රම සම්පාදක හා ආර්ථික කටයුතු පිළිබඳ ඇමති සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමති)**

*(கௌரவ டட்ளி சேனநாயக்க—பிரதம அமைச்சரும் பாதுகாப்பு, வெளி விவகார அமைச்சரும் திட்ட அமைப்பு, பொருளாதார விவகார அமைச்சரும், தகவல், ஒலிபரப்பு அமைச்சரும்)*

(The Hon. Dudley Senanayake—Prime Minister, Minister of Defence & External Affairs, Minister of Planning & Economic Affairs and Minister of Information & Broadcasting)

ගරු මන්ත්‍රීතුමා අහන ප්‍රශ්නය මොකක්ද? මට ඇහෙන්නෙ නැහැ. ටිකක් ඇහෙන්න කියන්න.

**සෙනරත් මයා.**

*(திரு. செனரத்)*

(Mr. Senarath)

වාරිමාර්ග පහසුකම් නැති නිසා ඒ අය ඒ ප්‍රදේශයෙන් යන්නට කැමැති බව ස්ථිර වශයෙන්ම ප්‍රකාශ කර තිබෙනව. ඒ නිසා ගරු ඇමතිතුමා දුන් පිළිතුරු අනුව "කැමති නම් පමණක්" යනුවෙන් සඳහන් කිරීම වැරදි බවයි මා කියන්නෙ. මා හිතන්නෙ "කැමති නම් පමණක්" යන්න වැරදියි කියලයි. ගරු අගමැතිතුමා ඊයේ පෙරේදා ඒ ප්‍රදේශයේ සංචාරයක යෙදුණු නිසා ජනපදවාසීන්ට වතුර නැති කමේ ප්‍රශ්නය කොයි තරම් දුරට බල පාන වද යන්න එතුමා දන්නව ඇති. ඒ ගැන කරන්න යන්නෙ කුමක්දැයි දැන ගන්න කැමතියි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු එම්. ඩී. බණ්ඩා
(கௌரவ எம். டீ. பண்டா)
(The Hon. M. D. Banda)
නාමල් ඔයද ?

ගරු ඩඩ්ලි සේනානායක
(கௌரவ டட்லி சேனநாயக்க)
(The Hon. Dudley Senanayake)
මම පිළිතුරු දෙන්නම්. ඊයේ පෙරේදා නාමල් ඔය කොට්ඨාශයේ සම්පූර්ණයෙන් සංචාරය කරලයි මා ආවෙ. ඒ නිසා එහි තත්ත්වය මට දැන ගන්න පුළුවන් වුණා. එහි වාරිමාර්ග සම්බන්ධයෙන් අඩුපාඩුකම්, අපහසුකම් තිබෙනව. කිසිම අනුමානයක් නැතිව ඒ බව කියන්න පුළුවනි. ඒවා ඇළවේලි ආදිය සකස් කර ජලය නියම විධියට ලබා ගන්න පුළුවන් වන විධියට පිළියෙල කරන්නට බලාපොරොත්තු වෙනව. වැඩිපුර කොටසකුත් සිටිනව. ඒ හැම දෙනාටම නාමල් ඔයේ වතුර මදි. සියලු දෙනාටම පදිංචි වී වගා කරන්න පහසුකම් දෙන්න පුළුවන්කමක් නැති නිසා දකුණු ඉවුරේ උක් වැවීමට තිබුණු කොටසට මේ උදවිය මාස් කන්නට ප්‍රථමයෙන් ගෙන යන්න උත්සාහ කරනව.

### උඩවලව යෝජනා ක්‍රමය : ප්‍රමාද
### உடவளவைத் திட்டம் : தாமதம்
### UDA WALAWE SCHEME : DELAYS

14. මැතිව් මයා.
(திரு. மதியூ)
(Mr. Mathew)
ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) උඩවලව යෝජනා ක්‍රමයට අයත් ප්‍රදේශ මෙතෙක් තීරණය කර නොමැති බවත්, එසේම 3.7.66 දින රත්නපුර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කාරක සභාවේදී නොදියුණු ප්‍රදේශ ලෙස සළකා ගම්සභා ප්‍රදේශ 6ක් බාරදීම සුදුසුයයි තීරණය කළ බවත් එතුමා දන්නේද ? (ආ) උඩවලව යෝජනා ක්‍රමයේ සංවර්ධන කටයුතු බොහෝ දුරට අවසන් වී ගෙන යන අතර මෙතෙක් කොලොන්න හා දියපොට ගම් සභා ප්‍රදේශද උඩවලවට පවරා ගැනීම පමා වන්නේ කුමන හේතුවක් නිසා දැ යි එතුමා සඳහන් කරන්නේද ? (ඉ) මෙම පමාව නිසා සංවර්ධන කටයුතුවලට මෙන්ම ප්‍රදේශයේ දියුණුවටද ඉමහත් බාධා පැමිණ ඇති බැව් එතුමා දන්නවාද ? (ඊ) එසේ පවරා ගන්නේ නම්, ඒ කවදාද ? (උ) නො එසේනම්, ඒ මන්ද ?

காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரைக் கேட்ட வினா: (அ) உடவளவைத் திட்டத்தைச் சேர்ந்த பிரதேசங்கள் இன்னும் நிர்ணயிக்கப்படாமல் இருப்பதனால் 3.7.66 ஆம் தேதி இரத்னபுரியில் நடைபெற்ற இரத்னபுரி மாவட்ட இணைப்புக் குழு கூட்டத்தில் அபிவிருத்தியடையாத பிரதேசங்களாகக் கருதி 6 கிராமச் சங்கப் பிரதேசங்களை ஒப்படைக்க முடிவுசெய்யப்பட்டதை அவர் அறிவாரா? (ஆ) உடவளவைத் திட்ட அபிவிருத்தி வேலைகள் பெரும்பாலும் முடிவடைந்து வருகிற படியினால், இதுவரையிலும் கொலன்ன, தியபொட ஆகிய கிராமச் சங்கப் பிரதேசங்களையும் உடவளவைத் திட்டத்துடன் சேர்த்துக் கொள்ளாமல் தாமதப்படுத்துவது என்ன காரணத்தினால் என்பதை அவர் குறிப்பிடுவாரா? (இ) இத்தாமதத்தின் காரணமாக அபிவிருத்தி வேலைகளுக்கும் பிரதேச அபிவிருத்திக்கும் பெரும் தடை ஏற்பட்டுள்ளதை அவர் அறிவாரா? (ஈ) அவ்வாறு பொறுப்பேற்கப்படுமானால், எப்போது பொறுப்பேற்கப்படும்? (உ) அன்றேல், ஏன்?

asked the Minister of Land, Irrigation and Power : (*a*) Is he aware that the areas to be brought under the Uda Walawe Scheme have not been determined yet, and that it was decided at the Ratnapura District Co-ordinating Committee meeting held on 3.7.66 to recommend that 6 village council areas be treated as undeveloped areas and handed over ? (*b*) Will he state the reason for the delay on the part of the Uda Walawe Scheme in taking over the village council areas of Kolonna and Diyapota so far, when the development work of the scheme is largely completed ? (*c*) Is he aware that this delay has hindered development work as well as the progress of the area ? (*d*) If they are to be taken over, when will they be taken over ? (*e*) If not, why ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු එම්. ඩී. බණ්ඩා (ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති වෙනුවට)**

*(கௌரவ எம். டீ. பண்டா—காணி, நீர்ப் பாசன, மின்விசை அமைச்சர் சார்பாக)*

(The Hon. M. D. Banda—on behalf of the Minister of Land, Irrigation and Power)

(*a*) The final plans have been prepared by the S.G. and a Cabinet Memorandum, No. 222 of 22.4.67, has been prepared and submitted to the Cabinet for approval to move a resolution in Parliament. The village councils in question have been included in the area to be declared as the area of authority. (*b*) The delay is due to various decisions taken by the Ministry on representations made by several Members of Parliament regarding the areas to be included under the area of authority. (*c*) No delay has been caused in the development work as well as the progress of the area. (*d*) After Government and Parliamentary approval for plan of development and area of authority. (*e*) Does not arise in view of (*d*) above.

**නියෝජ්‍ය කථානායක තුමා**

*(உப சபாநாயகர் அவர்கள்)*

(Mr. Deputy Speaker)

15 වැනි ප්‍රශ්නය.

**ගරු එම්. ඩී. බණ්ඩා**

*(கௌரவ எம். டீ. பண்டா)*

(The Hon. M. D. Banda)

මේ ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා මාසයක් පමණ කල් ලබා දෙන ලෙස ඉල්ලා තිබෙන බව මතක් කරන්න කැමතියි.

**ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.**

*வினாவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*

*Question ordered to stand down.*



**එච්. එම්. පුංචිබණ්ඩා මයා., දෙමටකැටියේ ගෙදර, මොනරාගල: ආධාර**

*திரு. எச். எம். புஞ்சிபண்டா, டெமடகட்டியே கெதர, மொனராகலை : உதவி*

**MR. H. M. PUNCHIBANDA, DEMATAKATIYE GEDERA, MONARAGALA : ASSISTANCE**

1. මැතිව් මයා. (ආර්. එම්. ධර්මදාස බණ්ඩා මයා.—බිබිලෙ—වෙනුවට)

*(திரு. மதியூ—திரு. ஆர். எம். தர்மதாச பண்டா—பிபிலை—சார்பாக)*

(Mr. Mathew—on behalf of the Mr. R. M. Dharmadasa Banda—Bibile)

සමාජ සේවා ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) මොනරාගල දිස්ත්‍රික්කයේ මැදගම් පත්තු කෝරළයේ දෙමටකැටියේ ගෙදර පදිංචි, එච්. එම්. පුංචිබන්ඩා නැමැති අය දැනට අවුරුදු 13 කාලයක සිට මීමැස් මොරය නැමැති රෝගයෙන් පෙළෙන බැවින් ඒ සඳහා එම අයට විශෙෂ ආධාර යක් මොනරාගල දිසාපතිතුමාගෙන් ඉල්ලා ඇති බව එතුමා දන්නවාද? (ආ) එම අයට, ඒ විශේෂ ආධාරය දීම මේතාක් ලබාදීමට දිසාපතිතුමා අපොහොසත් වී ඇත්තේ මන්ද? (ඉ) මෙම ආධාරය ඉතා මත්ම ඉක්මණින් එතුමා ලබාදෙන්නේ ද? (ඊ) නො එසේනම්, ඒ මන්ද?

*சமூக சேவை அமைச்சரைக் கேட்ட வினா: (அ) கடந்த 13 ஆண்டுகளாக காக்கை வலிப்பால் பீடிக்கப்பட்டுள்ளவரான, மொன ராகலை மாவட்டம் மெதகம்பத்து கோரலே, டெமடகட்டியெகெதர வாசியாகிய எச். எம். புஞ்சிபண்டா என்பவருக்கென விசேஷ உதவி வேண்டி மொனராகலை அரசாங்க அதிப ருக்கு மனுச்செய்திருப்பதை அவர் அறி வாரா? (ஆ) கோரப்பட்ட விசேட உதவி யைப் பெற்றுக்கொடுக்க அரசாங்க அதிபர் இற்றைவரை தவறியதேன்? (இ) வெகு விரைவில் இவ்வுதவியைப் பெற்றுக் கொடுப் பாரா? (ஈ) இன்றேல், ஏன்?*

asked the Minister of Social Services : (*a*) Is he aware that a request has been made to the Government Agent, Monaragala, for special assistance for a person named H. M. Punchibanda, residing at Demataketiya Gedera, in the Medagampattu Korale in Monaragala District, as he has been ailing from epilepsy for thirteen years now? (*b*) Why has the Government Agent failed so far

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[මැතිව් මයා.]
to obtain for him this special assistance? (c) Will he grant this assistance very early? (d) If not, why?

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න (සමාජ සේවා ඇමති)**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன—சமூக சேவை அமைச்சர்)*
(The Hon. N. H. A. M. Karunaratne—Minister of Social Services)

(අ) ඔව්. (ආ) සාමාන්‍ය වශයෙන් ගෙවන ප්‍රමාණය වන රු. 10.00ක මහජනාධාර මාසික දීමනාවක් දැනටමත් එච්. එම්. පුංචි බණ්ඩා මහතා ලබයි. (ඉ) හා (ඊ) පැන නොනගී.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

රුපියල් දහයක මාසික මුදලක් කෙනකුට ප්‍රමාණවත්දැයි අහන්න කැමතියි.

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)

තනිකඩ පුද්ගලයෙකුට ව්‍යවස්ථාව අනුව ගෙවන්නෙ රුපියල් දහයයි. ඒ ව්‍යවස්ථාව මට වෙනස් කරන්න පුළුවන් කමක් නැහැ. අවිවාහක, එමෙන්ම තමන් ගෙන් යැපෙන්නට කිසිම කෙනකුත් නැති පුද්ගලයෙකුට වුවත් රුපියල් දහයක මුදලක් මාසයකට මදි බව නම් මාත් පිළිගන්නවා. ඒ ගැන සැකයක් නැහැ. ඒ කොයි හැටි වෙතත් මෙතෙක් කල් ඔය ව්‍යවස්ථාව අනුව ගෙවාගෙන ආවෙ රුපියල් දහයයි. මේ කාලයේ පමණක් නොවෙයි, ඉහත කාලයේ මේ රටේ තිබුණු සෑම ආණ්ඩුවක්ම දුන් මුදල එපමණයි.

**එම්. පී. ද සොයිසා සිරිවර්ධන මයා.** (මිනුවන්ගොඩ)
*(திரு. எம். பீ. டி சொய்சா சிறிவர்தன—மினுவாங்கொடை)*
(Mr. M. P. de Zoysa Siriwardena—Minuwangoda)

ගරු ඇමතිතුමා රුපියල් දහයක මුදලක් මදි බව පිළිගන්නව නම් ඒ ව්‍යවස්ථාව වෙනස් කරන්න උත්සාහ කරනවද?

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)

මුදල් තත්ත්වය හොඳ වුණොත් රුපියල් දහය නොවෙයි විස්සක් වුණත් ගෙවන්න අපි ලෑස්තියි.

**ලෙස්ලි ගුණවර්ධන මයා.** (පානදුර)
*(திரு. லெஸ்லி குணவர்தன—பாணந்துறை)*
(Mr. Leslie Goonewardene—Panadura)

හාල් කැපිල්ලෙන් රුපියල් කෝටි විස්සක් පමණ ඉතිරි වන නිසා බැරිද ඔය වැඩේ දැන්මම කරන්නට?

**ගරු එන්. එච්. ඒ. එම්. කරුණාරත්න**
*(கௌரவ என். எச். ஏ. எம். கருணாரத்ன)*
(The Hon. N. H. A. M. Karunaratne)

එය යොදවන්න වෙනත් වැඩ පිළිවෙළවල් තිබෙනව.

## රත්මලාන ගුවන් තොටුපොලේ එස්. වී. ඒ. වීරවන්ස මයා. සේවයෙන් පහ කිරීම

திரு. எஸ். வீ. ஏ. வீரவன்ஸ, இரத்மலானை விமான நிலையம் : வேலை நீக்கம்

MR. S. V. A. WEERAWANSA, RATMALANA AIR PORT: TERMINATION OF SERVICES

3. **ලෙස්ලි ගුණවර්ධන මයා.** (ආචාර්ය එන්. එම්. පෙරේරා—යටියන්තොට—වෙනුවට)
*(திரு. லெஸ்லி குணவர்தன—கலாநிதி என். எம். பெரேரா—யட்டியாந்தோட்டை—சார்பாக)*
(Mr. Leslie Goonewardene, on behalf of Dr. N. M. Perera—Yatiyantota)

ප්‍රවාහණ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) එස්. වී. ඒ. වීරවන්ස මහතා 65.2.25 සිට 66.9.10 දක්වා රත්මලානේ ගුවන් තොටුපොලේ සේවය කළ බව එතුමා දන්නවාද? (ආ) 66.9.10 වන දින ඔහු සේවයෙන් පහ කිරීමට හේතුව කුමක්ද? (ඉ) ඔහුට විරුද්ධව චෝදනා කිසිවක් නගන ලද්දේද? (ඊ) එසේ නම්, ඒ චෝදනා කවරේද? (උ) චෝදනා කිසිත් නගන්නේ නැතිව, මොහු සේවයෙන් පහ කරන ලද්දේ සේවකයින් වුවමනාවට වඩා වැඩියෙන් සිටි නිසා නම්, වීරවන්ස මහතා කළ වැඩ කටයුතු ම කිරීම සඳහා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පී. වෝල්ටර් පෙරේරා හා ලෙස්ලි ප්‍රනාන්දු යන වෙනත් පුද්ගලයින් දෙදෙනකු සේවයට බඳවා ගන්නා ලද්දේ මක් නිසාද ?

*போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா: (அ) திரு. எஸ். வீ. ஏ. வீரவன்ஸ என்பவர் இரத்மலானை விமான நிலையத்தில் 25.2.65 இலிருந்து 10.9.66 வரை கடமையாற்றினார் என்பதை அவர் அறிவாரா? (ஆ) 10.9.66 இல் அவர் வேலையிலிருந்து நீக்கப்பட்டதின் காரணமென்ன? (இ) அவருக்கெதிராக குற்றச்சாட்டுகள் ஏதாவது தயாரிக்கப்பட்டனவா? (ஈ) அவ்விதமாயின் குற்றச்சாட்டுக்கள் யாவை? (உ) குற்றச்சாட்டுப் பத்திரமொன்றும் தயாரிக்கப்படாது ஆட்தொகை கூடியிருக்கும் காரணத்தால் அவர் வேலையிலிருந்து நீக்கப்பட்டால், அன்னாராற்றிய கடமைகளைச் செய்வதற்கென பீ. வால்ரர் பெரேரா, லெஸ்லி பெரேரா எனப்படும் இருவரையும் நியமித்ததேன்?*

asked the Minister of Communications: (*a*) Is he aware that Mr. S. V. A. Weerawansa was employed at the Ratmalana Airport from 25.2.65 to 10.9.66 ? (*b*) What was the reason for his discontinuance on 10.9.66 ? (*c*) Were any charges framed against him ? (*d*) If so, what are they ? (*e*) If no charges have been framed, and if discontinuance was made on the ground of redundancy, why is it that two others, viz., P. Walter Perera and Leslie Fernando, have been employed to do the same work which Mr. Weerawansa performed ?

**ගරු ඊ. එල්. බී. හුරුල්ලේ** (ප්‍රවාහණ ඇමති)

*(கௌரவ ஈ. எல். பி. ஹுருல்ல—போக்குவரத்து அமைச்சர்)*

(The Hon. E. L. B. Hurulle—Minister of Communications)

එස්. වී. ඒ. වීරවංස මහතා විසින් ලංකා ගුවන් සේවා ආයතනයට විරුද්ධව කම්කරු උසාවියේ නඩු පවරා ඇත. එම නිසා, මෙම කරුණ නඩු විභාගයට භාජන වී ඇත.

## කොකුවිල් ගම්සභාව

*கொக்குவில் கிராமச் சபை*

## KOKUVIL VILLAGE COUNCIL

4. **ලෙස්ලි ගුණවර්ධන මයා.** (ආචාර්ය එන්. එම්. පෙරේරා—වෙනුවට)

*(திரு. லெஸ்லி குணவர்தன—கலாநிதி என். எம். பெரேரா சார்பாக)*

(Mr. Leslie Goonewardene—on behalf of Dr. N. M. Perera)

පළාත් පාලන ඇමතිගේ සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්ගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) කොකුවිල් ගම් සභාවේ ගණන් පරීක්ෂණය මෑත දී කරන ලද බවත්, රු. 32,000 ක මුදල් අඩුවක් තිබුණු බව එම ගණන් පරීක්ෂණයෙන් එළි වූ බවත් එතුමා දන්නවාද? (ආ) මේ ගම් සභාවේ ගිණුම් පිළිබඳ බරපතල හිඟයක් අනාවරණය වූ තුන් වන වතාව මෙය බව එතුමා දන්නවාද? (ඉ) මීට පෙර, රු. 43,000 ක් බලය නොලැබ වියදම් කර තිබුණු බවත්, ඒ මුදල සිප්පිත්තරෙයි නැමති ස්ථානයට විදුලි බලය සැපයීම සඳහා වැය කර තිබුණු බවත්, එතුමා දන්නවාද? (ඊ) මේ මුදල, සභාපති වූ සී. අරුලම්පලම් මහතාට අයිභාර කරන ලද බව එතුමා දන්නවාද? (උ) මේ ගම් සභාවට අයත් මුදල් සොරකමකින් නැති වූ හැටියට දක්වීමේ ප්‍රතිඵලයක් වශයෙන්, රු. 17,058.18 ක් නැති වූ බව 1962-63 සඳහා ඔඩිටර් ජනරාල්ගේ වාර්තාවෙන් අනාවරණය වූ බව එතුමා දන්නවාද? (ඌ) මේ ගම් සභාවේ සභාපතිට විරුද්ධව කිසියම් පියවරක් ගෙන තිබේද? (එ) කිසියම් පියවරක් ගෙන නැති නම්, ඒ මක් නිසාද?

*உள்ளூராட்சி அமைச்சரதும், தகவல், ஒலிபரப்பு அமைச்சரதும் பாராளுமன்றக் காரியதரிசியைக் கேட்ட வினா: (அ) கொக்குவில் கிராமச்சபைக் கணக்குகள் அண்மையில் பரிசோதனை செய்யப்பட்டன என்பதையும் அதில் ரூ. 32,000 ரொக்கம் குறைந்திருக்கக் காணப்பட்டதென்பதையும் அவர் அறிவாரா? (ஆ) இந்தக் கிராமச்சபையில் கண்டுபிடிக்கப்பட்ட மூன்றாவது பெரும் குறைவுபாடு இது என்பதை அவர் அறிவாரா? (இ) முன்னர் சிப்பித்தரைக்கு மின்சாரம் விநியோகிப்பதற்கென 43,000 ரூபா அனுமதியின்றிச் செலவிடப்பட்டதென்பதை அவர் அறிவாரா? (ஈ) இத்தொகை தலைவர் திரு. சி. அருளம்*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලෙස්ලි ගුණවර්ධන මයා.]

*பலத்திடமிருந்து அறவிடப்பட்டது என்பதை அவர் அறிவாரா? (உ) இந்தக் கிராமச் சபைக்குச் சொந்தமான ரூ. 17,058 18 களவாடப்பட்டதாகக் கூறப்பட்டு, இத்தொகை நஷ்டமாகியதாக 1962-63 ஆம் ஆண்டிற்கான கணக்குப்பரிசோதனைத் தலைமை அதிபதியின் அறிக்கை குறிப்பிட்டிருப்பதை அவர் அறிவாரா? (ஊ) இந்தக் கிராமச்சபைத் தலைவருக்கெதிராக எவ்வித நடவடிக்கையாவது எடுக்கப்பட்டதா? (எ) நடவடிக்கையெதுவும் எடுக்கப்படவில்லையாயின், ஏன் எடுக்கப்படவில்லை?*

asked the Parliamentary Secretary to the Minister of Local Government and to the Minister of Information and Broadcasting: (*a*) Is he aware that the Kokuvil Village Council was recently audited and that the audit disclosed a cash shortage of about Rs. 32,000? (*b*) Is he aware that this is the third serious deficit disclosed in the accounts of this village council? (*c*) Is he aware that previously there was an unauthorized expenditure of about Rs. 43,000, which was spent in order to supply electricity to Sippiththarai? (*d*) Is he aware that this amount was surcharged against the Chairman, Mr. C. Arulampalam? (*e*) Is he aware that the Auditor-General's Report for the year 1962-63 disclosed a sum of Rs. 17,058.18 as having been lost, as a result of a so-called theft of money belonging to this village council? (*f*) Has any action been taken against the chairman of this village council? (*g*) If no action has been taken, why not?

**එස්. ද එස්. ජයසිංහ මයා. (පළාත් පාලන ඇමතිගේ සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම් වෙනුවට)**

*(திரு. எஸ். டி எஸ். ஜயசிங்ஹ—உள்ளூராட்சி அமைச்சரதும், தகவல், ஒலிபரப்பு அமைச்சரதும் பாராளுமன்றக் காரியதரிசி சார்பாக)*

(Mr. S. de S. Jayasingha—on behalf of the Parliamentary Secretary to the Minister of Local Government and to the Minister of Information & Broadcasting)

(අ) 1967 පෙබරවාරි මස 20 වෙනි දින කොකුවිල් ගම් සභාවේ ගණන් පරීක්ෂණයේදී රු. 31,803·00 ක මුදල් අඩුපාඩුවක් එළිදරව් විය. මෙම මුදල 1967 මාර්තු මස 8 වෙනි දින තැන්පත් කොට ඇත. (ආ) ඔව්. (ඉ) මෙම කරුණ ගැන ගරු ඇමතිතුමා දැන් දැන සිටී. (ඊ) ඔව්. (උ) ඔව්. (ඌ) සභාපතිගෙන් මුදල් අයකර ගැනීම සඳහා පූර්ණ ගාස්තු සහතිකයක් නිකුත් කොට ඇත. නිලයෙන් පහනොකිරීමට හේතු දක්වීම පිණිස සභාපතිට විරුද්ධව චෝදනා ද සකස් කර ඇති අතර, මෙම කරුණ ගැන දැනට තීරණයක් ගෙන නොමැත. (එ) පැන නොනඟී.

## තැපැල් ස්ථානාධිපතීන් තේරීමේ විභාගය, 1965 : පත්වීම්

*தபாலதிபர் பரீட்சை, 1965 : நியமனங்கள்*

**POSTMASTERS' EXAMINATION, 1965 : APPOINTMENTS**

5. **ලෙස්ලි ගුණවර්ධන මයා.** (ආචාර්ය එන්. එම්. පෙරේරා—වෙනුවට)

*(திரு. லெஸ்லி குணவர்தன—கலாநிதி என். எம். பெரேரா சார்பாக)*

(Mr. Leslie Goonewardene—on behalf of Dr. N. M. Perera)

රජයේ වැඩ, තැපැල් සහ විදුලි සන්දේශ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) තැපැල් ස්ථානාධිපති තනතුරු පිළිබඳ ඇබෑර්තු පිරවීම සඳහා විභාගයක් 1965දී පවත්වන ලද බවත්, එම විභාගයේ ප්‍රතිඵල 1966 නොවැම්බර් 18 වන දින අංක 14,722 දරණ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශ කරන ලද බවත් එතුමා දන්නවාද? (ආ) මෙම ගැසට් නිවේදනය අනුව, (1. ටී. ජී. අබේසිංහ (L. 500 KY); 2. බී. ජී. පියසේන (L. 631 KY); 3. ආර්. ඩබ්ලිව්. රණවක (L. 646 KY); 4. පී. ජී. සෙනෙවිරත්න (L. 662 KY); 5. යූ. ජී. විජේරත්න (L. 752 KY) යන මේ පුද්ගලයින් විභාගයෙන් සමත් වූවන් හැටියට දක්වන ලද බව එතුමා දන්නවාද? (ඉ) මෙකී අයගෙන් කිසිවකු එම තනතුරට මෙතෙක් පත් කර නැති බව එතුමා දන්නවාද? (ඊ) මේ අයට වඩා අඩුවෙන් ලකුණු ලැබූ වෙනත් අයට පත්වීම් ලැබී ඇති බව එතුමා දන්නවාද? (උ) වාචික පරීක්ෂණයක් නොකරන ලද බැවින්, මේ පත්වීම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දීමේදී 1965 ගේ විභාගයේ ප්‍රතිඵල තදින්ම අනුගමනය කිරීමට එතුමා වග බලා ගන්නවාද ?

அரசாங்கக் கட்டுவேலை, தபால், தந்திப் போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா: (அ) தபாலதிபர் பதவிகளை நிரப்புவதற்கென 1965 இல் பரீட்சையொன்று நடைபெற்றது என்பதையும், அதன் பெறுபேறுகள் 1966, நொவெம்பர் மாதம் 18 ஆந் தேதி 14,722 இலக்க வர்த்தமானியில் பிரசுரிக்கப்பட்டன என்பதையும் அவர் அறிவாரா? (ஆ) இந்த வர்த்தமானி அறிவித்தலின்படி, இப்பரீட்சையில் சித்தியடைந்ததாக பின்வருவோரின் பெயர்கள் கொடுக்கப்பட்டன என்பதை அவர் அறிவாரா :—1. ரி. ஜி. அபேசிங்க (எல். 500 கே. வை.) 2. பி. ஜி. பியசேன (எல். 631 கே. வை.) 3. ஆர். டபிள்யூ. றனவக்க (எல். 646 கே. வை.) 4. பி. ஜி. செனிவரத்தின (எல். 662 கே. வை.) 5. யூ. ஜி. விஜயரத்தின (எல். 752 கே. வை.)? (இ) இவர்களுள் எவருமே இதுவரையில் இப்பதவிகளுக்கு நியமிக்கப்படவில்லை என்பதை அவர் அறிவாரா? (ஈ) இவர்களைவிடக் குறைந்த புள்ளிகள் பெற்ற மற்றையோருக்கு நியமனங்கள் கிடைத்திருக்கின்றன என்பதை அவர் அறிவாரா? (உ) நேர்முகப் பரீட்சை யெதுவும் நடைபெறாததால், 1965 ஆம் ஆண்டு நடைபெற்ற பரீட்சையின் பெறுபேறுகளின் படியே நியமனங்கள் செய்யப்படுவதற்கு அவர் வகை செய்வாரா?

asked the Minister of Public Works, Posts and Telecommunications: (*a*) Is he aware that an examination was held in 1965 for filling the posts of postmasters and its results were published on the 18th of November 1966 in Gazette No. 14,722? (*b*) Is he aware that according to this Gazette notification the following were gazetted as having passed the examination: (1) T. G. Abeysinghe (L 500 K Y). (2) B. G. Piyasena (L. 631 K Y). (3) R. W. Ranawaka (L. 646 K Y). (4) P. G. Seneviratne (L. 662 K Y). (5) U. G. Wijeratne (L. 752 K Y)? (*c*) Is he aware that none of the above has been appointed to a post as yet? (*d*) Is he aware that others who received less marks have received appointments? (*e*) In view of the fact that no Viva Voce test was held, would he see that the results of the 1965 examination are strictly adhered to in making these appointments?

**විජයපාල මෙන්ඩිස් මයා.**
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)

(අ) ඔව්. (ආ) ගෙන හැර දක්වා ඇති නාම, සඳහන් කරන ලද ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි සමත්වූ අපේක්ෂකයින්ගේ නම් ලැයිස්තුවේ පළ කරනු නො ලැබිණි, (ඉ) පැන නොනගී. (ඊ) නැත. (උ) පැන නොනගී.

**බුලත්සිංහල කොට්ඨාශයේ ග්‍රාමසේවක මාරු**

புலத்சிங்களவிலுள்ள கிராமசேவையாளர்: மாற்றம்

GRAMASEVAKAS IN BULATHSINHALA: TRANSFERS

6. **එල්. සී. ද සිල්වා මයා.** (බලපිටිය—මංගල මුණසිංහ මයා.—බුලත්සිංහල—වෙනුවට)
(திரு. எல். சீ. டி சில்வா—பலப்பிட்டிய—(திரு. மங்கள முனசிங்க—புலத்சிங்கள—சார்பாக)
(Mr. L. C. de Silva—Balapitiya—on behalf of Mr. Mangala Moonesinghe—Bulathsinhala)

ස්වදේශ කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) බුලත්සිංහල මැතිවරණ කොට්ඨාශය තුල සේවය කළ, 1967.1.1 දිනට පසුව මාරුවීම් ලැබූ, ග්‍රාමසේවක මහතුන්ගේ ගණන කොපමණද? (ආ) ඔවුන්ගේ නම් මොනවාද? (ඉ) එකී ග්‍රාමසේවක මහතුන් මාරුවීම් ලැබූ ස්ථාන කවරේද? (ඊ) එකී ග්‍රාමසේවක මහතුන් මාරු කිරීමට හේතු කවරේද?

உள்நாட்டமைச்சரைக் கேட்ட வினா: (அ) புலத்சிங்கள தேர்தல் தொகுதியில் சேவை செய்து 1.1.67 ஆம் தேதிக்குப் பின் மாற்றம் பெற்ற கிராம சேவையாளரின் எண்ணிக்கை

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාචික පිළිතුරු

[එල්. සී. ද සිල්වා මයා.]

எவ்வளவு? (ஆ) அவர்களின் பெயர்கள் என்ன? (இ) குறிப்பிட்ட கிராம சேவையாளர்கள் எவ்விடங்களுக்கு மாற்றப்பட்டனர்? (ஈ) குறிப்பிட்ட கிராம சேவையாளர்கள் எதற்காக மாற்றப்பட்டனர்?

asked the Minister of Home Affairs: (*a*) How many gramasevakas who served in the Bulathsinhala Electorate have been transferred since 1.1.67? (*b*) What are their names? (*c*) To what places were these gramasevakas transferred? (*d*) What are the reasons for their transfers?

**ගරු ආචාර්ය ඩබ්ලිව්. දහනායක (ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති)**
*(கௌரவ கலாநிதி டபிள்யூ. தகநாயக்க—உள்நாட்டு விவகார அமைச்சர்)*
(The Hon. Dr. W. Dahanayake— Minister of Home Affairs)

(අ) 8 දෙනයි.

(ආ) (1) 825—මෝල්කාව ග්‍රාම සේවක, ඇම්. කේ. ගුණපාල, මහතා
(2) 822—බෝතලේ ග්‍රාමසේවක, ඇම්. ධර්මසේන මහතා
(3) 815—නාහල්ල ග්‍රාමසේවක, ඩී. ඩී. ජයසේකර මහතා
(4) 814—ගෝවින්න ග්‍රාමසේවක, පී. ඩී. කරෝලිස් මහතා
(5) 811—කරන්නාගොඩ ග්‍රාමසේවක. ජී. ඇස්. ජයවර්ධන මහතා
(6) 816—වරකාගොඩ ග්‍රාමසේවක, ඩබ්ලිව්. ඩී. ශ්‍රීමපාල මහතා
(7) 811—කරන්නාගොඩ ග්‍රාමසේවක, ජී. ඩී. ගුණසේන මහතා
(8) 814—ගෝවින්න ග්‍රාමසේවක, ඇම්. කේ. ගුණපාල මහතා

(ඉ) (1) ඇම්. කේ. ගුණපාල මහතා—1967.1.1 දින සිට 845—කුරුපිට කොට්ඨාශයට
(2) ඇම්. ධර්මසේන මහතා—1967.3.1 දින සිට 842—බොරලුගොඩ කොට්ඨාශයට
(3) ඩී. ඩී. ජයසේකර මහතා—1967.3.1 දින සිට 850—පැලවත්ත කොට්ඨාශයට
(4) පී. ඩී. කරෝලිස් මහතා—1967.3.1 දින සිට 845—කුරුපිට කොට්ඨාශයට
(5) ජී. ඇස්. ජයවර්ධන මහතා—1967.3.1 දින සිට 838—හැඩිගල්ල කොට්ඨාශයට
(6) ඩබ්ලිව්. ඩී. ශ්‍රීමපාල මහතා—1967.3.1 දින සිට 846—කෙච්චියාගල කොට්ඨාශයට
(7) ජී. ඩී. ගුණසේන මහතා—1967.4.5 දින සිට 838—හැඩිගල්ල කොට්ඨාශයට
(8) ඇම්. කේ. ගුණපාල මහතා—1967.4.5 දින සිට 836—පැලෑද කොට්ඨාශයට

(ඊ) (1) ඇම්. කේ. ගුණපාල මහතා—අදාල ග්‍රාම සේවකයින් විසින් ඉල්ලන ලද අන්‍යොන්‍ය ස්ථාන මාරුවකින්
(2) ඇම්. ධර්මසේන මහතා
(3) ඩී. ඩී. ජයසේකර මහතා
(4) පී. ඩී. කරෝලිස් මහතා
(5) ජී. ඇස්. ජයවර්ධන මහතා } පරිපාලනමය හේතූන් උදෙසා
(6) ඩබ්ලිව්. ඩී. ශ්‍රීමපාල මහතා
(7) ජී. ඩී. ගුණසේන මහතා
(8) ඇම්. කේ. ගුණපාල මහතා

**එල්. සී. ද සිල්වා මයා.**
*(திரு. எல். சீ. டி சில்வா)*
(Mr. L. C. de Silva)

මේ මාරුවීම් සියල්ලම දී තිබෙන්නේ අගලවත්ත මැතිවරණ කොට්ඨාශයේ සිටි අයටද?

**ගරු ආචාර්ය දහනායක**
*(கௌரவ கலாநிதி தகநாயக்க)*
(The Hon. Dr. Dahanayake)

ඒ ගැන සොයා බලා උත්තරයක් දෙන්නට ඕනෑ.

**එල්. සී. ද සිල්වා මයා.**
*(திரு. எல். சீ. டி சில்வா)*
(Mr. L. C. de Silva)

ඇමතිතුමා සාමාන්‍යයෙන් ඒ ප්‍රදේශය ගැන දන්නවා ඇති නොවැ.

**ගරු ආචාර්ය දහනායක**
*(கௌரவ கலாநிதி தகநாயக்க)*
(The Hon. Dr. Dahanayake)

පිළිතුරක් දෙන කොට ඒ පිළිතුර හරි පිළිතුරක්ම විය යුතුයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## මන්ත්‍රී මණ්ඩලයේ රැස්වීම

சபை அமர்வு

SITTINGS OF THE HOUSE

**ගරු සී. පී. ද සිල්වා (ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති හා සභානායක)**

(கௌரவ சி. பி. டி சில்வா—காணி, நீர்ப் பாசன, மின்விசை அமைச்சரும் சபை முதல் வரும்)

(The Hon. C. P. de Silva—Minister of Land, Irrigation and Power and Leader of the House)

I move,

"That this House at its rising this day do adjourn until 2 P.M. on Friday, 2nd June, 1967; and that the hours of Sitting that day shall be as though it were a Second Day from the Poya Day."

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

## පරිපූරක මුදල: තේ අපනයන තීරු ප්‍රතිදාන යෝජනා ක්‍රමය

குறைநிரப்புத் தொகை: தேயிலை ஏற்றுமதித் தீர்வை குறைத்தல் திட்டம்

SUPPLEMENTARY SUPPLY: TEA EXPORT DUTY REBATE SCHEME

**කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී. ඊට අදාළ ප්‍රශ්නය.—[අප්‍රේල් 22.]**

ஏப்ரல் 22 ஆம் தேதிய வினா மீதான ஒத்திவைக்கப் பெற்ற விவாதம் மீள ஆரம்பிப்பதற்கான கட்டளை வாசிக்கப்பட்டது.

*Order read for resuming Adjourned Debate on Question.—[22nd April.]*

"That a supplementary sum of Rupees Thirty-five million (Rs. 35,000,000) be payable out of the Consolidated Fund of Ceylon or any other fund or moneys of, or at the disposal of the Government of Ceylon or from the proceeds of any loans obtained by the Government of Ceylon, for the services of the financial year beginning on 1st October 1966, and ending on 30th September 1967, and that the said sum be expended as specified in the Schedule hereto:

*Schedule*

| | Rs. |
|---|---|
| Head 47—Miscellaneous Services | |
| Vote No. 2—Administration Charges—Recurrent Expenditure .. | 35,000,000 |
| New Sub-head 28—Tea Export Duty Rebate Scheme" | |

—[ගරු මන්ත්‍රීනායක]

**ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.**

வினா மீண்டும் எடுத்தியம்பப்பெற்றது.

*Question again proposed.*

පූ. භා. 10.24

**ගරු එම්. ඩී. බණ්ඩා**

(கௌரவ எம். டீ. பண்டா)

(The Hon. M. D. Banda)

Mr. Deputy Speaker, I dealt yesterday with the need for the subsidy and the measures taken to keep the industry going. It is particularly important in respect of the small holders. It is also important to see that we earn whatever foreign exchange we can by the export of tea.

I also dealt with the powers available to the Tea Controller to curb the activities of those factory owners who do not pass the benefits under this subsidy scheme to the producer. Action is taken on the complaints received by him. I mentioned the details of that and I wanted hon. Members of the House to bring to the notice of the Tea Controller or the Ministry any cases where they feel that this assistance is not being received by the producer, and said that we will then take action.

I am told that in some areas, according to the present prices, up-country green leaf fetches about 20 cents, mid-country about 18 cents and low-country 14 to 16 cents. It may be a little more or less than that. If hon. Members feel that the producers who are giving the green leaf to the factories do not get the proper amount, then the moment that is brought to our notice we will take action.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු එම්. ඩී. බණ්ඩා]

I mentioned at the very beginning that this scheme is not one which does not have certain inherent possibilities of racketeering. As time went on we felt that there were certain tendencies in that direction. We found that certain quantities of tea sold at the auctions were coming back. Certain factory owners were adopting that ruse. In view of that, there is now a Bill before the House—I am not anticipating what is to follow—to charge export duty at the point of sale and not subsequently as it is done today. At the point of of sale that tea will have to carry 35 cents export duty, and even if that tea comes again on a second round, the maximum benefit under this scheme being 35 cents, no further benefit will be derived. It is in respect of tea that sells below Rs. 1.50 that some racketeering could take place. The Bill that is to be taken up next will prevent that position, the same tea coming up again ; it will prevent this fund being exploited by dishonest factory owners.

I also made mention of the fact that while all this is being done to keep the industry going, barter trade is also being pursued with certain countries to see whether we could expand our tea sales to those countries and buy certain products we want in this country. I think I gave a fair account of that. The hon. Member for Divulapitiya read a full account of it and he was happy about it. I do not want to take the time of the House by dwelling on it any further.

Although I had intended to comment on the E. C. M., I will not do so now because this Debate has taken a long time. The fact that Britain has made an application to enter the E. C. M. is bound to have certain repercussions on our trade ; they may possibly be important repercussions because under the Commonwealth Scheme certain benefits may accrue to our trade in many items ; and in particular, tea which is an export that does not carry a duty in the U. K. Preferential treatment is obtained for tea in the U. K. and U. K. is one of the heaviest consumers of Ceylon tea; so that, when she enters the E. C. M. there is no doubt that our interests will be affected. I think the Government is taking action in the matter of the proposed entry of Britain to the E. C. M.

I wish to say that the crisis facing the tea industry is one that cannot be tackled effectively and adequately with the measures that have been adopted. Those measures have been taken to keep the industry going. Seeing that a certain quantity of our low-country and mid-country tea is banking up without outlets due to over-production in various producing countries, including Ceylon perhaps, and many other factors, the Government decided to examine this question thoroughly and fully and take some drastic action to meet the situation ; and for that purpose the Government has appointed a commission. I think the hon. Member for Divulapitiya read out the terms of reference of that commission. I need not repeat them. He also read out the names of the members of the commission and expressed satisfaction over the selection of those members.

Whatever is necessary to be brought out by way of investigation in regard to the tea industry is caught up in these terms of reference. In fact, I had intended to comment on the terms of reference one by one because some comments were made about them by the hon. Member for Divulapitiya, but instead of considering them one by one I shall merely give a summary of the terms of reference. They cover the whole tea industry from the stage of planting to that of consumption. Any person who is interested in the tea industry, who has views to express on ways and means of putting the tea industry on its feet, has every opportunity of placing his views and giving evidence before the commission under these terms of reference. Barter trade is not excluded. These terms of reference have been so framed as to catch up the whole field of activity

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

within the tea industry. We do hope that the commission will produce useful recommendations. I think we have to face the fact that there may be certain marginal land which even today or at the best of times is marginal, and we might have to find alternative crops for such marginal land if we want to keep the industry going and also make use of those marginal lands for some better productive purposes. It may be that we may have to put those marginal lands back to pastures, as my hon. Friend, the Member for Habaraduwa, said—that is not ruled out—or plant any other crop found to be useful for Ceylon.

I think I have fairly adequately dealt with the points that were raised in the course of this Debate, and I would like a quick disposal of this Supplementary Vote because it has taken a pretty long time. I have made an attempt to justify this Supplementary Vote. I have stated how we propose to see to it that the benefits of this scheme go to the small producer and what steps we propose to take to prevent abuses. I have pointed out that it is a case not only of prices dropping but also of teas piling up here as a result of increasing production. I have mentioned what attempts we are making to have more tea despatched from Ceylon to other countries. I have mentioned the terms of reference of the commission that has been appointed in a very general way. The terms of reference include propaganda, research, subsidy schemes, duty, various agencies entering into the trade, etc.

I think that is all that the Government can do, and we welcome any useful suggestions anybody has to make. I do beg of the House to dispose of this item quickly, so that we can take up the next item on the Order Paper which is also part and parcel of this same subject.

පූ. භා. 10.36

**ආර්. සිංගල්ටන්-සැමන් මයා. (පත් කරන ලද මන්ත්‍රී)**

*(திரு. ஆர். சிங்கல்டன்-சமன்—நியமன அங்கத்தவர்)*

(Mr. R. Singleton-Salmon—Appointed Member)

Mr. Deputy Speaker, I will not take very long—I never do. But that does not mean that I particularly like this Supplementary Estimate. Naturally, we would support it for want of something better because, as we warned the Government when it was brought up, this device of refunding a rebate on export duties has been tried before and certain malpractices were discovered. And, as you know, when there are malpractices in the trade everybody gets tarred with the same brush because allegations are made and no names are mentioned. Therefore, we did not like this particular form of relief although we realized that relief was necessary and that it must be administered quickly. But I can support the actual passing of this Supplementary Estimate knowing that another Bill is coming up which will substitute a sales tax for this export duty of 35 cents, so that, although we are passing this Estimate, part of it is for expenditure already incurred and part of it will not be necessary if the Tea (Sales Tax) Bill goes through.

I would like to mention one or two matters that have not been raised on the Floor of the House. The hon. Member for Devinuwara (Mr. de Mel) quoted Mr. D. B. Ellepola as saying that he paid six pence for a cup of tea in England. Of course, in his Devinuwara way, the devious way, he then twisted that to mean that Ceylon was being exploited by the imperialists to the extent that they were selling or at least making about Rs. 80 a pound and paying Ceylon about Rs. 2 for it. As the hon. Member for Nallur said, it includes other charges like rent, etc., but I will ignore that aspect for the moment.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සිංගල්ටන්-සැමන් මයා.]

Six pence is thirty-three cents, and that is what you pay for a cup of tea in London. In Chinese Cafes where wages etc. are very low and rent is not possibly very high you pay fifteen cents. Moving up a little way we come to the restaurant of the House of Parliament and there you pay twenty-five cents for a cup of tea. Now, that six pence is for tea transported all the way from Ceylon to London which has gone through the auction, and all the attendant costs are included in it. In our own restaurant—I might say where tea is grown at our door step—we pay twenty-five cents for a cup of tea as against thirty-three cents you have to pay in London. If you go to a resthouse in Ceylon you have to pay fifty cents because you have to pay thirty cents for a cup of tea and twenty cents as occupation charges. Well, occupation charges are similar to the rent and other charges included in the six pence or thirty-three cents that you have to pay in London. At the Mahara Resthouse, nine miles away from Colombo, you have to pay fifty cents for a cup of tea. Then in one of the big hotels in Colombo you have got to pay a rupee for a pot of tea. Even if what you need is only a cup of tea you have to buy a pot of tea and that costs you a rupee. In our own country where tea is grown we have to pay fifty cents for a cup of tea as against the thirty-three cents that you have got to pay six thousand miles away in London. That is one point.

Mention was made of the " Golden Brains " Budget of 1964, and the speech of the then Hon. Minister of Finance, now the hon. Member for Yatiyantota, wherein reference was made to agency houses, the auctions etc., how wicked they were, and the investigations that he was going to make. The Tea Traders' Association took up the matter immediately and invited very cordially the then Hon. Minister of Finance, Dr. N. M. Perera, to make all the investigations he wished to do, to attend to it by himself or to send whatever expert he wanted to investigate the auctions etc. That chance was not taken by him, but now he says that he was the first to bring up this matter of the agency houses and the auctions. Of course, he was ; but what did he do when he was invited to carry out his contemplated investigations ? He did nothing. It is very well for him now to say that somebody else should do it.

Certain remarks were made by the hon. Member for Deniyaya (Mr. C. N. Kannangara). I do not wish to refer to them because everybody knows Charlie and treats his remarks accordingly.

The hon. Members of the Opposition asked, " Why are you not selling tea to Russia and the other East European countries ? " Surely, Sir, the question should be, " Why are not the Russians and the East European countries buying from us ? " Nobody is stopping them from buying; we are anxious to sell our tea. You just cannot send the tea there and hope for the best. Last year Russia bought seven million pounds of tea. Seven million pounds of tea for a population—I do not know—of about 250 million people! Iraq, a very much smaller country, bought 47 million pounds of tea. U.K., of course, bought 177 million pounds of tea from us. Apparently, U.K. is a dirty word, and that is why it is not mentioned.

But I would ask all these friends of the East European countries to use their influence to sell our tea instead of merely coming here and asking, " Why do you not sell to Russia ? Why do you not sell to the East European countries ? " My goodness, Sir !—I was about to make a remark which I will not make because it might be unparliamentary.

ටී. බී. ඉලංගරත්න මයා. (කොලොන්නාව)
(திரு. ரீ. பி. இலங்கரத்ன—கொலொன்னுவ)
(Mr. T. B. Ilangaratne—Kolonnawa)

Say it and withdraw.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**සිංගල්ටන්-සැමන් මයා.**
*(திரு. சிங்கல்டன்-சமன்)*
(Mr. Singleton-Salmon)

Some doctors in this House have preseribed remedies, at least diagnosed the disease affecting Ceylon. I do not think anybody has been quite so—how shall I put it ?—ridiculous as the hon. Member for Habaraduwa (Mr. Prins Gunasekera) who says, " The tea industry has a headache; cut its head off. That will cure it."

Sir, I do not want to delay this House too long, but I must say that we welcomed the rebate although we did point out the malpractices that would arise out of it. As I said before, when the tea sales tax has taken its place then I think those malpractices might be avoided.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

The hon. Member for Balapitiya (Mr. L. C. de Silva).

I would request hon. Members to be as brief as possible. We have discussed this matter in full and it is useless repeating the same arguments over and over again. But I shall not prevent anybody from speaking. I shall give everybody a chance. Only, please avoid repetition.

පූ. භා. 10.46

**එල්. සී. ද සිල්වා මයා.**
*(திரு. எல். சி. டி சில்வா)*
(Mr. L. C. de Silva)

Mr. Deputy Speaker, I am glad I have the opportunity of speaking here after the Hon. Minister of Agriculture. As a matter of fact, the Hon. Minister seems to believe sincerely that the benefits under this scheme reach the small holder. He refuses to believe the hon. Member for Baddegama (Mr. Neale de Alwis) who interrupted him to say that the small holder was in fact not being benefited by this scheme.

The Hon. Minister, nevertheless, did admit that there is a possibility of some sort of racketeering in the working of this scheme, but, by and large, his belief is that the sector that is being benefitted by this scheme is the small holder.

I think the Hon. Minister appears to be in the dark about the way in which this scheme is being administered. I would like to inform the Hon. Minister and this House that the vast majority of small holdings, particularly in the Southern Province, are not being even plucked today because the small holders cannot get even 15 cents for a pound of green leaf. Now that the Government has adopted this scheme which is being operated through factory owners, the Government is entitled to exercise greater control over these factory owners.

The Hon. Minister told us that there is an inspectorate under the Tea Control Department that makes routine checks of these factories and ascertains the prices paid for green leaf. I personally am not aware of any such inspections, and even if there be such inspections, I doubt very much whether any inspector bothers to ascertain how much is paid to the small holder. The factory owners have various ways of circumventing the law in this regard, or rather the intention of the Government in this matter.

For instance, I am personally aware that factories send up their tea in various lots to the auctions. They see to it that one small lot—say a lot consisting of a thousand pounds, out of 20,000 pounds —sent up by a factory, does not qualify for the subsidy, and then what they do is produce that invoice to the suppliers of green leaf and tell them, " You have not qualified for the subsidy; therefore, you can be paid only nine cents or ten cents per pound of green leaf." That is one of the rackets perpetrated on the poor suppliers of green leaf by these factory owners.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එල්. ඕ. ද සිල්වා මයා.]

Factories charge as much as 45 cents as manufacture and sales charges. I am sure the Tea Control Department has the personnel and sufficient knowledge and experience to know that the manufacture of a pound of tea does not cost anything more than 30 cents, or 35 cents at the most. But they compute the price of green leaf on the basis of 45 cents being the manufacture and sales charges, and the balance is divided on the basis of about 21 pounds of made tea from every 100 pounds of green leaf. I think during the dry months they get as much as 24 per cent. Even in the wettest months they get at least 22½ per cent. But the computation is done on the basis of 21 per cent. made tea from every 100 pounds of green leaf.

It was only last month that the Government gave factory owners another concession. They allowed factory owners to borrow money from commercial banks, and the Government was to sibsidize the interest. The Government was to pay 60 per cent. of the interest on moneys borrowed for extensions to factories, renewal of machinery, erection of new factories, and so on. Now that all these concessions have been given to factory owners, the Government has a right to exercise some control over the factories.

You know that the average small holder has no knowledge whatsoever of the prices realized by tea factories at the sales. The particulars of tea sales are published only in the English newspapers; these particulars are not published in any Sinhala newspaper. So, you will see that the ordinary small holder has no knowledge whatsoever of the profits realized from the manufacture of his tea. So he has to depend on some invoice that is produced by the factory owner.

The remedy is in the hands of the Tea Control Department. The department is in a position today to lay down a minimum price for green leaf. Only those teas that fetch 90 cents or more at the auctions are entitled to the rebate of 35 cents. That adds up to Re. 1.25 for a pound of made tea. On that basis, leaving 35 cents for manufacture and sales charges, a sum of 90 cents is available to be paid for the green leaf; and on the basis of 4½ pounds of green leaf for every pound of made tea, the department can say that the minimum price for green leaf should be 20 cents.

I think there should be no difficulty in that regard. I do not understand why the Government has not taken that step. Large sums of money voted by this House have gone to fatten some unscrupulous factory owners and certain middlemen in the trade. If the Hon. Minister and the Government think that the small holder has benefited, I must say that they are mistaken. I am prepared to take the Hon. Minister to the small holders in the Southern Province so that he may get first-hand information from them. In fact, as I told you earlier, most of the small holdings are not even being plucked; they are turning into jungle. The Government could have, especially in the Deniyaya Electorate, met the present situation through the State Plantations Corporation if they were functioning efficiently. In the Deniyaya District alone the State Plantations Corporation has three very large factories capable of manufacturing all the teas of the small holdings in that electorate. I think the State plantations today are not even plucking their own tea. The hon. Member for Agalawatta (Dr. Colvin R. de Silva) mentioned yesterday that in Pelawatta Estate as many as 500 acres are being allowed to grow into jungle.

What I would suggest is that the Government should lay down a minimum price of 20 cents a pound for green leaf and compel factory owners to submit a return to the Tea Controller indicating the quantities of bought leaf purchased, a list of the persons from whom they were purchased, and the amount paid for such

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

tea. If that is done, we can then expect the benefit to reach the small-holder.

The Government can also request the Chamber of Commerce to publish particulars of the tea sales in the Sinhala newspapers as well so that the ordinary man who owns these small acreages of tea can also have knowledge of what his tea had fetched without depending on the factory owners to tell him.

I hope the Hon. Minister will take some action in that direction and endeavour to fix a minimum price on the basis I have suggested.

පූ. භා. 10.55

**බී. එච්. බණ්ඩාර මයා.** (බදුල්ල)

*(திரு. பி. எச். பண்டார—பதுளை)*

(Mr. B. H. Bandara—Badulla)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තේ සම්බන්ධව විශේෂ සම්බන්ධකමක් තිබෙන ප්‍රදේශයක මන්ත්‍රීවරයකු වශයෙන් මෙම පරිපූරක මුදල පිළිබඳව අදහස් ස්වල්පයක් ප්‍රකාශ කිරීමට මා අදහස් කරනවා. මට ප්‍රථමයෙන් කථා කළ ගරු මන්ත්‍රීතුමා (සිංගල්ටන්-සැමන් මයා.) මේ රටේ තේ කෝප්පයක මිළ පිළිබඳව සඳහන් කරන්න යෙදුණා. අපේ ආපානශාලාවෙ තේ කෝප්පයක මිළ ශත 25ක්ය, තානායමක ශත 50ක්ය, මහ හෝටලයෙ රුපියලක්ය කියා එතුමා සඳහන් කළා. එහෙත් සාමාන්‍ය මිනිස්සු යන එන සාමාන්‍ය තේ කඩයක තේ කෝප්පයක මිළ කීයද කියා එතුමා දන්නෙ නැහැ. ඒ මන්ත්‍රීතුමා ගැවසෙන පරිසරය අනුව ඒ කාරණය පිළිබඳව දැනගැනීමට එතුමාට පුළුවන් කමක් නැහැ. හොඳ හොඳ හෝටල්වලින් මිසක් සාමාන්‍ය හෝටල්වලින් එතුමා කන්නෙ බොන්නෙ නැති නිසා ඒ ගැන දැනගැනීමට එතුමාට ඉඩක් නැහැ.

සාමාන්‍ය මිනිහා යන එන සාමාන්‍ය කඩයක තේ කෝප්පයක මිල ශත 6 යි. එසේ නම් ඒ තේ කෝප්ප දෙකේ ඇති වෙනස අපි සොයා බලන්න ඕනෑ. අපට මෙහිදී ලැබෙන තේ කෝප්පයෙන්. ඒ වාගේම තානායමකදී ලැබෙන තේ කෝප්පයෙන් කොළඹ මහා හෝටලයේදී ලැබෙන තේ කෝප්පයෙන් සාමාන්‍ය කඩයක තේ කෝප්පයෙන් තිබෙන වෙනස පිළිබඳ අවබෝධයක් ලැබෙන තුරු, මේ ගැන දැනගැනීමට බැහැ. මම හිතන්නෙ ආණ්ඩුවට මේ ගැන අවබෝධයක් නැහැ. සාමාන්‍ය තේ කෝප්පයක මිල ඒ මන්ත්‍රීතුමා දන්නෙ නැති නිසා මේ පිළිබඳව ආණ්ඩුවට අවබෝධයක් නැත කියා අපට ඒත්තු ගන්න පුළුවන්.

නියෝජ්‍ය කථානායකතුමනි, ලෝකයේ ඉතාම උසස් වූත්, රසවත් වූත් තේ තිබෙන්නෙ අපේ රටෙයි. එහෙත් අපේ රටේ සාමාන්‍ය මහජනයාට හොඳ තේ කෝප්පයක් කවදාවත් බොන්න ලැබෙන්නෙ නැහැ. තානායමක හෝ කොළඹ මහා හෝටලයේ තිබෙන තේ කෝප්පයත්, සාමාන්‍ය කඩයක තිබෙන තේ කෝප්පයත් දෙස බලන විට සාමාන්‍ය මහජනයා පාවිච්චි කරන තේ මොන විධියේ තේද කියා අපට පැහැදිලිව පෙනෙනවා. අපට හොඳින්ම පෙනෙන කාරණයක් නම්, කර්මාන්ත ශාලාවලින් පෝර පිණිස අයින් කර තබන "ඩස්ට්" නොහොත් තේ රොඩු සුළු මිලකට සාමාන්‍ය කඩකාරයින් ලබාගෙන පාට කර සාමාන්‍ය මහජනතාවට තේ වශයෙන් විකුණන බවයි. මෙහි තිබෙන්නෙත් නියෝජ්‍ය කථානායකතුමනි, පංක්ති භේදයක්. මේ පංක්ති භේදය නැති කරන තුරු අපේ රටේ මහජනතාවට එක සමාන තේ කෝප්පයක් බීමේ අවස්ථාව ලැබෙන්නෙ නැති බව පැහැදිලිව පෙනෙනවා.

හොඳ තේ මේ රටේ නිෂ්පාදනය කළත්, ලෝකයෙන්ම උසස් රසවත් තේ මේ රටේ තිබුණත්, එවැනි හොඳ තේ ටිකක් බීමේ වාසනාව අපේ රටවැසියන්ට නොලැබීම ගැන අපි අත්ත වශයෙන්ම කණගාටු වෙන්න ඕනෑ. ඒ නිසා අපේ රටේ සාමාන්‍ය ජනතාවට එවැනි හොඳ තේ කෝප්පයක රස බැලීමේ අවස්ථාව සළසා දීම පිළිබඳවත් රජයේ සැලකිල්ල යොමු විය යුතු බව මම මතක් කරන්න ඕනෑ.

අපේ රටේ ප්‍රධාන අය මාර්ග කීපයක් තිබෙන බව අපි දන්නවා. එනම් තේ, රබර් සහ පොල් යන ප්‍රධාන තුනයි. ඒවායින් ප්‍රධාන තැනක් ගන්නේ තේ නිෂ්පාදන යයි. මේ රටට ලැබෙන විදේශ විනිමයෙන් වැඩි ප්‍රමාණයක් ලැබෙන්නේ තේ නිසයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල: තේ අපනයන තීරු ප්‍රතිදාන යෝජනා ක්‍රමය

[බී. එච්. බණ්ඩාර මයා.]

ඒ නිසා අපේ රටේ ආර්ථික තත්ත්වය සම්පූර්ණයෙන්ම රැඳී තිබෙන්නේ තේ මිල ප්‍රශ්නය මත බව අපි තේරුම් ගන්න ඕනෑ. නමුත් අපට පෙනී ගොස් තිබෙනව, කලක සිට අපේ තේ අලෙවිය අඩු වනවා පමණක් නොවෙයි තේ මිලද සීඝ්‍රයෙන් පහත බැසගෙන යන බව. මෙයට හේතුව මොකක්ද කියා අප ටිකක් සොයා බලන්න ඕනෑ. මේ කාරණය පිළිබඳව සොයා බලනවාය, මෙයට ප්‍රතිකාර කරන්න ආණ්ඩුව අදහස් කරනවාය කියා පැහැදිලි වශයෙන් අපට පෙනී යන්නෙ නැහැ.

මේ ආණ්ඩුවේ අගමැතිවරයා නොබෝද ප්‍රකාශ කර තිබුණා—එතුමා කර ඇති ප්‍රකාශයක් ප්‍රවෘත්ති පත්‍රයක පළ වී තිබෙනව මම දුටුවා—තේවලට අනාගතයක් නැහැයි කියා. ආණ්ඩුවටත් අනාගතයක් නැතුවා වාගේ තේවලටත් අනාගතයක් නැති බව වෙන්න ඇති අගමැතිතුමා කියා තිබෙන්නෙ. මම හිතනවා මෙය අගමැතිතුමා වගකීමෙන් තොරව කරන ලද ප්‍රකාශයක්. අගමැතිවරයා වශයෙන්, වගකීමෙන් තොරව එබඳු ප්‍රකාශ කිරීමෙන්, අපේ රටේ ආර්ථික තත්ත්වයට එය කොතරම් දුරට බලපානවද යන්න ගැන කිසිම සැලකිල්ලක් දක්වා නැති බව පෙනී යනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තේ නිෂ්පාදනය කරන ප්‍රදේශයක මන්ත්‍රීවරයකු හැටියට මා දන්නවා, ඌව ප්‍රදේශයේ තමයි ලංකාවෙ හොඳම තේ නිෂ්පාදනය කරන්නෙ. කෙසේ වුණත් අගමැතිතුමාගෙ මේ ප්‍රකාශයෙන් පස්සෙ තේ වගාව පිළිබඳව සැලකිල්ලක් දැක්වූ බොහෝ දෙනකු අධෛර්යයට පත් වී තිබෙනව. තේවලට අනාගතයක් නැතැයි රජයේ උසස්ම පුද්ගලයා කියනවා නම් තේ නිෂ්පාදනය ගැන, තේ වගාව ගැන උනන්දු වෙන්නට ඕනෑ නැත කියන හැඟීම, තේ වගාව ගැන උනන්දුවක් දැක්වූ බොහෝ දෙනාගේ සිත් තුළට කා වැදී තිබෙනව.

මෙය සුළු ප්‍රශ්නයක් ලෙස කිසි සේත් සලකන්න වටින්නෙ නැහැ. කවුරුන් රට ආණ්ඩු කළත්, වැඩි දවසක් යන්නට පෙර අපට ආණ්ඩු බලය ලැබුණත් අපේ රටේ ආර්ථික තත්ත්වය හොඳ තත්ත්වයකින් තිබුණොත් තමයි මේ රටේ ජනතාව සුඛිත මුදිත කරන්න පුළුවන් වන්නෙ, මහජනතාවගෙ ප්‍රශ්න විසඳන්න ලැබෙන්නෙ. කවුරුන් ආණ්ඩු කළත් රටේ ආර්ථික තත්ත්වය හොඳින් තිබෙන්න ඕනෑ බව පිළිගත යුතු සත්‍යයක්. කොයි ආණ්ඩුවක වුණත් යුතුකමක් තිබෙනව අපේ රටේ ආර්ථික තත්ත්වයට පහර වදින අවස්ථාවල දී එයට පිළියම් යෙදීමට. මෙය කොයි රජයෙන් වුණත් ඉටු විය යුතු යුතුකමක්. එමනිසා මේ රටේ ප්‍රධාන අය මාර්ගය වන තේ නිෂ්පාදනය පහත බැස්සොත්, මිල පහත බැස්සොත්, මේ රටේ ආර්ථික තත්ත්වය තවත් පහත බැසීමෙන්—දැන් නමුන්නාන්සෙල හාල් සේරුවත් කපා දමා තිබෙනව, දැන් හාල් පොතකට දෙන්නෙ මිරිස් අවුන්ස තුනයි, සුදුලූනු අවුන්ස 1 යි, කොත්තමල්ලි අවුන්ස 2 යි, උම්බලකඩ අවුන්ස 1 යි——

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy-Speaker)

ගරු මන්ත්‍රීතුමා කරුණා කර යෝජනාවට අදාලව කථා කරන්න.

**බී. එච්. බණ්ඩාර මයා.**
*(திரு. பி. எச். பண்டார)*
(Mr. B. H. Bandara)

දැන් ඔය විධියෙ තත්ත්වයක් ඇති වී තිබෙන්නෙ. එමනිසා මේ රටේ ප්‍රධාන අය මාර්ගය තේ නම් තේ මිල පහත වැටීමට හේතුව, තේ අලෙවිය අඩු වීමට හේතුව සොයා බලා එයට නිසි ප්‍රතිකාර යෙදුවෙ නැති නම් මේ රට වැඩි දිනක් යන්නට පෙර බංකොලොත් භාවයට වැටීම ගැන කිසිම අනුමානයක් නැහැ. අපි පිළිගන්න ඕනෑ, අප රටට සැහෙන ආදායමක් ලැබෙන්නෙ තේවලින් බව. අපි කොයි විධියෙන් කෑ ගැහැව්වත්, අපට කාල ඇඳල ඉන්න පුළුවන් වෙන්නෙ, අපේ අධ්‍යාපන ප්‍රශ්න, සෞඛ්‍ය ප්‍රශ්න ආදී වැදගත් ප්‍රශ්න විසඳගන්න පුළුවන් වෙන්නෙ අපේ රටේ ආර්ථික පදනම උඩ බව අමතක කරන්න නරකයි. එයට පහර වැදුණොත් අප කාටවත් මොකවත් කරන්න බැහැ. එමනිසා වගකිව යුතු රජයක යුතුකමක් තිබෙනවා, අපේ රටේ ප්‍රධානතම අය මාර්ගයට කලක සිට වැදී එන පහර වළක්වා, මේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තත්ත්වයෙන් රට මුදා ගෙන, රටේ ආර්ථික තත්ත්වය නැංවීම පිළිබඳව ගත හැකි සෑම පියවරක්ම ගැනීමට.

ගරු ඇමතිතුමා ඊයේ සිට දීර්ඝ කථාවක් පැවැත්වුවා, තේ නිෂ්පාදනය සම්බන්ධයෙන්. එතුමා, සුළු තේ වතු හිමියන්ට රුපියල් තුන් කෝටි පණස් ලක්ෂයක මුදලක් වාසි ලැබෙනවාය කියා ප්‍රකාශ කළත් ඒ මුදල සුළු තේ වතු හිමියන්ට ලැබෙන ක්‍රමය පිළිබඳව ගරු ඇමතිවරයා එතුමාගෙ කථාවෙදි පැහැදිලි විස්තරයක් කළේ නැහැ. එපමණකුත් නොවෙයි. සුළු තේ වතු හිමියන් කියන්නෙ අසුවල් අක්කර ප්‍රමාණයට වඩා අඩුවෙන් තිබෙන අයටයි යනාදි වශයෙන් ඒ පිළිබඳ පැහැදිලි විස්තරයක් කළෙත් නැහැ. ඒ නිසා මේ සුළු තේ වතු හිමියන් කියන්නෙ කෙවැනි තත්ත්වයේ අයටද කියා නිශ්චිත වශයෙන් තේරුම් ගන්ට අපට පුළුවන්කමක් නැහැ.

අපේ තේ අලෙවිය අඩු වීමට, එමෙන්ම තේ මිළ අඩු වීමට හේතු මොනවාද කියා අපට පැහැදිලිව පෙනෙනවා. අප විරුද්ධ පාර්ශ්වයෙ සිටියත් රජයේ සැලැකිල්ල යොමු වීම පිණිස අප දන්නා දේ කීමට අපට යුතුකමක් තිබෙනවා. අපේ රටේ ප්‍රධාන ආදායම් මාර්ගයට පහරක් වැදී තිබෙන විට රටට ආදරයක් ඇති කාගේත් සැලකිල්ල ඊට යොමු කළ යුතුයි. ආණ්ඩු පක්ෂයේ සිටියත්, විරුද්ධ පාර්ශ්වයේ සිටියත්, එය අප කාගේත් යුතුකමක්. අපේ තේ අලෙවිය හා තේ මිළ අඩු වීමේ එක් හේතුවක් තමයි, අපේ තේ පිළිබඳව කෙරෙන ප්‍රචාරක කටයුතුවල දුර්වලතාවය. මා එක් කරුණක් විශේෂයෙන් සඳහන් කරන්ට කැමතියි. අපේ රට වෙනුවෙන් විදේශවල සිටින තානාපතිවරුන් වෙනුවෙන් අප විශාල මුදලක් වැය කරනව නමුත් ඒ වැය කරන මුදලට තරම් ප්‍රමාණවත් වන සේවයක් ඔවුන්ගෙන් කෙරෙනවාද කියා අප විසින් සොයා බැලිය යුතුයි. අපේ තානාපතිවරුන්ට මේ තේ අලෙවිය හා ඊට වැඩි මිළක් ලබා දීම සම්බන්ධයෙන් විශාල සේවයක් කරන්ට පුළුවන්. අපේ තානාපතිවරුන්ගෙන් අපේ රටට වන සේවය මොකක්ද? අප ඒ වෙනුවෙන් වැය කරන මුදලට තරම් සරිලන සේවයක් ඔවුන්ගෙන් සිදු වනවාද? අපේ තානාපතිවරුන් සිටින්නෙ මොනව කරන්ටද? ඔවුන්ට පුළුවන්කම තිබෙනව, අපේ තේ පිළිබඳව ඒ ඒ රටවල ප්‍රචාරක කටයුතු ගෙන යන්ට. එපමණක් නොවෙයි. 'අපේ රටට වුවමනා ද්‍රව්‍ය ඒ ඒ රටවලින් පහසු මිළට ලබා ගන්නට පුළුවන්ද කියා සොයා බලා ඒ ඒ ආණ්ඩු සමඟ සාකච්ඡා කර, ඒ වෙනුවෙන් අපේ තේ ඒ ඒ රටවලට අලෙවි කරවීම සඳහා අවශ්‍ය කටයුතු කරන්නට අපේ තානාපතිවරුන්ට පුළුවන්කම තිබෙනව. අපේ තානාපතිවරුන් මේ ගැන නියම සැලැකිල්ලක් දක්වනවා නම් ලෝකය පුරා අපේ තේ පිළිබඳව හොඳ ප්‍රචාරයක් කර, අපේ තේවලට වැඩි මිළක් ලබා ගන්නට පුළුවන් වන අතර තේ වැඩි වැඩියෙන් අලෙවි කර ගැනීමටත් පුළුවන්කම ලැබෙනව. නමුත් මට නම් පෙනෙන්නෙ නැහැ, අපේ තානාපතිවරුන් ඒ විධියට වැඩ කරනවාය කියා. විදේශ රටවල් කීපයකම සංචාරය කරන්නට මටත් අවස්ථාව ලැබුණා. ඒ අවස්ථාවෙ මට දැන ගන්නට පුළුවන් වුණා, සමහර රටවල අපේ තේ පිළිබඳව කිසිම ප්‍රචාරයක් කර නැති බව. ඒ විදේශ සංචාරය කදී මට අපේ තානාපතිවරුන් කීප දෙනෙකුත් හමු වුණා. නමුත් ඔවුන් අපේ තේ පිළිබඳව හොඳ ප්‍රචාරයක් කර අපේ තේ වැඩි වැඩියෙන් අලෙවි කිරීමට කිසිම උනන්දුවක් ගන්නා බවක් මට නම් පෙනුණේ නැහැ.

ඒ නිසා අපි ඒ පිළිබඳව අපේ සැලකිල්ල යොමු කරන්ට ඕනැ. ඒ ඒ රටවල ඉන්නා අපේ තානාපතිවරුන්ට රජය බල කරන්ට ඕනැ, අපේ තේ වැඩි මිළකට වැඩි වැඩියෙන් අලෙවි කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කරන්ටය කියා. අපේ තේ අලෙවි වැඩි කරවීම සඳහා අපේ තානාපතිවරුන් ගන්නා උත්සාහය වැඩි කරවීම පිළිබඳව රජයේ විශේෂ සැලකිල්ල යොමු විය යුතු බව මා මතක් කරන්ට කැමතියි.

අපේ තානාපතිවරුන් ඒ පිළිබඳව නියම සැලැකිල්ලක් දක්වන්නෙ නැත්තෙ ඇයි? අපේ තානාපතිවරුන් සමහර විට පත් කරන්නෙ නොයෙකුත් පෞද්ගලික හිත වත්කම් උඩත්, මැතිවරණ ගිවිසුම් අනුවත් ආණ්ඩු පෙරළන්නට දුන් උදව් උඩත් බව අපි දන්නව. එවැනි පෞද්ගලික හිත වත්කම් උඩ තානාපතිකම් ලබා ගන්නා උදවිය තමන්ගෙ මඩිය තර කර ගැනීමට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල: තේ අපනයන තීරු ප්‍රතිදාන යෝජනා ක්‍රමය

[බී. එච්. බණ්ඩාර මයා.]

උනන්දු වනවා මිසක් මේ රට දියුණු කිරීමේ බලාපොරොත්තුවෙන් ක්‍රියා කරන්නෙ නැහැ. "අපේ රටේ ආර්ථික තත්ත්වය දියුණු කරන්ට ඕනෑය" කියන හැඟීමක් ඇතිව ක්‍රියා කරන උදවිය තානාපතිවරුන් වශයෙන් පත් කළොත්, අපේ තේ මීට වඩා අලෙවි කර ගැනීමට පුළුවන්කම ලැබෙනවා පමණක් නොව අපේ තේවලට වැඩි මිළකුත් ලැබී අපේ ආර්ථික තත්ත්වය දියුණු වීමට මග පැදෙනවාට කිසිම අඩමානයක් නැහැ. අපේ තේවලට ලබා ඇති මේ දුර්දශාවට ප්‍රතිකාරයක් වශයෙන්, අපේ තේ පිළිබඳව ඒ ඒ රටවල තානාපතිවරුන් මාර්ගයෙන් ප්‍රචාරක කටයුතු වඩ වඩාත් හොඳින් කරන්ට වහාම කටයුතු සැලැස්විය යුතු බව මා මතක් කරන්ට කැමතියි. දැන් අපේ තේ බලවත් තරඟයකට මුහුණ පා සිටින බව අප අමතක නොකළ යුතුයි. අපේ රටේ තේ වගාව පිළිබඳව උනන්දුවක් දැක්වූ සමහර උදවිය දැන් වෙනත් රටවල තේ වගා කිරීමේ කටයුතු කරගන යනවා. ඒ නිසා අපේ තේවලට තිබෙන තරඟය වඩාත් උග්‍ර වී තිබෙනව.

ඒ නිසා අපේ පිටරට තේ අලෙවිය වැඩි කර ගැනීම සඳහා රජයේ සැලකිල්ල යොමු විය යුතු කාලය පැමිණ තිබෙනව. එසේ අපි වැඩි වැඩියෙන් උනන්දුවෙන් ක්‍රියා නොකළොත් රජය බලාපොරොත්තු වන සංවර්ධන කටයුතු කර ගන්නට පුළුවන් වන්නෙ නැහැ. මුදල් නැත්නම් අපට කිසි දෙයක් කරන්න බැහැ. අපේ අධ්‍යාපනික ප්‍රශ්න, සෞඛ්‍ය ප්‍රශ්න, ආහාර ප්‍රශ්න ආදී සෑම ප්‍රශ්නයක්ම විසඳා ගැනීම සඳහා අපේ ආර්ථික තත්ත්වය ශක්තිමත් කර ගැනීමට නම් අපේ ප්‍රධාන අය මාර්ගය වන තේ පිළිබඳව මීට වඩා සැලකිල්ලක් දක්වා තේ අලෙවිය වැඩි කර ගන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රුසියාව වැනි සමාජවාදී රටවල් අපේ තේ ඉල්ලන්නෙ නැත කියා දැන් කථා කළ පත්කළ මන්ත්‍රීතුමා කිව්වා. අපි ධනවාදී රටවල් ගැන පමණක් බලාපොරොත්තුව තබන්නෙ නැතිව අපේ තේ අලෙවි කර ගන්න පුළුවන් සෑම රටකටම අපේ තේ අලෙවි කර ගැනීමට උත්සාහ කරන්න ඕනෑ. ඒ රටවලින් අපට වුවමනා ද්‍රව්‍ය ලබාගෙන අපේ තේ ඒ රටවලට දීමේ වැඩ පිළිවෙලක් හෝ ඇති කර ගන්න ඕනෑ. සමාජවාදී හෝ වේවා ධනවාදී හෝ වේවා ඕනෑම රටක් අපේ තේ ගන්නවා නම් අපි ඒ සමාජවාදී ධනවාදී භේද අමතකකර අපේ තේ අලෙවි කර ගන්න උත්සාහ කරන්න ඕනෑ. අපි එක පැත්තකට බර වෙලා සමාජවාදී රටවල් කොන් කරනව නම් අපේ තේ අලෙවි කර ගන්න පුළුවන් කමක් නැහැ. රුසියාව අපේ සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් අපට විශාල වශයෙන් උදව් කළ රටක්; අපේ සංවර්ධනය පිළිබඳ ලැදිකමක් ඇතිව කටයුතු කළ රටක්. ඒ රට අපේ තේ පිළිබඳව ලොකු සැලකිල්ලක් දක්වනව. ඒ රට වැනි රටවලටත් තේ විකිණීම පිළිබඳව රජය උනන්දුවක් දක්වුවොත් අපට මේ භයානක තත්ත්වයෙන් මිදෙන්නට පුළුවන් වෙයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඌව වැනි ප්‍රදේශවල සුළු තේ වතු හිමියෝ විශාල සංඛ්‍යාවක් සිටිනව. ඒ සුළු තේවතු හිමියන්ට ඔවුන්ගේ තේ වතු කෙසේවත් නඩත්තු කර ගන්නට බැරි තත්ත්වයක් අද ඇති වීම නිසා ඒ තේවතුවල කැලෑ වැවී තිබෙනව. ඒ නිසා සුළු තේ වතු හිමියන්ට රජයේ විශේෂ ආධාරය ලැබෙන්න ඕනෑ. සුළු තේ වතු හිමියන්ගේ තේවලට සහතික මිලක් දී ඔවුන් ධෛර්යමත් කරන්න ඕනෑ. ගරු අගමැතිතුමා ප්‍රකාශ කළා මේ රටේ තේවලට අනාගතයක් නැත කියා. එසේ ප්‍රකාශ කිරීමෙන් තේ වතු හිමියන්ගේ උනන්දුව නැති වෙනවා. ඒක ඇත්තයි. එවැනි වගකීමක් නැති ප්‍රකාශ කරන්නෙ නැතිව තේවලට අනාගතයක් තිබෙනවාය කියන හැඟීම ඔවුන් තුළ ඇති කළොත් පමණයි ඔවුන් උනන්දුවක් දක්වන්නෙ. තේ වගාව පිළිබඳව උනන්දුවක් දැක්වීම දැන් බොහෝ දුරට අඩු වෙලා තියෙනව. තේවල අනාගතය පිළිබඳව ස්ථිර බලාපොරොත්තුවක් ඇති කර සුළු තේ වතු හිමියන්ගේ තේවලට සහතික මිලක් නියම කර ක්‍රියා කළොත් තේ නිෂ්පාදනය වැඩි වෙනව. එය අපේ ආර්ථික තත්ත්වය දියුණු කර ගැනීමට ලොකු උදව්වක් වෙනව.

ගරු කෘෂිකර්ම ඇමතිතුමාගේ කථාවේදී සඳහන් කළා, මෙයින් සුළු තේ වතු හිමියන්ට ආධාර ලැබෙනවාය කියා. නමුත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මෙයිනුත් ඒ අයට සෑහෙන ආධාරයක් ලැබෙනවාය කියා අපට හිතන්න බැහැ. කවදත් මඩිය තර වෙන්නෙ ලොකු අයගෙ මයි. නමුත් අපි සුළු තේ වතු හිමියන් ආරක්ෂා කර ගන්න ඕනෑ.

අක්කර 3, 4 හිස් ඉඩම් තියෙන අය තේ වවන්නට උනන්දුවක් දක්වන්නෙ නැහැ. විශෙෂ අවසරයක් අරගෙන නීති රීති රාශියකට බැඳී ඒ කටයුත්ත කරන්නට සිදු වී තිබෙන නිසා. තමන්ගේ හිස් ඉඩම්වල තේ වැව්වොත් ඒක ලොකු වරදක්ය කියන හැඟීමක් සාමාන්‍ය මහජනයා අතර තියෙනවා. ඒ බය නැති කරල, වුවමනා නැති නීතිරීති අයින් කර දමා, අක්කර තුනේ හතරේ හිස් ඉඩම් තියෙන අයව උනන්දු කර වන්නඕනෑ, ඒ ඉඩම්වල තේ වැවීම සඳහා. එපමණක් නොවෙයි. ඌව ප්‍රදේශයෙ විශාල සමාගම්වලට අයිති හැම තේ වත්ත කම වගේ කිසිවක් නොවැවූ මුඩු ඉඩම් අක්කර තුන් හාර සියය බැගින් තිබෙනවා. වතු අයිතිකරුවන් ඒ මුඩු ඉඩම්වල කිසිවක් වවන්නෙ නැත්නම් ඒ ඉඩම් මහ ජනතාව අතර බෙදා දී—අක්කර හතර පහ බැගින් බෙදා දී—ඒ ඉඩම්වලත් තේ වගා කරවන්ට පුළුවන්. ඒ පිළිබඳවත් මා රජයේ සැලකිල්ල යොමු කරවනවා. නමුත් රජය මොන සැලකිල්ලක් දක්වාවිද කියා මා දන්නෙ නැහැ.

පැලවත්තෙ තත්ත්වය පිළිබඳව දත් බලපිටියේ ගරු මන්ත්‍රීතුමා සඳහන් කළා. පසුගිය දිනවල අපට අගලවත්ත යන්නට අවස්ථාවක් ලැබුණා. ඒ අවස්ථාවේදී පැල වත්තේ කණගාටුදායක තත්ත්වය අපට සියැසින්ම දක ගන්නට පුළුවන් වුණා. විශාල වියදමක් දරා හොඳම තේ වැවූ අක්කර පන්සියයක් පමණ නොසලකා හැර තිබෙනවා. දළු නොකැඩීම නිසා අද ඒ අක්කර පන්සියයක පමණ වත්ත කැලෑවක් වී තිබෙනවා. මේ වත්ත නිරාපරාදේ නාස්ති වී යනවා. මේකට හේතුව කුමක්ද කියා මා ටිකක් සොයා බැලුවා. රජය දන්වත් ඒ කාරණය පිළිබඳව දන්නවාද කියා මා දන්නෙ නැහැ. පැලවත්තෙ තේ වත්ත භාරව සිටින කළමනාකරු තේ වැවීම පිළිබඳ කිසිම අවබෝධයක් නොමැති පුද්ගලයකුය කියා මට දැනගන්නට ලැබුණා. පෞද්ගලික නෑදෑකම් උඩ යම් යම් පුද්ගලයින්ට රක්ෂාවල් සැපයීම නිසා විශාල වියදමක් දරා වගා කළ පැලවත්තේ තේ වගාව අද සම්පූර්ණයෙන්ම වැදගැන්මකට නැති තත්ත්වයකට පත්ව තිබෙනවා.

ඒ තේ වත්තෙ වැඩ කරන්ට කම්කරුවන් නැත කියා තර්කයක් ඉදිරිපත් කරනවා. කම්කරුවන් නැත්නම් අපි අපේ ප්‍රදේශවලින් කම්කරුවන් ඕනෑ තරම් දෙන්නම්. පැලවත්තෙ කම්කරුවන් නැති වුවාට අපේ ප්‍රදේශවල කම්කරුවන් ඕනෑ තරම් ඉන්නවා. වෙළඳ ඇමතිතුමාගෙ පාර්ලිමේන්තු ලේකම්තුමාත් ඒ බව දන්නවා. තේ දළු නෙළීමත් තේ වගාව පිළිබඳවත් හොඳට පළපුරුදුකම් තිබෙන අය අපේ ගම් ප්‍රදේශවල ඕනෑ තරම් ඉන්නවා. ඒ අයට කිසිම රැකීරක්ෂාවක් නැහැ. වෙන එකක් තබා අපි මෙතැන පාර්ලිමේන්තුවේදී පවා උද්ඝෝෂණයක් කළා, අපේ ප්‍රදේශවල මහජනතාවට රැකීරක්ෂා නැහැ, වටපිට තිබෙන වතුවල ඉන්නෙ ඉන්දියානු කම්කරුවන්, එම නිසා ඒ වතුවලට සියයට 50 ක්වත් සිංහල කම්කරුවන් ඇතුළු කරන්ටය කියා. ඒ අන්දමට අපේ ප්‍රදේශවල සිය ගණන් කම්කරුවන් රැකීරක්ෂා නැතිව ඉන්නවා. රජය මගින් හෝ රැකීරක්ෂා කාර්යාල මගින් හෝ උනන්දුවක් ගත්තොත් මේ කම්කරුවන් පැලවත්ත වැනි ප්‍රදේශවලට ගෙන්වා ගන්ට පුළුවන්. පැලවත්තට කම්කරුවන් නැත කියනවා නම් අපි දෙන්නම් ඕනෑ තරම් කම්කරුවන්. අපේ ප්‍රදේශවල කම්කරුවන් සිය ගණන් රක්ෂා සොයනවා. විශාල තේ වතු අවට වාසය කරන ඒ හැම දෙනාටම වගේ දළු නෙළීම ගැනත් තේ වගාව පිළිබඳ අනෙක් වැඩ ගැනත් හොඳට පළපුරුද්ද තිබෙනවා. රැකීරක්ෂා කාර්යාල මාර්ගයෙනුත් බැරි නම්, අපට කියන්න. අපි ඕනෑ තරම් කම්කරුවන් එවන්නම්. ඇයි මේ ගැන රජය සැලකිල්ලක් නොදක්වන්නෙ?

එහෙම නැත්නම් පැලවත්තට කම්කරුවන් ගෙන්වා ගතහැකි තවත් මාර්ගයක් තිබෙනවා. ඌව ප්‍රදේශයෙ වතුවල දැන් ඉන්දියානු කම්කරුවන් ලක්ෂ ගණන් සිටිනවා. ඒ එක වත්තකින් ඉන්දියානු කම්කරුවන් සියය හමාර බැගින් ගෙනැවිත් පැලවත්තෙ පදිංචි කරවුව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බී. එච්. බණ්ඩාර මයා.]

හොත් කරුණු දෙකක් ඉෂ්ට වෙනවා. එකක් ඌව ප්‍රදේශයෙ ඒ වතු අවට සිටින රක්ෂා නැති සිංහල කම්කරුවන් ඉන්දියානු කම්කරුවන් පැලවත්තට පිටත් කරවීම නිසා ඇතිවූ ඒ පුරප්පාඩු වලට බඳවා ගන්ට පුළුවන් වෙනවා. අනෙක පැලවත්තට කම්කරුවන් ලැබෙනවා.

කුමන ක්‍රමයකින් හෝ රජය පැල වත්තේ තේ වගාව යථා තත්ත්වයට පැමිණ විය යුතුයි. රටේ ජාතික ධනයෙන් විශාල මුදලක් මේ වත්තට යොදවා තිබෙනවා. නමුත් අද මේ වත්ත රටට වැඩක් නැති තත්ත්වයකට, රටට ශාප යක් වන තත්ත්වයකට, පත් වී තිබෙනවා. මා සඳහන් කරන අන්දමේ වැඩ පිළිවෙළක් අනුව කටයුතු කළා නම් සම හර විට මේ තත්ත්වය වළක්වා ගන්න තිබුණා.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
**(Mr. Deputy-Speaker)**

ගරු මන්ත්‍රීතුමා ටිකක් ඉක්මන් කළොත් හොඳයි. එකම කාරණය දෙතුන් වරක් කිව්වා.

**බී. එච්. බණ්ඩාර මයා.**
*(கௌரவ எம். டீ. பண்டார)*
**(Mr. B. H. Bandara)**

අවසාන වශයෙන් මා තවත් එක කාරණයක් මතක් කරනවා. පැලවත්තෙ තත්ත්වය ගැන අප කවුරුත් දන්නවා. සාවධානව අප ඉදිරිපත් කරන මේ කරුණුවලට ඇහුම්කන් දී යම් පිළියමක් කරන්න. පැලවත්ත නමුන්නාන්සෙලාගෙ පෞද්ගලික බූදලයක් නොවෙයි. මේ රටේ මුදල් ඒ වත්තට යොදවා තිබෙන්නෙ. දලු නොකැඩීම නිසා අක්කර පත් සියයක් පමණ විනාශ මුඛයට යනවා. මේ විනාශ වෙන්නෙ රටේ මුදල් නේද? නමුන්නාන්සේලාගේ පෞද්ගලික බූදල යක් නම් අපට කමක් නැහැ. නමුත් මේ මහජන මුදල්. ඒ නිසා අපට කැක්කුමක් තිබෙනවා. ඒ නිසා තමයි අපි මේ යෝජනා ඉදිරිපත් කරන්නෙ. කුමන පිළිවෙළකින් හෝ මේකට පිළියමක් කරන්න. කම්කරුවන් නැත්නම් අපි දෙන්නම්. මේවා කියන විටත් ටිකක් අමාරු ඇති.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා දීර්ඝ වශයෙන් කථා කරන්ට අදහස් කරන්නෙ නැහැ. තේ අපේ ප්‍රධාන ආදායම් මාර්ගයයි. අවසාන වශයෙන් මා තව එක් කාරණයයි මතක් කරන්නෙ. මේ උඩරට, මැදරට, පහත රට තේ යනුවෙන් තේ වර්ග කිරීම අවශ්‍ය නැහැ. වැඩි වශයෙන් හොඳ තේ වැවෙන්නෙ ඌව වැනි උඩරට ප්‍රදේශවල බව නමුන්නාන්සේ දන්නව ඇති. නුවරඑළිය වැනි ප්‍රදේශවල පොල් වැවෙන්නෙ නැහැ. ඒ නිසා දේශගුණය අනුව ඒ ඒ ප්‍රදේශවල වැවෙන දේ ඒ ඒ ප්‍රදේශවල වවමු. යම් පළාතක තේ වැවෙන්නෙ නැත්නම් ඒ පළාතේ පොල් වවමු. පොල් වැවෙන්නෙ නැති පළාත් වල තේ වවමු. ඒ ඒ ප්‍රදේශ වලට සුදුසු දේවල් වවමු. යම්කිසි වැවිල්ලක් සඳහා පෞද්ගලික සම්බන්ධකම් අනුව ප්‍රදේශ තෝරා ගන්නෙ නැතිව එම වැවිල්ලට සුදුසු ප්‍රදේශයන් ඒ සඳහා තෝරා ගනිමු. ඒ නිසා උඩරට, මැදරට, පහත රට යනුවෙන් භේදයක් ඇති නොකර රසවත් හොඳ තේ වැවෙන ප්‍රදේශ වල තේ වවමු. අනිකුත් ප්‍රදේශවල ඒ ඒ ප්‍රදේශවලට ගැළපෙන වැවිලි ඇති කරමු.

තත්ත්වය මේ විධියට පැවතුණොත් වැඩි කල් යන්නට මත්තෙන් මේ රට බංකොලොත් වෙනවා. මේ රටේ හපන් කම් ඔක්කොම රඳා පවතින්නෙ තේ මතයි. මේ විධියට තේ මිල පහත වැටී අපේ විදේශ විනිමය හීනවී ගියොත් දැනට දෙන හාල් සේරුවවත් දෙන්නට නමුන්නාන්සේලාට පුළුවන් වන්නෙ නැහැ. තුනපහ ටිකත් නැතිව යාවි. ඒ නිසා ශීඝ්‍රයෙන් පහත බසින තේ මිල වැඩි කර ගැනීම සඳහා ප්‍රචාරක කටයුතු දියුණු කරන අතරම සමාජවාදී ධනවාදී වශයෙන් පන්ති භේදයක් නැතිව හැම රටකටම අපේ තේ විකුණන්නට උත්සාහ ගනිමින් අපේ රටේ ආර්ථික තත්ත්වය නඟා සිටුවීමට ක්‍රියා කරන හැටියට ඉල්ලමින් මගේ වචන සවල්පය අවසාන කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල: තේ අපනයන තීරු ප්‍රතිදාන යෝජනා ක්‍රමය

පූ. භා. 11.22

**වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ (අකුරැස්ස)**

*(டொக்டர் எஸ். ஏ. விக்கிரமசிங்ஹ—அக்குறஸ்ஸ)*

**(Dr. S. A. Wickremasinghe—Akuressa)**

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවස්ථාවේ දීර්ඝ කථාවක් පැවැත්වීමට මා බලාපොරොත්තු වන්නෙ නැහැ. තේ මිළ පහත බැසීම නිසා ආර්ථික වශයෙන් ඉතා භයානක තත්ත්වයකට මුහුණපාන්නට අද අපට සිදු වී තිබෙනව. විශේෂයෙන්ම පහත රට හා මැද රට තේ වල මිළ භයානක අන්දමින් පහත බැස තිබීම නිසා ලක්ෂ ගණනකට රක්ෂා නැතිවීමේ තර්ජනයකටත් අද මේ රට මුහුණ පා සිටින බව අපි පිළිගන්නට ඕනෑ. ඒ නිසා ඒ පිළිබඳව ගන්නා තාවකාලික පිළියමකට විරුද්ධ පාර්ශ්වයේ සම්පූර්ණ සහයෝගය ආණ්ඩුවට ලැබෙන බව මෙතෙක් කෙරුණ කථා වලින් පැහැදිලි වුණා. එමෙන්ම මේ වැඩ පිළිවෙළට ගැබ් වී ඇති අසතුටුදායක තත්ත්වයන් කීපයක් සම්බන්ධවත් විරුද්ධ පාර්ශ්වයේ හා ආණ්ඩු පක්ෂයේ කථිකයින්ගෙන් කියැවුණා. විශේෂයෙන්ම මේ සහනාධාර නොලැබිය යුතු අයටත් මෙතෙක් කල් ලැබී තිබෙන බව සඳහන් වුණා. විශාල ධනපතීන්, තේ නිෂ්පාදනයේ නොයෙදෙන වෙළෙඳුන් හා බ්‍රෝකර් වරුන් වැනි අයටත් වංචාසහගතව ඒ මුදල ලබා ගන්නට පුළුවන් විධියට ඒ වැඩ පිළිවෙළ සකස් වී තිබුණා. ඇත්වත් ඒ වැඩ පිළිවෙළ වෙනස් කිරීමට රජය සූදානම් ද කියා මා අහනව. එසේ නොකරනවා නම් ඒ මැද සිටින බ්‍රෝකර් වරුන්ට යට වී මේ රජය කටයුතු කරනවා යයි අපට සැක කරන්න ඉඩ තිබෙනව.

මේ ප්‍රශ්නය සම්බන්ධව ක්ෂණික ප්‍රතිකර්මයක් යෙදීමට මේ යෝජනාව ඉදිරිපත් කර තිබෙන බව ප්‍රකාශ කරන අතරම තේ කර්මාන්තයේ අනාගතය ගැනත් ගරු අගමැතිතුමා ප්‍රකාශයක් කර තිබෙනව. ඒ ප්‍රකාශය සම්බන්ධව වචනයක් දෙකක් සඳහන් කිරීම මගේ යුතුකමක් හැටියට මා සලකනව. ආණ්ඩු පක්ෂයේ ප්‍රධානියා හැටියට ගරු අගමැතිවරයා වග කීමෙන් තොර ප්‍රකාශයක් කර තිබෙනව. ලෝක බැංකුවේ මග පෙන්වීම අනුව 1956 වන තුරු මේ ආණ්ඩුව ගෙනගිය ප්‍රතිපත්තිය නම්, ලංකාව කාර්මික රටක් වශයෙන් නම් දියුණු වන්නෙ නැත, ලංකාවේ අනාගතය රැඳී ඇත්තේ තේ හා රබර් කර්මාන්තය උඩය, ඒ නිසා එය දියුණු කළ යුතුය කියන එකයි. එක්සත් ජාතික පක්ෂය අධිරාජ්‍යවාදී ආණ්ඩු සමග එක් වී, ලෝක බැංකුවේ මගපෙන්වීම යටතේ, මේ රටේ මූලික කර්මාන්තය තේ කර්මාන්තයය, මේ රටේ අනාගතය රැඳී ඇත්තේ තේ කර්මාන්තය මතය යන්න තහවුරු කරගෙන සිටියා. ඒ අදහස කොයි තරම් දුරට බල පැවැදැයි කියතොත් 1956ට මත්තෙන්, සර් ජෝන් කොතලාවල රට පාලනය කළ කාලයෙදි, මේ රටේ පැවැති රැකීරක්ෂා හිඟය නැති කොට ආර්ථික සංවර්ධනයක් ඇති කරන්නට ඕනෑය කියා ඒ සඳහා අක්කර දස දහස් ගණනින් තේ වැවීමට මුදල් වැය කළ යුතුය යන තීරණයක් අරගෙන එය ක්‍රියාවේ යොදවන්නට 1954, 1955 පමණ කාලවලදී කටයුතු කරගෙන ගියා.

රටේ සම්පූර්ණ ආර්ථික ශක්තියම එක වැවිල්ලකට පමණක් යෙදවීම සඳහා ලෝක බැංකුවට වාල් වී ගත් ඒ අධිරාජ්‍යවාදී පියවර, 1956 දී මේ රටේ ඇති වුණු විපර්යාසය නිසා නතර කරන්නට පුළුවන් වීමෙන්, තේ වගාව පමණක් දියුණු කිරීමේ ඒ වැඩ පිළිවෙළ නතර වුණා. 1956 වනතුරු මේ රටේ ආර්ථික සැලැස්ම, ආර්ථික හැඩ ගැස්ම සම්පූර්ණයෙන්ම ඇති වී තිබුණේ ආහාර නිෂ්පාදනය උඩ නොව, වැවිලි කර්මාන්තයත් අපනයන ද්‍රව්‍ය නිපදවීමත් උඩයි. නිදහස් ආර්ථික සැලැස්මක් ඇති කර ගන්නට බැරිව මෙපමණ කල් කටයුතු කළ මේ ආණ්ඩුව අද, 1956 ට පෙර තිබුණු තත්ත්වය ගැන කල්පනා නොකර, මහදැනමුත්තන් වගේ, "අපේ රටේ තේ කර්මාන්තයට අනාගතයක් නැති නිසා වෙනත් වැවිල්ලක් සඳහා කටයුතු යොදන්නට ඕනෑ" යි කියනව. මේ රටේ ආර්ථික ප්‍රශ්න සම්බන්ධයෙන් ලෝක බැංකු විශෙෂඥයින් ගණනාවකගෙන් අවවාද ලබාගෙන අදත් මේ රජය කටයුතු කරන්නෙ ලෝක බැංකුවට වාල් වුණු තත්ත්වය කිනුයි. මේ රටේ සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් මේ රජය වැඩ කරන්නෙත් ලෝක බැංකුව කියන හැටියටයි. මේ රටේ ආර්ථික කටයුතු සම්බන්ධයෙන් 1966 දී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය එස්. ඒ. වික්‍රමසිංහ]

ලෝක බැංකු වාර්තාවෙහි සඳහන් වී තිබෙන කරුණක් කෙටියෙන් පෙන්වා දෙන්නට මම අදහස් කරනව:

"*Foreign Exchange Problem of Ceylon—October, 1966 Growth prospects.*

Ceylon is not among the group of developing countries with natural resources that await exploitation.

Obstacle to growth, lack of investment, shortage of managerial, technical experience. Poor opportunities. Ready to be exploited. Scope for industries limited by small size of domestic markets etc."

දීර්ඝ වශයෙන් මේව කියන්නට මම බලා පොරොත්තු වන්නෙ නෑ. මේ වාර්තාවෙන් කියැවෙන්නෙ, අමු ද්‍රව්‍ය නැති නිසාත් වෙළඳ පොළක් නැති නිසාත් රට පොඩි නිසාත් ලංකාව කාර්මික වශයෙන් දියුණු කරන්නට පුළුවන් රටක් නොවන බවයි. අනාගතයක් තිබෙන්නෙ වැවිලි කර්මාන්තයට පමණක් බවයි මෙහි කියා තිබෙන්නෙ. මෙම වාර්තාව පිළිගත් ලකුණු පෙන්වන මේ රජය නිදහස් ආර්ථික සංවර්ධනයක් සඳහා කාර්මික දියුණුවක් ඇති කිරීමට කටයුතු නොකර, තේ වගාවටත් අනාගතයක් නැතැයි කියමින් වෙනත් වැවිල්ලක් යොදා ගන්නට උත්සාහ කරනව. මේ නිසා අද මේ ආණ්ඩුව ඉතාමත් පරාජිත තත්ත්වයකට වැටී සිටිනව. අධිරාජ්‍යවාදී ධනපති රටවල බල පෑමට යටත් වී ඒවා සමග සම්බන්ධකම් පවත්වන තුරු මේ රටේ තේ කර්මාන්තයට අනාගතයක් නැති බව අපිත් පිළිගන්නව. තේ කර්මාන්තය සංවර්ධනය කිරීමට වඩා, ආහාර නිෂ්පාදනයට අපේ හැකියාවන් හා වැඩිපුර ප්‍රයත්නයක් යෙදවිය යුතු බව පැහැදිලි වශයෙන්ම අපි පිළිගන්නව. තේ ප්‍රශ්නය සම්බන්ධයෙන් මේ තරම් උග්‍ර තත්ත්වයක් ඇති වී තිබෙන්නෙ එහි මිළ පහත බැසීම නිසයි.

තවදුරටත් යටත් විජිතවාදය රැක ගැනීමේ ආසාවක් ඇතිව සිටින පත් කළ ගරු මන්ත්‍රී සිංගල්ටන් සැමන් මහත්මයා මේ සම්බන්ධයෙන් අපට අවවාද කරමින්, ලංකාවෙන් තේ ලබා ගන්නා ලෙස සමාජවාදී රටවලට කියයුතු යයි ප්‍රකාශ කරනව.

අපනයන ද්‍රව්‍යවල මිල නිසි තත්ත්වයට ගෙන ඒම සඳහා සමාජවාදී රටවල් සමග ගනුදෙණු කළයුතුයි. මේ ආණ්ඩුව බලයට පත් වූ නිසයි එය කළ නොහැකිව තිබෙන්නෙ. මේ රටේ තේ කර්මාන්තය නගා සිටුවන්ට නම් මෙම ආණ්ඩුව නැති වෙන්ට ඕනෑ. අපි දන්නව ක්‍යුබාවෙ ආර්ථික තත්ත්වය රඳා තිබුණෙ එක් වැවිල්ලක් උඩ බව. එනම් උක් වගාවයි. එම වැවිල්ල නිසා ඇති වුණු සීනි කර්මාන්තයෙන් ඒ රට දියුණු වුණා. නමුත් ඒ රට නිදහස් වුණත් සමගම අධිරාජ්‍යවාදී රටවල් එකතු වී ඒ රට බංකොලොත් කිරීම උදෙසා ගෙන ගිය ප්‍රතිපත්තිය කුමක්ද? අමෙරිකාවට ඒ රටේ සීනි නින්න වෙන්ට පටන් ගත්ත. ඒ රටේ සීනි ලබා ගැනීම සම්පූර්ණයෙන් තහනම් කරන්ට අමෙරිකාව කල්පනා කළා. නමුත් සෝවියට් දේශය ඒ රටෙන් සාධාරණ මිලකට සීනි ගන්ට ඉදිරිපත් වුණේ ඒ රටේ ආර්ථික තත්ත්වය ඇද වැටෙන්ට ඉඩ නොදී රඳා තබා ගැනීමටයි. සෝවියට් දේශයට වුවමනා තරම සීනි තිබුණේවී නමුත් අර අන්දමට සීනි ලබා ගැනීමෙන් ඒ රටට සම්පූර්ණ වශයෙන් ආධාරයක් දුන්න. ඒ හුවමාරු වෙළඳාම අනුව එම රට දියුණුවට පත් වුණා. එම රටට වුවමනා කරන යන්ත්‍ර සූත්‍ර, අමු ද්‍රව්‍ය යනාදිය සෝවියට් දේශයෙන් ලබා ගන්ට හැකි වුණා.

ඒ වගේම අද මැද පෙරදිග රට වලත් ඉතා භයානක තත්ත්වයක් ඇති වී තිබෙනව. අපි දන්නව ඊශ්‍රායලය සිරියාවට පහර ගැසීම උඩ භයානක තත්ත්වයක් ඇති වී තිබෙන බව. ලංකාවෙ මැදරටේ සහ පහත රටේ තේ මැද පෙරදිග රටවලට වෙළඳාම් කිරීම නිසයි තේවල මිල සම්බන්ධයෙන් සතුටුදායක තත්ත්වයක් පැවතුණේ. නමුත් ඒ රටවලට අද අධිරාජ්‍යවාදී ආණ්ඩුවලින් කරන බලපෑම් නිසා අද එම රටවල තිබෙන අපේ තේ වෙළඳ පොළවල් පවා සම්පූර්ණයෙන්ම විනාශ වෙලා. ඊශ්‍රායලය කියන්නෙ පොඩි රටක්. ඒ රට අද සිරියාවට තර්ජනය කරන තත්ත්වයකට පත් වෙලා. එහෙයින් අද මැද පෙරදිග රටවල් සද්ද වශයෙන් යුද්ධයක් කිරීමට පෙළඹී සිටින්නෙ මුළු අරාබි ජාතීන් ප්‍රවේසම් කර ගැනීම පිණිසයි. මුළු අරාබි ලෝකයම අද

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල: තේ අපනයන තිරු ප්‍රතිදාන යෝජනා ක්‍රමය

ඊශ්‍රායලයට විරුද්ධව එකා වාගෙ නැගී සිටිනවා. ලංකාව ඒ රටවල් විරුද්ධ කර ගෙන සිටිනවා. අධිරාජ්‍යවාදීන්ට ගැතිකම් කරමින් ඒ රටවලට ද්‍රෝහිකම් කරන පොඩි රටකට දක්වන සැලකිල්ල නිසා ඒ රටවල් සමග තිබෙන මිත්‍ර සම්බන්ධකම් සම්පූර්ණයෙන්ම විනාශ කර ගෙන සිටිනවා. දන් ඒ රටවල් සමග තේ වෙළඳාම් කිරීමට බැරි තත්ත්වයක් ඇති වී තිබෙනවා. එනිසා ඉන්දුනීසියාවට ප්‍රයෝජන ලැබෙනවා. ඊජිප්තුව, එක්සත් අරාබි ජනරජය, ඇල්ජීරියාව සහ සිරියාව ආදී රටවල ආර්ථික තත්ත්වයන්ට හානිකර වන පරිදි අධිරාජ්‍යවාදී ආණ්ඩු ක්‍රියා කරගෙන යන නිසා එවැනි රටවලට විශෙෂ ආධාර දීමට සමාජවාදී රටවල් සූදානමින් සිටිනවා. අපේ රටේ නිපදවන ද්‍රව්‍ය වැඩි මිලකට ලබා ගනිමින් අපට විශාල වශයෙන් උදව් කරන්ට ඒ රටවලට අමාරුවක් වී තිබෙන්නේ එවැනි රටවලටද ආධාර කරන්ට වුවමනා කරන නිසයි.

එම නිසා ඊට ප්‍රතිකර්මයක් වශයෙන් අප විසින් කළ යුතුව තිබෙන්නෙ සමාජවාදී රාජ්‍යයන් සමග එකතු වන අතර මැද පෙරදිග අරාබි රටවල් සමග මිත්‍ර සම්බන්ධකම් ඇති කරගෙන මේ රට කාර්මික රටක් හැටියට දියුණු කිරීමට දූරදර්ශී වැඩ පිළිවෙළක් යෙදවීමයි. එවිට හදිසියේ තේ මිළ පහත වැටුණත් අපට උහුලන්ට පුළුවන් තත්ත්වයක් ඇති වෙනවා. මේ රට කාර්මික වශයෙන් දියුණු කළ හැකි බවට සමාජවාදී රටවල සකස් කර තිබෙන වාතීං ක්‍රියාවේ යෙදවීමට නම් දැන් තිබෙන මේ ආණ්ඩුව පෙරළා දමන්න ඕනැ. ඒ අතරම පහත රට හා මැද රට ජනතාවගේ ප්‍රධාන කර්මාන්තය වන තේ කර්මාන්තය නගා සිටුවීමට කරන පිළියමක් විශයෙන් දෙනු ලබන මේ ආධාර මුදල විශාල ධනවතුන්ටත් බෙදී යන අන්දමට කට යුතු නොකළ යුතුයි. සුළු තේ වතු හිමියන්ට හා කුඩා තේ කර්මාන්තශාලා හිමියන්ට මේ ආධාර මුදල් ලැබෙන අන්දමේ වැඩ පිළිවෙළක් ක්‍රියවේ යෙදිය යුතුව තිබෙනවා.

පහත රට තේ කර්මාන්තය විශාල වශයෙන් සුළු තේවතු හිමියන් අතෙයි තිබෙන්නෙ. උඩරට ප්‍රදේශයේ තමයි, අක්කර දහස් ගණන් විශාල විදේශීය සමාගම්වලට අයිති තේ වතු තිබෙන්නෙ. සුළු තේ වතු හිමියන් හා සුළු තේවතුවල දළු සකස් කරන කුඩා තේ කර්මාන්තශාලා හිමියනුත් විශාල වශයෙන් සිටින්නෙ පහත රටයි. එම නිසා සාමාන්‍ය දුප්පත් ලාංකික ජනතාවට පිහිටවීමට සකස් කර තිබෙන මේ වැඩ පිළිවෙළින් ඔවුන්ට පමණක් ආධාර ලබා දීමට ක්‍රියා කළ යුතුයි. ඒ වගේම විශාල ධනවතුන්ගේ තේවතු ආණ්ඩුවේ පාලනයට ගැනීමටත් ඒ මගින් කර්මාන්තය සම්පූර්ණයෙන් නගා සිටුවීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාවේ යෙදවීමටත් දේශපාලන වශයෙනුත් යම් ක්‍රියා මාර්ගයක් ගත යුතුයි.

අධිරාජ්‍යවාදී ආණ්ඩු සමග එකතු වී අපේ තේ කර්මාන්තය පහත දැමීමට කටයුතු කළ මේ ආණ්ඩුව පෙරළා දමා අපේ තේ කර්මාන්තය පමණක් නොව අනිකුත් නව කර්මාන්තද සමාජවාදී රටවල පිහිටෙන් සංවර්ධනය කිරීමේ වැඩ පිළිවෙළ විරුද්ධ පාර්ශ්වය ඉතා ඉක්මනින් ඉටු කරන බව අවසාන වශයෙන් ප්‍රකාශ කරමින් මගේ කථාව මෙයින් අවසාන කරනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**

*(உப சபாநாயகர் அவர்கள்)*

(Mr. Deputy Speaker)

After the hon. Member for Kolonnawa (Mr. Ilangaratne) I shall call upon the Hon. Minister to reply.

පූ. භා. 11.38

**ඉලංගරත්න මයා.**

*(திரு. இலங்கரத்ன)*

(Mr. Ilangaratne)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ශීර්ෂය යටතේ වචන ස්වල්පයක් කථා කරන්ට මම ද අදහස් කරනවා. මේ අවස්ථාවේ පත් කරන ලද මන්ත්‍රී සිංගල්ටන්-සැමන් මහත්මයා මේ සථානයේ සිටීම ගැන සන්තෝෂ වෙනවා. බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් විසින් අපේ තේ විශාල ප්‍රමාණයක් මිළදී ගන්නා බවත්, අපේ තේ මිළදී ගැනීමට වෙනත් රටවල් එතරම් උනන්දුවක් නොදක්වන බවත් එතුමාගේ කථාවේදී සඳහන් වුණා. මා අහන්ට කැමතියි, බ්‍රිතාන්‍යය අපේ තේ ගන්ට උනන්දුවක් නොදක්වනවා නම්, උනන්දුවක් දැක්විය යුත්තේ වෙන කවුද කියා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

ලංකාවේ තිබෙන තේවතු වලින් විශාල සංඛ්‍යාවක් හිමි අය බොහොම දෙනෙක් සිටින්නෙ බ්‍රිතාන්‍යයෙයි. තේ කර්මාන්ත ශාලා තිබෙන්නේ ඒ උදවියගේ භාරයේ යි. අපේ නුවරඑළියේ මන්ත්‍රීතුමාට (රණවීර මයා.) එහෙමත් ටිකක් තිබෙනව. එහෙත් පොදු වශයෙන් බැලුවාම විශාල වශයෙන් තේවතු තිබෙන්නෙත්, තේ පැක්ටරි හිමිව තිබෙන්නෙත්, බ්‍රිතාන්‍යයන්ටයි. තේ වෙළඳාම කරන්නෙත්, තේ නැව්වල පැටවීම කරන්නෙත් ඒ උදවියම නම්, ඒගොල්ල අපේ තේ බීමෙන් කරන්නෙ අපට විශාල සහයෝගයක් දීම නොවෙයි. තමන්ගේ ඒව පරිහරණය කරල ඒවායින් තමනුත් ප්‍රයෝජනයක් ලබාගෙන වවන රටටත් එක්තරා සහනයක් ලැබෙන්නට සැලැස්වීම ඒ අයිතිකාරයින්ගෙ යුතුකමක්.

මේ යුතුකම එසේ මෙසේ එකක් නොවෙයි. මුදල් ඇමතිවරුන්ගේ සම්මේලනයට යන අවස්ථාවේදී ලන්ඩන් නුවරදී මට පෙනී ගියා, මේගොල්ලන්ගේ මේ ඇල කොයිතරම් පළල් එකක්ද යන බව. අපි ඉන්ෂුවරන්ස් සමාගම සහ පෙට්රල් ජනසතු කළාට පසු බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදී ඒ ධනපති උදවිය විශාල උද්ඝෝෂණයක් ඒ රටේ ගෙන ගිය බව තමුන්නාන්සේ දන්නවා ඇති. ඒ කාලයේ අපි යන කොට ඒ රටේ තිබුණේ "කොන්සැවෙටිව්" ආණ්ඩුවක්. ගරු ඇමතිතුමා ඒ අයට මාව හම්බ වෙන්න කියා නොයෙක් විධියට අවස්ථා සැලැස්සුවා. එවැනි නොයෙක් අවස්ථාවලදී සිදු වී තිබෙන දේවල් මට දැනගන්ට ලැබුණා. මට මතක් වෙනවා ඔය ඉන්ෂුවරන්ස් කොම්පැනිකාරයින් පැමිණ මොන මොන විධියටද තරවටු කළේ කියන එක. ඒ උදවිය අපට කියන්න පටන් ගත්තෙ මොකක්ද? මොකක්ද මේ උඹලා කරන්න හදන්නෙ කියල ඇහැව්ව. මොකක්ද උඹලා ඔය කරන්න යන වැඩේ තේරුම කියල ඇහැව්ව. යම් කිසි විධියකින් අපි උඹලගෙ තේ නොබී අත් හැරියොත් උඹලට මොකද සිද්ධ වෙන්නෙ කියල ඇහැව්ව. නැවතත් වරක් ඔය ඉන්ෂුවරන්ස් කොම්පැනි අපට ආපසු දෙන්න සිද්ධ වෙනව නේද කියල ඇහැව්ව. එපමණක් නොවෙයි, උඹලගෙ ආණ්ඩුවට ඊට පස්සෙ අපි කියන හැටියටම කටයුතු කරන්නත් සිද්ධ වෙන්නෙ නැද්දැයි ඇහැව්වා. මෙයින් පෙනී යන්නෙ මොකක්ද? ආර්ථික ප්‍රශ්න සහ දේශපාලන ප්‍රශ්න කොයි තරම් දුරට නෑකම් ඇතිව පවතිනවද යන්න එයින් හොඳටම පැහැදිලිව පෙනී ගියා.

ඒ විධියට ප්‍රශ්න කළ පුද්ගලයින්ට පිළිතුරු වශයෙන් මට කියන්න සිද්ධ වුණේ මෙන්න මෙහෙමයි: උඹලගෙ රටේ ඉන්න මිනිසුන් විසින්, ඔවුන්ගෙ නියමයන් අනුව, ඔවුන් විසින් යොදවන ලද පැක්ටරිවල නිෂ්පාදනය කළ තේ උඹලගෙම නැව්වලින් පිට රටවලට පටවනව. ඒ තේ උඹලම ගන්නෙ නැත්නම් අපට කරන්න සිද්ධ වෙන්නේ තේ වගා කිරීම, තේ වතු පාලනය කිරීම, තේ පැක්ටරි ක්‍රියා කරවීම, තේ ඉඩම් ඇති ප්‍රදේශ තුළ ගමනාගමනය යනාදී හැම එකක්ම සම්බන්ධයෙන් වෙනත් වැඩ පිළිවෙළක් සකස් කරන්නටයි. ඒ හැම එකක්ම එතකොට අපට කරන්නයි සිද්ධ වන්නෙ කියා මා කිව්වා. මේ විධියට ඔවුන්ගේ තරවටුවලට මෙහෙන් තරවටුව ගියාම— අප තරවටු කළාම— ඒ උදවිය කරබාගෙන යන්න ගියා.

අද වෙලා තියෙන්නෙ මොකක්ද? අද තිබෙන තත්ත්වය දේශපාලනය අතින් මේ ආණ්ඩුව සම්පූර්ණයෙන්ම ගැතිවෙලා ඉන්න එකයි. මේ විධියට බලන විට අද තිබෙන්නෙ ආර්ථික ස්වාධිනත්වයක් දේශපාලනය අතින් නැතිකමයි. අද ලෝක බැංකුව කියන හැටියටත්, අන්තර් ජාතික ණය මණ්ඩලය කියන හැටියටත් තමයි මේ ආණ්ඩුව වැඩ කරන්නෙ. මේ අන්දමට, ඒ අය සතුටු කිරීමට පමණක් අපේ ආර්ථික ප්‍රශ්න විසඳන්න ගියොත් ජාතික ස්වාධීනත්වයක් අපට නම් කවදාවත් ලබා ගන්න බැහැ.

මා කියන්න උත්සාහ කළේ මෙයයි: අපේ පත් කරන ලද ගරු මන්ත්‍රීතුමා විසින් කියන්නට යෙදුණා තේ විශාල තොගයක් ලංකාවෙන් බ්‍රිතාන්‍යය ගෙන්වා ගන්නවය; ඒ වුණාට ඒ වගේම අනෙක් රටවල් තේ ගෙන්වා ගන්නෙ නැත්තෙ ඇයිදැයි දන්නෙ නැත, යනුවෙන්. මා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එක් කරුණක් පෙන්වා දෙන්න කැමතියි. 1965 සහ 1966 යන අවුරුදු දෙකේදී ලංකාවෙන් බ්‍රිතාන්‍යයට යවා තිබෙන තේ ප්‍රමාණයන් ගැන බලන්න. 1965 දී තේ රාත්තල් දහ හත් කෝටි පණස් පන් ලක්ෂ අසූදහක් යවා තිබෙනවා. ඒ ගණන රාත්තල් දහස් ගණනිනුයි. ඔය කියන ගණන 1966 දී පහළොස් කෝටි පණස් හය දාහකට බැහැලා තියෙනවා. ඒ වගේම අනෙක් ඉලක්කම් දෙස බැලුවොත් තවත් ලක්ෂණ දේවල් පෙනේවි. නොයෙක් රටවලින් ගෙන්වා ගන්න තේ ඒ රටින් වෙන රටවලට යවනවා—අපනයනය කරනවා. ලංකාවෙන් බ්‍රිතාන්‍යය 1966දී තේ රාත්තල් දහස් ගණනින් පහළොස් කෝටි පණස් හය දාස් තුන්සිය අසූවක් ගෙන්වාගෙන තිබෙනවා. ඒ අවුරුද්දෙ අපේ රටෙන් පිටරට යවා තිබෙන තේ ප්‍රමාණය රාත්තල් දහස් ගණනින් හතළිස් හතර කෝටි දහ අට ලක්ෂ පණස් නවදාහක් වෙනවා.

දැන් චෝදනාවක් කර තිබෙනවා. මොකක්ද ඒ චෝදනාව? මේ ගරු සභාවේ දී කර තිබෙන ඒ චෝදනාව නම් යුගොස්ලේවියාව ආදි රටවලට ගන්න තේ වෙනත් රටවලට නැවත වරක් අපනයනය කරනවය යන්නයි. බ්‍රිතාන්‍යයෙහි කෙරෙන්නෙත් ඒකමයි. යුගෝස්ලේවියාව කරන දේ හරියයි මා කියන්නෙ නැහැ. අප තේ විකුණන රටවලින් වෙනත් රටවලට තේ විකුණන්ට ඉඩ තබනවා නම් ඒක සමහර විට අපේ දුර්වලකමක්. අපේ තේ වුවමනා කරන රටවල් සමග ගිවිසුම් ඇති කරගෙන උඹලගේ දේවල් තිබෙනවා නම් ඒවා අපට විකුණන්න, අපේ තේ අපි දෙන්නෙමුයි කීවොත් ඒ අය කැමති වේවි. යුගෝස්ලේවියාව ආදි රටවල් අපෙන් තේ අරන් ඒ සඳහා රන් පවුම්වලින් ගෙවනවා වෙනුවට අපට ඒ අය නිෂ්පාදනය කරන බඩු වලට හුවමාරු කර ගැනීමට කැමති වේවි.

බ්‍රිතාන්‍යය අපෙන් තේ ගන්නේ තමන්ගේම පාවිච්චිය සඳහා නොවෙයි. අපෙන් ගන්නා තේ පිටරට යවා රන්පවුම් උපයා ගන්නටත් ක්‍රියා කරනවා. ලංකාවේ තේ මුළු ලෝකයේම ප්‍රසිද්ධයි. එය කවුරුනුත් දන්නා කාරණයක්. මොන ගොඩු තේ වුණත් විකුණන්නේ ලංකාවේ තේ නමිනුයි. ලංකාවෙන් ගෙන යන තේ රාත්තල් පහළොස් කෝටි පණස්හය දහස් ගණනට බ්‍රිතාන්‍යය කරන්නේ කුමක්ද? ඒවා වෙනත් බාල තේ වර්ගවලට මිශ්‍ර කර තමන්ට වුවමනා විධියට රන් පවුම්වලට විකිණීමයි. මේ වැඩේ වැරදි යයි අප කියන්නේ නැහැ. නමුත් මෙසේ කරන බව කියා, අනෙක් රටවලට දොස් නොපවරා, පුළුවන් නම් එහිදී කරන එක මෙහි දී කරන්නට වැඩ ආරම්භ කළ යුතුයි. බ්‍රිතාන්‍ය වතු හිමියන් මෙහි සිටිනවා නම්, ඒ වගේම බ්‍රිතාන්‍ය කොම්පැනි මෙහි තිබෙනවා නම් කළ යුතුව ඇත්තේ ඒකයි. මේ විධියට පිටරටින් තේ ගෙන්වා අපේ රටේ තේ සමග මිශ්‍ර කොට නැවත පිටරට යැව්වොත් ඒ මගින් අපට වැඩිපුර විදේශ විනිමය ලබා ගන්නට පුළුවන් වෙනවා ඇති.

අද අපේ තේ පිටරට යවන ප්‍රමාණය අඩු වෙමින් පවතිනවා. ඒ වගේම තේ මිළද අඩු වෙමින් පවතිනවා. මෙතැන ප්‍රශ්න දෙකක් තිබෙනවා. පසුගිය අවුරුදු කීපය තුළදී අප පිටරට යැවූ තේ රාත්තල් ප්‍රමාණය ගැන දැන ගැනීම සඳහා මෙම ඉලක්කම් දෙස බලමු.

| | | |
|---|---|---|
| 1962 දී | දස කෝටි | 452 යි |
| 1963 දී | ,, | 456 යි |
| 1964 දී | ,, | 456 යි |
| 1965 දී | ,, | 495 යි |
| 1966 දී | ,, | 441 යි |

ඉතින් 1962 දී රාත්තල් දස කෝටි 452 ක් පිටරට යැවූවත් 1966 දී එය දස කෝටි 411 දක්වා අඩු වී තිබෙනවා. ඊළඟට දස ලක්ෂවලින් මේවායේ වටිනාකම බලමු.

| | | |
|---|---|---|
| 1962 දී | දස ලක්ෂ | 1149 යි |
| 1963 දී | ,, | 1140 යි |
| 1964 දී | ,, | 1142 යි |
| 1965 දී | ,, | 1110 යි |
| 1966 දී | ,, | 1027 යි |

අපට ලැබෙන ආදායම පහළ බැස ඇති ආකාරය මෙයින් පේනවා. එතකොට අප පිටරට යවන තේ ප්‍රමාණය පහළ බසිනවා වාගේම අපට ලැබෙන ආදායමත් පහළ බසිනවා. වටිනාකම පහළ බැස ඇත්තේ කොයි අන්දමටද කියා පහත

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල: තේ අපනයන නිරු ප්‍රතිදාන යෝජනා ක්‍රමය

[ඉලංගරත්න මයා.]

පෙනෙන ඉලක්කම්වලින් බලා ගන්නට පුළුවනි. මේ ඉදිරිපත් කරන්නේ ඒ ඒ වර්ෂයේදී තේ රාත්තලක මිළයි:

| | | |
|---|---|---|
| 1960 දී | ... | රු. 2.67 යි |
| 1961 දී | ... | රු. 2.62 යි |
| 1962 දී | ... | රු. 2.54 යි |
| 1963 දී | ... | රු. 2.50 යි |
| 1964 දී | ... | රු. 2.51 යි |
| 1965 දී | ... | රු. 2.45 යි |
| 1966 දී | ... | රු. 2.33 යි |

මෙසේ වන්නට කාරණය මොකක්ද? මම කියන්නම්. මේ මා අතේ තිබෙන "ඉන්ඩස්ට්‍රියල් සිලෝන්" නමැති පොත සකස් කරනු ලැබ තිබෙන්නේ මෙම ආණ්ඩුවේ සහචරයන් හා සහකාරයන් විසිනුයි. දැන් ඒ අයටත් ඇත්ත කියන්නට සිදු වී තිබෙනවා.

"The record of the National Government has not given much satisfaction even to its most ardent supporters. The first mistake made was to rely too much on foreign aid. Foreign aid and foreign investment are useful to a developing country, but they can never be substitutes for honest hard work and sincere effort as a whole of the country itself."

මෙම දෙවැනි කාරණය මුලින් කී එක ටත් වඩා වැදගත්.

**ආර්. එම්. අප්පුහාමි මයා.** (බණ්ඩාරවෙල)
*(திரு. ஆர். எம். அப்புஹாமி—பண்டாரவளை)*
(Mr. R. M. Appuhamy—Bandarawela)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගණපූරණයක් නැහැ.

**මන්ත්‍රී මණ්ඩලය ගණන් කොට ගණපූරණයක් නොමැති බව පෙනී ගියෙන්, බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදී.**

**පසුව ගණපූරණයක් තුබූයෙන්—**

*சபை கணக்கிடப்பட்டு நிறைவெண் இல்லையென்று கண்டதனால் பிரிவு மணி அடிக்கப்பட வேண்டுமென ஆணையிடப்பட்டது.*

*பிறகு, நிறைவெண் இருந்ததனால்—*

*House counted and a Quorum not being present, the Division Bells were ordered to be rung.*

*Later, a Quorum bing present—*

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ ගරු සභාවට කියමින් සිටියේ මේ ආණ්ඩුවටම ආධාර කරන කණ්ඩායමක් විසින් ඉදිරිපත් කර තිබෙන "Industrial Ceylon" නමැති සඟරාවෙ මාර්තු මාසෙ කලාපයෙන් උපුටාගත් වගන්තියක්. මේ අවස්ථාවෙදී රාජ්‍ය ඇමතිතුමා පිටව යාම ගැන මම කනගාටු වෙනව. මම හිතනව රාජ්‍ය ඇමතිතුමා ඒ ගැන තව දුරටත් ඇහුම්කන් දීමට සිටිය නම් හොඳයි කියා.

"Secondly, the National Government did not have clear cut policies and plans to implement immediately it came to power."

මේ කියන්නෙ අපි නොවෙයි. ආණ්ඩුවට ආධාර කළ අයමයි. මැතිවරණ කාලෙදී ඒ අය කී දේවල් පිළිබඳ විස්තර කිරීමට අදහස් කරන්නෙ නැහැ කාලය ගත වන නිසා. ප්‍රධානම දේ හැටියට එදා ඒ ගොල්ලන් කිව්ව, අපි සර්වඥය, මේ දූෂණ සියල්ලම නැති කර අමුතුවෙන් ස්වර්ග රාජ්‍යයක් හදනවාය, කියා. එසේ කී ඒ ආධාරකාරයෝ දැන් කියනවා, අද තිබෙන ප්‍රධාන ප්‍රශ්නය කිසිම පිළිවෙළක් හෝ සැලැස්මක් නැතිව ආණ්ඩු කරගෙන යන එකේ විපාකයයි කියා. මේ විපාකය කොපමණ දුරට සිද්ධ වී තිබෙනවද? 1966 අවුරුද්දේ ශ්‍රී ලංකා මහා බැංකු වාර්තාවෙ මුල්ම ඡේදයෙන්ම මොකද කියන්නෙ?

"A drastic decline in export earnings was the most striking feature of the economic situation during 1966. Not only did export receipts decline sharply from the level of the previous year, but they reached the lowest level since 1958. Largely as a result of the disappointing performance of the export sector, economic growth suffered a set-back in 1966."

Tea exports alone declined by Rs. 183 million in 1966 as compared with 1965.

මොකක්ද මේ සිද්ධිය? ප්‍රධානකොටම මම කියන්න කැමතියි, අපේ වෙළහෙළ දාම, විශෙෂයෙන් විදේශ වෙළදාම, පහත බැස තිබෙන්නේ වෙළදාම පිළිබඳව මේ ආණ්ඩුවේ පිරිසිදු ප්‍රතිපත්තියක් නැති නිසා බව. ගරු අගමැතිතුමා අනුගමනය කරනව එක ප්‍රතිපත්තියක්; රාජ්‍ය ඇමති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල: තේ අපනයන තීරු ප්‍රතිදාන යෝජනා ක්‍රමය

තුමා එක ප්‍රතිපත්තියක්; දුප්පත් වෙළඳ ඇමතිතුමා එක ප්‍රතිපත්තියක්; කර්මාන්ත ඇමතිතුමා වෙනම ප්‍රතිපත්තියක්. මේ තත්ත්වය නිසා විදේශ වෙළඳ ප්‍රතිපත්තිය සම්පූර්ණයෙන්ම අවුල් ජාලයක් බවට පත් වී තිබෙනව.

අපි එදා 1960 සිට අපේ විදේශ වෙළඳ ප්‍රතිපත්තිය පැහැදිලි කළා. වෙළඳාම පිළිබඳව අභ්‍යන්තර සහ විදේශීය වශයෙන් පැවතුණ අමාරුකම් අස්සෙන් ගරු අගමැතිණියත්, ඒ වාගේම ඇමති මණ්ඩලයත්, සාමාන්‍යයෙන් සැම රටක් සමගම එක්තරා විධියක ස්වාධිනත්වයක් ඇතිව කාටවත් පක්ෂපාතකමක් නැතිව මිත්‍රකමින් යුත් ප්‍රතිපත්තියක් අනුගමනය කළා. ඒ මිත්‍රකම යම් විධියකින් ආර්ථික ක්‍රමය හා ගැටෙන්න ආ අවස්ථාවලදී, ඒ අමාරුකම්වලින් පනින්නෙ කොහොම ද කියා අපි දේශපාලන වශයෙන් නොව ආර්ථික වශයෙන් කල්පනා කර ක්‍රියා කළා. නොයෙක් ප්‍රශ්නවලදී ඒ අමාරුකම්වලින් පැනල තමයි අපි විදේශ රටවල් සමග අත්වැල් බැඳගෙන හුවමාරු ගිවිසුම් අනුව කටයුතු කරමින් වෙළඳ ප්‍රතිපත්තිය සකස් කරගත්තෙ.

ඒ එසේ නමුත් අද සිදු වී තිබෙන්නෙ මොකක්ද? වෙළඳ ඇමතිතුමාට වෙළඳ ප්‍රතිපත්තිය සකස් කරන්න ඉඩ දෙන්නෙ නැහැ. ගරු අගමැතිතුමා කියන්නෙ මොකක්ද? සම්පූර්ණයෙන්ම ඇමෙරිකාවත් බ්‍රිතාන්‍යයත්, ඒ වාගේම ප්‍රංශය බටහිර ජර්මනිය ආදී රටවලුත් කියන දේ කරන්නයි. ලෝක බැංකුව කියා තිබෙන්නෙ ඒ රටවල කටටයි. ඒක තමයි කටහඬ. ඇයි ඒක සිද්ධ වෙන්නෙ? ආණ්ඩුවේ බලය ලබාගත්තාට පස්සෙ ගරු අගමැතිතුමා මොකක්ද කිව්වෙ? "ඔව්, අපේ රට ගොවි රටක්, කර්මාන්ත රටක් නොවෙයි." අද මොකක්ද කියන්නෙ? එදා තිබුණ තත්ත්වය පිළිබඳ කරුණු තර්කානුකූලව වටහා ගත්තට පස්සෙ වෙළඳ ඇමතිතුමා කියනවා, වෙළඳ ගිවිසුම් සාර්ථක නොකර කවදාවත් මේ වෙළඳාම කරන්න බැහැ, කියා. එහෙත් ඒවාට ඉඩක් දෙන්නෙ නැහැ. මේ රටේ ධනපති පත්‍රත්, ඒ වාගේම වැවිලි සංගමය, යුරෝපීය වෙළඳ සංගමය, ආදී ධනපති සංගම් සියල්ලම එකතු වී පහර ගසනවා, ප්‍රශ්න විසඳන්න දෙන්නෙ නැහැ. ඒ නිසා රාජ්‍ය ඇමතිතුමාත් ඒවායින් කොටසක් ගත්තා. කොටසක් අරගෙන මොකද කළේ? ගරු ආහාර ඇමතිතුමා කිව, වෙළඳ හුවමාරු ක්‍රමයට ගිවිසුම් ඇති කර ගන්න, ඒ අන්දමේ වෙළඳ ප්‍රතිපත්තියක් සකස් කර ගන්න යනවාය කියා. වෙළඳ ඇමතිතුමා ඒ අන්දමේ එක්තරා ක්‍රියා කලාපයක් අනුගමනය කරන්න යනවාලු; එසේ කරන්න වීරිය කරනවාලු. එය සාර්ථක වුණාම බොහොම ප්‍රශ්න විසඳන්න පුළුවන්ලු. එහෙම නම් ඒ අන්දමේ වෙළඳ ප්‍රතිපත්තියක් ක්‍රියාවෙ යොදන්න මේ ආණ්ඩුව ඉඩ දෙනවාද කියා මම අහනවා. එහෙම ඉඩ දෙනවා නම්, මෙපමණ කාලයක්, අවුරුදු දෙකක කාලයක්, තමන් කළේ වරදක්ය, ඊට පෙර අවුරුද්දෙ කළ දේවල් හරිය, ඒවා දැන් ශක්තිමත් කර ගන්න ඕනැය කියා නොකියන්නෙ ඇයි? කොමිසමක් පත් කරන්නෙ ඇයි? තමුන්නාන්සෙලගෙ ආධාරකාරයින්ට රක්ෂාවල් දෙන්න තැන් නැත්නම් වෙන වෙන තැන් හදාගන්න ඕනැ. දැන් අවුරුදු දෙකකට පස්සෙ අපේ තේ නිෂ්පාදනයට මොනවද කරන්නෙ කියා සොයා බලන්න කොමිසමක් පත් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇයි මේ ඇමෙරිකානු අධිරාජ්‍යවාදී රටවලට මේ තරම් ගැතිකමක් දක්වන්නෙ? අධිරාජ්‍යවාදී රටවලට ඇති මේ ගැතිකම අත්හැරදමා අනිකුත් රටවල් සමග ද්‍රව්‍ය හුවමාරු කර ගැනීමේ ක්‍රමය යටතේ වෙළඳ ගිවිසුම් ඇති කර ගන්න ඕනැ. තමුන්නාන්සෙල පත් කරන කොමසාරිස්වරු අන්තිමට තීරණය කරන්නෙත් එයයි. එවැනි පියවරක් ගන්නෙ නැතිනම් කොමිසමක් පත් කිරීමෙන් වැඩක් නැහැ. අපේ විදේශ වෙළඳ ප්‍රතිපත්තිය සකස් වෙන්න ඕනැ ඒ ආකාරයටයි. එහෙම නැතුව වෙළඳ ප්‍රතිපත්තියක් සකස් කර ගන්නෙ කොහොමද? රුසියාවට හෝ චීනයට හෝ චෙකොස්ලෝවැකියාවට හෝ අපේ තේ මිළදී ගන්නෙ නැතැයි කියා බැණීමෙන් වැඩක් වෙන්නෙ නැහැ. අපේ තේ ගන්න නම් බඩු හුවමාරු කර ගැනීමේ ක්‍රමය යටතේ ඒ ගොල්ලන්ගෙ බඩුත් ගන්න ඕනැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තමුන්නාන්සෙ දන්නවා අපට පෙට්‍රල් කොම්පැනි ගන්න සිද්ධ වුණේ මොකද කියා. පෙට්‍රල් කොම්පැනි අරගෙන සුද්දන් රටින් පන්නන්න අපට ඕනෑකමක් තිබුණේ නැහැ. අපට ඕනෑකම් තිබුණේ නැහැ පෙට්‍රල් කොම්පැනි අපේ අතට ගැනීමට. නමුත් අපට එසේ කරන්න සිඩ වුණේ අපේ තේ අලෙවි කර ගැනීමට වුවමනා නිසයි.

1961 දී පමණ අප වෙළඳ දූත මෙහෙය කට ඉරාකයට ගියායින් පසුව් අපට පැහැදිලි වුණා අපේ තේ වෙළඳ පොලින් සියයට 12 ක්ම, ඒ කාලයේදී ඉන්දියාව අත්පත් කර ගෙන තිබුණ බව. ඒ පිළිබඳව සාකච්ඡා කිරීමෙන් පසුව, එක්තරා කොන්දේසියක් යටතෙ, ඒ සියයට 12 ආපසු ලබා ගන්න පුළුවන් වුණා. මොකක්ද ඒ කොන්දේසිය? කොන්දේසිය නම් අපේ තේ ඒ රට ලබා ගන්න නම් අපි ඒ රටෙන් ද්‍රව්‍ය ලබා ගන්න ඕනෑ. ඒ කාලයෙදී අපට බොහොම දොස් නැගුව, ඇයි අපට ඕනෑ කරන්නෙ නැති රට ඉදි ගෙන්වන්නෙ කියා. රට ඉදි ඇරෙන්නට ඒ රටින් ගෙන්වන්න තිබෙන්නෙ බූරුවො. මේ ආණ්ඩුවට විතර අපට බූරුවො ඕනෑ කරන්නෙ නැහැ; එම නිසා රට ඉදි ලබා ගන්න සිද්ධ වුණා.

ඊට පසුව සිදු වුණේ මොකක්ද? ඊළඟට අපට පෙනී ගියා ඉරාකයෙන් ලබා ගන්න පුළුවන් හොඳම ද්‍රව්‍යය, අපට ඉතාම වටිනා වස්තුව, අමු තෙල් බව. මේ නිසාම අපට තෙල් පිරිසිදු කිරීමෙ කර්මාන්තශාලාවක් ඇති කරන්න වුවමනා වුණා. නමුත් ඒ කාර්යය අඩපණ වී ගියා. අද මොකද සිදු වී තිබෙන්නෙ? අපේ තේ වෙනුවට ඉරාකයෙන් ලබා ගන්නා අමු තෙල් මෙහිදී පිරිසිදු කිරීම අරමුණු කර ගෙනයි, මේ මූලික අදහස ඇතුවයි, තෙල් පිරිසිදු කරන කර්මාන්ත ශාලාවක් ඉදි කිරීමට කටයුතු කළේ. නමුත් තමුන්නාන්සෙලා දැන් කර තිබෙන වැඩෙන් නම් එය කරන්න බැහැ. කර්මාන්ත ඇමතිතුමා ගරු සභාවෙ දැන් නැතිවීම ගැන මම කනගාටු වෙනවා. මෙම තෙල් පිරිසිදු කිරීමේ කර්මාන්ත ශාලාවෙහි ඉරාකයෙන් ගෙනෙන අමු තෙල් සුද්ධ කරන්න බැහැ. ඒ කර්මාන්ත ශාලාවෙහි සුද්ධ කරන්න පුළුවන් වෙන්නෙ ඉතාලි කොම්පැනි ගනුදෙනු කරන රටවලින් ගෙන්වන අමු තෙල් පමණයි. අප මුලින් අදහස් කළේ අපේ තේ වෙනුවට අමු තෙල් ගෙන්වා පිරිසිදු කිරීමටයි; අපේ තේවලට අමු තෙල් හුවමාරු කර ගැනීමටයි. ඔන්න අපේ වෙළඳාම, අපේ වැඩ පිළිවෙළ, අඩපණ කර ඇති සැටි, දැන් ඒ කොම්පැනි කාරයින් කියයි, හැම තෙල් වර්ගයක්ම මෙහි පිරිසිදු කරන්න බැහැ, අපි කියන තත්ත්වයෙ අමු තෙල් පමණයි මෙහි සුද්ධ කරන්න පුළුවන් වෙන්නෙ කියා. එක් එක් රටවල එක් එක් විධියෙ තෙල් වර්ගයි තිබෙන්නෙ. ඒ විධියට ඒ අය කියන තෙල් වර්ග පමණක් පිරිසිදු කරන්න යන විට, ඉරාකය සමග තිබෙන අපේ තේ වෙළඳාම්ත් එතැනින් අවසන් වෙනවා. එපමණක් නොවෙයි අපි ගල්තාර—"ඇස්ෆේල්ට්"—ලබා ගත්තෙත් ඉරාකයෙන්. එසේ ලබාගත්තෙත් අපේ තේ ඒ රටට විකිණීමෙන්. අද ඇති වී තිබෙන තත්ත්වය මොකක්ද? "ඇස්ෆේල්ට්" අප ලබාගත්තේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව මාර්ගයෙන්. අද ඒවා තෙල් සංස්ථාව මාර්ගයෙන් ගෙන්වන්නෙ නැහැ. තෙල් කොම්පැනි කාරයින්, සමහර විට අපේ පක්ෂ මන්ත්‍රීතුමාගෙ මාර්ගයෙන් ගිහින්, කරුණු කියා සිටින්න ඇති, පෙරට වඩා හොඳින් ඒවා ඔවුන්ට ගෙන්වන්න පුළුවන්ය කියා.

නියෝජ්‍ය කථානායකතුමා
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy-Speaker)

The Sitting is suspended till 2 P.M. On resumption, the Hon. Deputy Chairman of Committees will take the Chair.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් සිටුවන ලදින් අ. භා. 2 ට කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමා ගේ [ශ්‍රීමත් රසීක් ෆරීඩ්, ඕ.බී.ඊ.] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.

இதன்படி அமர்வு பி. ப. 2 மணிவரை இடைநிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று. குழுக்களின் உப அக்கிராசனர் [ஸ்ரீமான் ரஸிக் பரீத், ஓ.பி.ஈ.] தலைமை தாங்கினார்.

*Sitting accordingly suspended till 2 P.M. and then resumed,* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [SIR RAZIK FAREED, O.B.E.] *in the Chair.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගණපූරණයක් නොමැති බව පෙනී ගියෙන්, බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදී.**
**පසුව ගණපූරණයක් තුබූයෙන්—**

நிறைவெண் இல்லையென்று கண்டதனால் பிரிவு மணி அடிக்கப்பட வேண்டுமென ஆணையிடப்பட்டது.

பிற்கு, நிறைவெண் இருந்ததனால்—

*Notice taken of a Quorum not being present, the Division Bells were ordered to be rung.*

*Later, a Quorum being present—*

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමා ඉදිරියේ මගේ කථාව කරගන යන්නට අවස්ථාව ලැබීම ගැන මා සන්තෝෂ වෙනව. ඒ වගේම අද උදේ වරුවේ හිටපු වෙළෙඳ ඇමතිතුමකුගේ ප්‍රධානත්ව යෙන් පැවැති මේ ගරු සභාවේදී මගේ කථාව කරන්නට ලැබීම ගැනත් මා සන් තෝෂ වෙනව. තමුන්නාන්සෙත් හිටපු වෙළෙඳ ඇමතිවරයෙක් නිසා මේ කරුණු පැහැදිලිව තේරුම් ගන්නට පුළුවන් වෙනවාට කිසිම සැකයක් නැහැ.

ඒ වගේම පෙන්වා දෙන්නට කැමැතියි, ගණපූරණය නැති වූ වෙලාවේදී විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් පුළු වන් තරම් මේ ගරු සභාවට ගෙන්වා ගත් බව. අපේ යෝජනා ඉදිරිපත් කරන අවස්ථාවලදිත්, ඒ විධියටම අපටත් සල කන හැටියට මා ඉල්ලා සිටිනව.

**ඩී. ෂෙල්ටන් ජයසිංහ මයා. (කර්මාන්ත හා ධීවර ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**
*(திரு. டீ. ஷெல்ற்றன் ஜயசிங்க—கைத் தொழில், கடற்றொழில் அமைச்சரின் பாராளு மன்றக் காரியதரிசி)*
(Mr. D. Shelton Jayasinghe—Parliamentary Secretary to the Minister of Industries and Fisheries)

විරුද්ධ පාර්ශ්වයෙ මන්ත්‍රීවරුන් කී දෙනෙක් ඉන්නවද? [බාධා කිරීම්]

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

ආණ්ඩුවට ස්ථිර වෙළෙඳ ප්‍රතිපත්ති යක් නැති වීම නිසා අපේ ආර්ථික තත්ත්වයට සිදු වී තිබෙන හානිය ගැන විවේක කාලයට කලින් මා පෙන්වා දුන්නා. ඇත්ත වශයෙන්ම විදේශ ප්‍රති පත්තියක් වශයෙන් හෝ වෙළෙඳ ප්‍රති පත්තියක් වශයෙන් හෝ අපට භාර ගන්නට පුළුවන් ස්ථිර ප්‍රතිපත්තියක් නැති බව මා කලින් පෙන්වා දුන්නා. ගරු අගමැතිතුමාගේ විදේශ ප්‍රතිපත්තිය එකක්. මුදල් ඇමතිතුමාගේ මුදල් ප්‍රති පත්තිය වෙන එකක්. රාජ්‍ය ඇමතිතුමා අනුගමනය කරන විදේශ ප්‍රතිපත්තිය සහ වෙළෙඳ ප්‍රතිපත්තිය තවත් එකක්. කර්මාන්ත ඇමතිතුමාගේ ප්‍රතිපත්තිය වෙනත් එකක්. මේ නිසා තමයි, මහ බැංකු වාර්තාවෙන් කියන්නෙ මෙපමණ කාලයකට අපේ ආර්ථික තත්ත්වය මේ තරම් පහළ බැස නැත කියා. 1966 මහ බැංකු වාර්තාවේ පටන් ගැන්මේම මෙසේ සඳහන් වෙනව:

"A drastic decline in export earnings was the most striking feature of the economic situation during 1966. Not only did export receipts decline sharply from the level of the previous year, but they reached the lowest level since 1958"—

This is earlier than your time also.

"Largely as a result of the disappointing performance of the export sector, economic growth suffered a set-back in 1966."

මේ තත්ත්වය ඇති වීමට හේතුව පැහැ දිලි ප්‍රතිපත්තියක් නැති වීම, විශේෂ යෙන් විදේශ ප්‍රතිපත්තිය පැහැදිලි නැති නිසා වෙළෙඳ ඇමතිතුමාට තිබෙන බාධක. ද්විපාර්ශ්වික නැත්නම් ත්‍රෛපාර්ශ්වික ගිවි සුම් ඇති කරගන වෙළෙඳාම කරගන යාම සඳහා වෙළෙඳ ඇමතිතුමා වැඩ පිළිවෙ ළක් යොදාගන යනවාය කියා ආහාර ඇමතිතුමා අපට පෙන්නා දුන්න. නමුත් මා හිතන හැටියට වෙළෙඳ ඇමතිතුමාගේ අදහස අලුත් එකක් නොවෙයි; මුල සිට ම තිබුණු එකක්. නමුත් වෙළෙඳ ඇමති තුමාට නිදහසේ ක්‍රියා කිරීමට ආණ්ඩුවේ සහයෝගය ලැබෙන්නෙ නැති නිසා ඒ වැඩ පිළිවෙළ අඩපණ වෙනව. එතුමාට ආණ්ඩුවේ සහයෝගය නොලැබීම නිසා ඇති වුණු සිද්ධීන් කීපයක් මා කලින් කියා තිබෙනව.

අප අමු තෙල් පිරිසිදු කිරීමේ කර්මාන්ත ශාලාවක් පිහිටුවීමට කටයුතු කළේ ඕනෑම රටකින්—විශේෂයෙන් ඉරාක

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

යෙන්—අමු තෙල් ගෙන්වාගන මෙහිදී ඒවා පිරිසිදු කර අපේ ආර්ථික තත්ත්වය රැක ගැනීමටයි. නමුත් අද තිබෙන තත්ත්වයේ හැටියට ඉරානයෙන් ගෙන් වන අමු තෙල්වලට මේ කර්මාන්ත ශාලාව හරියන්නෙ නැහැ. කර්මාන්ත ඇමතිතුමාගෙ පාර්ලිමේන්තු ලේකම්තුමා හිස වැනීමෙන් එය ඇත්තක් බව කියනව. [බාධා කිරීම්] "එසෝ" වැනි කොම්පැණිවල තෙල් පමණයි, මේ කර්මාන්ත ශාලාවේ පිරිසිදු කරන්ට පුළුවන් වන්නෙ. ඒ නිසා අපේ තේ වෙළෙඳාම පහළ බහිනව.

ඒ වගේම මා උදේ වරුවේ සඳහන් කළා, අපේ රටට ගල් තාර—asphalt— ගෙන්නුවේ ඉරානයෙන් බව. අපේ තේ විකුණා ගන්නට වුවමනා නිසා ඉරානයට තේ යවා ඉරානයෙන් ගල් තාර ගෙන්නුවා. ඒ ගල් තාර ගෙන්නුවෙ ලංකා ඛනිජ තෙල් සංස්ථාව මඟින්. අද එය අත්හිටුවා තිබෙනව. නමුත් නාන්සෙට මතක ඇති, අප්‍රේල් 22 වැනි දා මම මේ සම්බන්ධයෙන් ප්‍රශ්නයක් නැඟූ බව. ගරු ඇමතිතුමා ඒ අවස්ථාවෙදි උත්තරයක් දුන්න. දැන් ගල්තාර ගෙන්වන්නෙ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව මඟින් නොවෙයි, ආණ්ඩුවේ බඩු ගබඩාව් මඟිනුයි. ඒකට හේතුව වශයෙන් ඇමතිතුමා කියන්නෙ ආණ්ඩුවේ බඩු ගබඩාව මඟින් වඩා ලාභයට ගල් තාර ගෙන්විය හැකි බව පෙනී ගියාය යන්නයි. ඛනිජ තෙල් සංස්ථාව මඟින් ගෙන්වනවාට වඩා ලාභයට ආණ්ඩුවේ බඩු ගබඩාව මඟින් ගෙන්වන්න පුළුවන්ලු. එහෙම කරන එකවාසිලු.

"(i) The import licence fee of 1 per cent. levied by the Import Control Department could be saved by the P. W. D. since no import licence fees are charged for imports by the Government Stores. (ii) The overheads and profit of the Ceylon Petroleum corporation could also be saved by the P. W. D."

මා රජයේ වැඩ දෙපාර්තමේන්තුව භාර ඇමතිතුමාට මේ ගැන දොස් කියන්නෙ නැහැ. මේකෙ තේරුම ඇමති මණ්ඩලය ඒකමතික තීරණයක් නොගැනීමයි. දැන් මේකෙන් කියන්නෙ ආනයන හා අපනයන දෙපාර්තමේන්තුවට යන මුදල රජයේ වැඩ දෙපාර්තමේන්තුවට ඉතිරි වන බවයි. එයින් රජයේ වැඩ දෙපාර්තමේන්තුවට ලාභයක් ලැබෙනවලු. නමුත් මේ ආනයන හා අපනයන දෙපාර්තමේන්තුවට යන මුදල ලැබෙන්නෙත් මහා භාණ්ඩාගාරයටයි. ඊළඟට ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට යම් වියදමක් වෙනවාය කියනව. ඒකත් වුවමනා නැතිලු. ලාභය ලැබෙන්නෙ රජයේ වැඩ දෙපාර්තමේන්තුවටද, ඛනිජතෙල් නීතිගත සංස්ථාවටද නැත්නම් ආනයන අපනයන දෙපාර්තමේන්තුවටද යන්න නොවෙයි අපට තිබෙන ප්‍රශ්නය. ඒ ආයතන තුනෙන්ම උපදින ආදායම නමුත් නාන්සේගේ මහා භාණ්ඩාගාරයටයි යන්නෙ. අතනින් මේ දෙපාර්තමේන්තුවට ගත්තත් මෙතැනින් අර දෙපාර්තමේන්තුවට ගත්තත් අවසානයෙ ඒ මුදල් සියල්ලක්ම යන්නෙ මහා භාණ්ඩාගාරයටයි. එමනිසා මේ ක්‍රියාවෙන් අපේ භාණ්ඩාගාරයේවත් අපේ ආර්ථික තත්ත්වයේවත් වෙනසක් ඇතිවෙන්නේ නැහැ. එසේ නම් මේ ක්‍රියාවෙන් සිදුවෙන්නේ කුමක්ද? කාගේදෝ කීමක් නිසා දැන් ආණ්ඩුවේ බඩු ගබඩාව මාර්ගයෙන් ගල් තාර ගන්න ගියාම ඒ අය මොකද කරන්නෙ? සමහර විට ලෝකයෙන්ම ටෙන්ඩර් කැඳවාවී. එසේ කරාවිය කියා මා බලාපොරොත්තු වෙනව. එසේ ටෙන්ඩර් පත්‍ර කැඳෙව්වම ඉල්ලන්නෙ කවුද? එසෝ සමාගම නැත්නම් ෂෙල් සමාගම තමයි ඉල්ලන්නෙ. ඊළඟට ඒ අයගේ අඩුම මිළට ගන්න පුළුවන් ස්ථානවලින් ගනීවි.

**සිංගල්ටන්-සැමන් මයා.**
*(திரு. சிங்கல்டன்-சமன்)*
(Mr. Singleton-Salmon)

Might I ask, Sir, what asphalt has to do with the export duty on tea? The hon. Member is talking about asphalt.

**ෂෙල්ටන් ජයසිංහ මයා.**
*(திரு. ஷெல்ற்றன் ஜயசிங்ஹ)*
(Mr. Shelton Jayasinghe)

They had a bilateral agreement.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල: තේ අපනයන තීරු ප්‍රතිදාන යෝජනා ක්‍රමය

**සිංගල්ටන්-සැමන් මයා.**
*(திரு. சிங்கல்டன்-சமன்)*
(Mr. Singleton-Salmon)

Has it something to do with the tea export duty ?

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

I am discussing the bilateral system of trade which has been sabotaged by the hon. Appointed Members' colleagues in Esso.

එමනිසා සමහර විට ආණ්ඩුවේ බඩු ගබඩාව ටෙන්ඩර් කැඳවාවි. එතකොට එසෝ සමාගම හරි ෂෙල් සමාගම හරි ඒක ගනීවි. ගත්තම මොකද වෙන්නෙ? ලාභය ඒ අයට යනව.

**ගරු මොන්ටේගු ජයවික්‍රම (රජයේ වැඩ, තැපැල් හා විදුලි සන්දේශ ඇමති)**
*(கௌரவ மொண்டேகு ஜயவிக்கிரம—அரசாங்கக் கட்டடவேலை, தபால், தந்திப் போக்குவரத்து அமைச்சர்)*
(The Hon. Montague Jayewickreme—Minister of Public Works, Posts and Telecommunications)

May I explain the reason ?

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

Yes.

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்கிரம)*
(The Hon. Montague Jayewickreme)

The hon. Member raised an important point. I appreciate the point he raised. But I would like to mention the reason for this. When the Petroleum Corporation supplied the asphalt, lots of shipments were arriving behind schedule with the result that work was held up. This is a fact. The hon. Member can find out for himself. Our road surfaces were deteriorating so rapidly that I think the matter was discussed by the Planning Secretariat and the various Government officials, and the supplying of asphalt was handed back to the Government Stores. But I can give an assurance to the hon. Member that I shall forthwith summon a conference of the people concerned and if the Corporation undertakes the delivery to schedule without disrupting the work of the P. W. D., I will revert to the Corporation for supplies. I I give him that assurance.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

ගරු ඇමතිතුමා ඒ විස්තරය කිරීම ගැන මං කෘතඥ වෙනව. නමුත් ජනසතු සේවා ඇමතිතුමා ඒ විස්තරය දී නැහැ. ජනසතු සේවා ඇමතිතුමා දෙන උත්තරය මේකයි:

"At a meeting of the Treasury Tender Board on 18.8.66, the Director of Public Works asked that imports of asphalt for the P. W. D. be made by the Government Stores as he felt that the Government Stores could carry out this import cheaper than was done by the Ceylon Petroleum Corporation."

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்கிரம)*
(The Hon. Montague Jayewickreme)

That statement is also correct.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

"The reasons adduced by him were that (i) The import licence fee of 1 per cent levied by the Import Control Department could be saved by the P. W. D. since no import licence fees are charged for imports by the Government Stores. (ii) The overheads and profit of the Ceylon Petroleum Corporation could also be saved by the P. W. D."

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்கிரம)*
(The Hon. Montague Jayewickreme)

There are two reasons, one as stated by me and the other as stated by the hon. Member.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)

A small dispute in the Cabinet.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු යූ. බී. වන්නිනායක (මුදල් ඇමති)**
*(கௌரவ யூ. பி. வன்னிநாயக்க—நிதி அமைச்சர்)*
(The Hon. U. B. Wanninayake—Minister of Finance)

No!

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)

The matter never came to the Cabinet. It was done by the Treasury.

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)

There are two different reasons.

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)

Both reasons.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

මා පළමුවෙන් සඳහන් කළ කාරණය මෙයින් ස්ථිර වෙනව. අපේ කාලෙත් ඇමතිවරුන් අතර සුළු සුළු පරස්පරකම් තිබුණා. නමුත් මේ තරම් පරස්පරකම් තිබුණේ නැහැ.

දැන් මේ ගරු ඇමතිතුමා දන්නෙ නැහැ මොකක්ද වුණේ කියා. මේක දුන්නෙ මක් නිසාද කියා එතුම දන්නෙ නැහැ. ජනසතු සේවා ඇමතිතුමා එක විධියක්. මුදල් ඇමතිතුමා එක විධියක්. රජයේ වැඩ දෙපාර්තමේන්තුව භාර ඇමතිතුමා එක විධියක්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේක එක්තරා ප්‍රෝඩාවක්. තමුන්නාන්සේලා ගේ ප්‍රෝඩාවක් නොවෙයි, ධනපති කොම්පැනිවල ප්‍රෝඩාවක්. ඔය ගල්තාර සම්බන්ධව පමණක් නොවෙයි තවත් ද්‍රව්‍ය ගැන ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට විරුද්ධව චෝදනා කර තිබෙනව. ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් ඕඩර්ස් නැත් නම් ඇනවුම් යැව්වාම හරියට කලට වේලාවට ඒ ද්‍රව්‍ය එවන්නෙ නැත්තේ එක්තරා වැඩ පිළිවෙළක් නිසයි. මේ පළමුවැනි අවස්ථාව නොවෙයි. 1964 අප්‍රේල් මාසයට පසුව අපි ඛනිජ තෙල් නීතිගත සංස්ථාව මාර්ගයෙන් හැර වෙනත් දෙපාර්තමේන්තුවක් මාර්ගයෙන් හෝ පෞද්ගලික සමාගමක් මාර්ගයෙන් හෝ යම් යම් ද්‍රව්‍ය මේ රටට ආනයනය කිරීම තහනම් කර තිබුණා. නමුත් මොකද වුනේ? දැන් පෞද්ගලික කොම්පැනි කාරයෝ—ෂෙල් කොම්පැනි කාරයෝ, එසෝ කොම්පැනි කාරයෝ—පෙට්‍රල් ගෙන්වනව. ලුබ්‍රිකේට්ං ඔයිල් ගෙන්වනව; ග්‍රීස් ගෙන්වනව. මම පෙන්වා දෙන්නම් ඒකට උත්තරය. තමුන්නාන්සේට මතක ඇති මා මේ වාරයේ මේ ගරු සභාවට පැමිණි පළමු වැනි දවසේම රාජ්‍ය ඇමතිතුමා සමගත්, ජනසතු සේවා ඇමතිතුමා සමගත් ලොකු ගෝරියක් ඇති වුනා. කලින් සංයුක්ත මණ්ඩලයෙන් ගෙන්වූ යම් යම් දේවල් දැන් පෞද්ගලික කොම්පැනි මගින් ගෙන්වනවාය කියා ඔප්පු කළොත් තමා ඉල්ලා අස්වෙනවාය කියා එදා ජනසතු සේවා ඇමතිතුමා ප්‍රකාශ කළා. එහෙම පොරොන්දු කලිනුත් දුන්නා. මම දැන් ඒවා විග්‍රහ කරන්න යන්නෙ නැහැ. එදා—මාර්තු මස 5 වැනිදා—මම කිව්වා ඇමතිතුමා පෙට්රෝලියම් කෝපරේෂන් එක කඩාකප්පල් කරන්න යනවාය කියා. කෝපරේෂන් එක මගින් ගෙන්වූ නොයෙක් දේ ගෙන්වීම දැන් පෞද්ගලික කොම්පැනිවලට භාර දී තිබෙනවය කියා මම කිව්වම මට බොහොම තදින් කථා කළා. කට තියෙනවට වාචාල කථා කියනවය කිව්වා. මා කී දේ ඔප්පු කළොත් එතුමා ඉල්ලා අස් වෙනවාය කිව්වා. මා එදා කී දේ උන්නැහෙම ඔප්පු කරල තියෙනව. මා ඇසූ ප්‍රශ්නය කට අප්‍රේල් 22 වැනිදා ජනසතු සේවා ඇමතිතුමා උත්තර දීල තියෙනව. මේකයි, මා ඇසූ ප්‍රශ්නය:

ජනසතු සේවා ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ගබඩා මගින් සිල්ලරට බෙදා හරිනු පිණිස සීමාසහිත ෂෙල් සමාගම මගින් සහ එයට අනුබද්ධ ආයතන මගින් යට කී සංස්ථාවට—(i) 1964 මාර්තු මාසයේ සිට 1965 පෙබරවාරි මාසය දක්වාත්, (ii) 1965 මාර්තු මාසයේ සිට 1966 පෙබරවාරි මාසය දක්වාත්, (iii) 1966 මාර්තු මාසයේ සිට 1967 පෙබරවාරි මාසය දක්වාත්, සපයන ලද ග්‍රීස් තෙල් ඇතුළු ලිහිස්සි තෙල් වර්ග මොනවාද? (ආ) ඒවායේ ප්‍රමාණය කොතරම්ද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මා විසින් කල් දී තිබුණු මේ ප්‍රශ්නයට ගරු ජනසතු සේවා ඇමතිතුමා දුන් පිළිතුර 1967 අප්‍රේල් 22 වැනිදා **හැන්සාඩ්** වාර්තාවේ 3133 සහ 3134 තීරුවල මේ විධියට තියෙනවා :

"The lubricating oils and grease supplied by Messrs. Shell Co. Ltd. and its associated companies to the Ceylon Petroleum Corporation for retail distribution through its depots, were as follows :

From March 1964 to February 1965 . . Nil"

ඒ අපි ඉන්න කාලයේ. ඒ කාලයේ යන්තම් බේරුණා. 1964 සිට 1965 පෙබරවාරි දක්වා මොකවත් නැහැ. 1965 මාර්තු සිට 1966 පෙබරවාරි දක්වාත් මොකවත් නැහැ. 1966 මාර්තු මාසයේ සිට 1967 පෙබරවාරි මාසය දක්වා ලුබ්‍රිකේටිං ඔයිල් ගැලුම් 49,404 යි. ග්‍රීස් රාත්තල් 9,10,944 යි. මේකයි මා ඇසූ ප්‍රශ්නය :

"What lubricating oils including grease have been supplied by the Shell Co. Ltd. and its associate-companies to the Ceylon Petroleum Corporation for retail distribution through its depots ? (b) What are their quantities ?"

The answer was :

"From March 1966 to February 1967 . .
*Lubricating Oil*
49,404
*Grease*
9,10,944"

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)

That is after the lubrication of the American loan.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

මම අභියෝග කරනව, ජනසතු සේවා ඇමතිතුමාට ඉල්ලා අස් වෙන්නය කියා.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

අස් වුනාම කොහොමද වැඩ කරන්නෙ ?

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

එක් කෙනෙක් අස් වෙලා නම් බැහැ. තමුන්නාන්සෙලා ඔක්කොම අස් වුනොත් අපි කරල පෙන්වන්නම්. අපි පෙට්රල් ජනසතු කළේ තේ විකුණන්න වුවමනා නිසයි. අපි එක්සත් අරාබි ජන රජයට, ඉරාකයට, ඉරානයට, රුමේනියාවට තේ වික්ක බව තමුන්නාන්සේලා දන්නව. තේ විකුණා අපි පෙට්‍රල් ගෙනාවා. රත්රන් පවුම් මුදල් යාම වැළැක්වීමට තේ විකුණා පෙට්‍රල් ගෙන්නුවා. එසේ ගෙන්වලයි, අපේ වෙළඳපොළ ආරක්ෂා කර ගන්න අපට පුළුවන් කම තිබුනෙ. පත් කළ ගරු මන්ත්‍රී සිංගල්ටන්-සැමන් මහත්මයා රුසියාවට දොස් කිව්වා. ඒ කථාවට පිළිතුරු වශයෙන් 1964-65 වර්ෂයේ වාණිජ අධ්‍යක්ෂතුමාගේ පාලන වාර්තාවෙන් කොටසක් කියවන්න මම අදහස් කරනව. 18 වන පිටුවේ මෙන්න මෙහෙම කියනව :

"රුසියානු මිළ දී ගැනීම් හේතුකොටගෙන 1965 පෙබරවාරි සිට අප්‍රේල් තෙක් වූ කාල පරිච්ඡේදය තුළ ඇතැම් තේ වර්ග සඳහා මිළ ගණන් ඉහළට නැඹුරුවීම පහසුවිය."

කොහොමද මේ ඉහළට නැඹුරු වුණේ ? අපි ඒ අයට තේ විකුණන විට ඒ අය අපට තෙල් දෙනව. ඒ අය අපෙන් තේ ගන්න විට අපි ඒ අයගෙන් තෙල් ගන්නව. ඔවුන්ගෙන් අපි තෙල් ගන්න නිසා ඔවුන් අපේ තේ වැඩි මිලකට ගන්නව. ඒ අයට ඕනෑ කරන්නේ තෙල් විකුණා ගැනීමයි. දැන් සිදු වී තිබෙන්නේ මොකක්ද ? රුසියාවට විශාල ගණනක් ණයයි. අපි ඇති කළ වෙළඳ ගිවිසුමක් අනුව සපත්තු ටිකක් යවන්නට වෙළඳ ඇමතිතුමා උත්සාහ කරනව. එහෙත් ඒ රටට තේ යවන්නට වීර්ය කරන්නෙ නැහැ. නිකම් රුසියාවට බණිනවා. ඔය සමාජවාදී රටවල් ගැනයි.

අපේ නුවරඑළියේ මන්ත්‍රීතුමාගේ (ඩොනල්ඩ් ජේ. රණවීර මයා.) "ටයිම්ස්" පත්‍රයේ කියා තිබෙන්නේ මොකක්ද ? අද පත්‍රයේ මෙන්න මෙහෙම කියනව :

"S. Africa to buy less tea from Ceylon"

හොඳ ආරංචි.

"South Africa—one of the largest buyers of Ceylon's quality teas—is likely to buy part of her tea requirements from neighbouring friendly countries such as Malawi, Kenya and Tanzania."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

මේ ඔක්කොම කියවන්න යන්නෙ නැහැ. අන්තිම කොටස පමණක් කියවන් නම්:

"A major Ceylon import from South Africa has been coal for Ceylon's railways."

එතකොට අපි රට අඟුරු ගෙන්වා ගෙන ඒ අයට අපි තේ දුන්න. අර කලබල තිබුණු අවස්ථාවේ අපේ අගමැතිණිය නිර්භීතව දකුණු අප්‍රිකාවට විරුද්ධව චෝදනා කළේ ඒ නිසා තමයි. මේ සම්බන්ධකම තිබුණු නිසා කොයි විධියට චෝදනා කළත් ඒ අයට අපේ තේ නොගෙන සිටීමට බැරි වුණා. අපි ඔවුන්ට බැණ්ද්දීත් චෝදනා කරද්දීත් ඔවුන් අපේ තේ ගත්ත. එහෙත් අද සිදුවී තිබෙන්නෙ මොකක් ද?—රට අඟුරු පිළිබඳ ප්‍රශ්නයක් නිසා දුම්රිය භාර ඇමතිතුමා මෙයට පිළිතුරු දුන්නොත් හොඳයි. නමුත් එතුමා දැන් මෙතන නැහැ—මෙපමණ කලක් අපි රට අඟුරු ගත්තේ දකුණු අප්‍රිකාවෙන්. ඒ "බයිලැටරල් ට්‍රේඩ්" ගිවිසුම් එහෙම ගහගෙන නොවෙයි. ඒවා "ට්‍රැඩිෂනල් මාර්කට්ස්" කියා සිත්ගල්ටන්-සැමන් මන්ත්‍රීතුමා කිව්ව. ඒවා පරණ සම්ප්‍රදාය අනුව ඇති වූ වෙළඳ පොළවල්.

ඒවායින් ගෙන්වූ රට අඟුරු නොගෙන්වා හැර දැන් ගෙන්වන්නේ ඉන්දියාවෙන්. බොහොම හොඳයි. ඉන්දියාවෙන් ගල් අඟුරු ගෙන්වීම ගැන අපි විරුද්ධ නැහැ. ගරු අගමැතිතුමාගේ පියා ණන්දුගේ කාලයේ සිටම ඉන්දියාවෙන් හුඟක් දේවල් අපි ගෙන්වනව. දැන් අපි අමාරුවේ වැටිල ඉන්නෙ ඒ නිසයි. ඒවාට අපි දොස් කියන්නෙ නැහැ. එහෙත් අපි ගන්නා ගල් අඟුරු වෙනුවට ඉන්දියාව ගන්නේ මොනවද? ඉන්දියාව අපේ තේ ගන්නවිද? නැහැ. වෙළඳ අනුපාතය අනුව බැලුවොත් අපට අවාසියි. හැමදාම ඉන්දියාවටයි වාසිය. එහෙම තිබියදීත් ඉන්දියාවෙන් ගල් අඟුරු ගන්නව. කාට කොමිස් ගන්නද මම දන්නෙ නැහැ. තේවතු හිමියන් හුඟක් සිටින්නෙ ඔය පැත්තෙ.

අපේ තේ ටික විකුණා ඒ වෙනුවට ගල් අඟුරු ගන්නට පුළුවන්කම තිබියදීත් එය කඩාකප්පල් කළේ ඇයි? ඒ නිසා කෝටි 8 ක තේ විකුණා ගැනීම අපට නැති වෙනව. මා කියන්නෙ ඒකයි. වෙළඳ ඇමති කවුද? රාජ්‍ය ඇමතිද? එහෙම නැත්නම් සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයේ සිටින ඇමතිද? කවුද මුදල් ඇමති? රාජ්‍ය ඇමතිද? එහෙම නැත්නම් අගමැතිද? කවුද මුදල් ඇමති? මේ ගැන අහන විට මොකක්ද දෙන පිළිතුර? දකුණු අප්‍රිකාවට වඩා ඉන්දියාවේ ලාබලු. ඕවා තුම්පනේ මිනිහෙකුට වුණත් තේරෙනව. වන්නියෙ මිනිසුන්ට හොඳට මොළේ තිබෙනවලු. මේ ප්‍රශ්නය නම් තුම්පනේ මිනිහකුට වුණත් තේරෙනව. ඉන්දියාවේ සිට මේ රටට ගෙන්වීම බොහොම ළඟයි. අප්‍රිකාවේ සිට ගෙන්වන විට ඈතයි. එහෙත් අපේ ප්‍රතිපත්තිය විය යුත්තේ අපට වාසි රටකට වෙළඳාම් කරන එකයි.

ලෙබනයේ සූදුරු ලාභ බව තමුන්නාන්සෙ දන්නව ඇති. එහෙත් අපි ඉරානයෙන් ගන්නෙ ඇයි? අපි ඉරානයට තේ විකුණා ඒ රටින් සූදුරු ගන්නව. දැන් මාර්කට් එකත් වහල. දැන් "ජිබෙට්" දෙන්න හදනව. ඇයි නරකද වෙළඳ මාර්කට් එක අත්පත් කර ගන්න පුළුවන්ද බලන්න රන් පවුම් හුඟක් දීලා මැලරි විජේසිංහ මහත්මයා හෝ වෙන කෙනෙක් හෝ රවුමක් පිටත් කළොත්? මොකක්ද මේකෙ තේරුම? අමෙරිකාවත් ලෝක බැංකුවත් විරුද්ධ වෙළෙඳ ගිවිසුම්වලටයි. අප්‍රිකාවත් සමග තිබුණු ඔය විධියෙ පරණ මාර්කට් ක්‍රමයටත් විරුඬද? මේ වරද ගැන වගකිව යුතු විත්තිකරු කවුද? මීළඟ ආණ්ඩුවක් ආවහම මේව ගැන පරීක්ෂා කරන්නට කොමිෂන් සභා කීයක් පත් කරන්නට වෙයිද? කවුද මෙය කඩාකප්පල් කළේ? ඒ රුපියල් අට කෝටිය අපට දෙන්නෙ කවුද? සාමාන්‍යයෙන් විකුණා ගන්නට බැරි මැද රට තේ ඒ විධියට යන බව දිවුලපිටියෙ ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මයා.) කියනව.

"යුරෝපියන් කොමන් මාර්කට්" එක ගැනත් අප බොහොම කෑකෝ ගහනව. මා ඒ ගැනත් වචනයක් කියන්නට ඕනැ. මා ළඟ එක්තරා පත්‍රිකාවක් තිබෙනව. එය වාමාංශික පත්තරයක් හේම නොවෙයි. මේක "BRITISH BULLETIN"—A British Information Services Publication. මෙය කෙළින්ම පිටවන්නෙ මෙහි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල : තේ අපනයන තීරු ප්‍රතිදාන යෝජනා ක්‍රමය

බ්‍රිතාන්‍ය තානාපති කාර්යාලයෙන්. මා මේ අවස්ථාවේදී විශේෂයෙන් පත්කළ ගරු මන්ත්‍රී සිංගල්ටන් සැමන් මහත්මයට ඇහෙන්නට එක් කරුණක් කියන්නට කැමතියි. "යුරෝපියන් කොමන් මාර්කට්" එකට විරුඬ වන අයට දිය යුතු එකම පිළිතුර මෙන්න මේකයයි කියනා මේ පත්‍රිකාව මෙසේ සඳහන් කරනව :

"I have left to the last one of the most compelling arguments against it alone—"

This is an argument advanced against people who say that Britain must go it alone.

"——the question of technological development. We are an industrial country living on our brains and selling what we make. But brains, know-how and technological skills are not enough."

ඒ ගොල්ලන්ගේ ලොකුම ධනය ඔලුවලු. ඒ ගොල්ලන්ගෙ දක්ෂකමලු. "යුරෝපියන් කොමන් මාර්කට්" යනුවෙන් හැඳින්වෙන්නෙ පළමුවෙන් යුරෝපයෙ දේශපාලන තත්ත්වය මැඩ පැවැත්වීමට, මර්දනය කිරීමට, ඇති කළ සංස්ථාවක්. දැන් එය තවත් පියවර කීපයක් ඉදිරියට ගොස් තිබෙනව.

"The Community is not called the European Economic Community for nothing. Those who founded it—Schumann, Monnet, Spaak, and happily one of those is physically with us today—quite deliberately directed its early efforts to economic considerations. But this was because they correctly saw the way of attacking the political issues of a very divided Western Europe, not to speak of a very divided Europe."

මෙය ඇති කර තිබෙන්නෙ තමන්ගෙ දේශපාලන තත්ත්වය ආරක්ෂා කිරීමටත් ස්වාධිනත්වය රැකගැනීමටත් බව පෙනෙනව.

"The opportunity we can now seize is to play our part in reasserting Europe's role in the world, and with Europe, to reassert our own role ....

The same is true if the problems of the developing world are to be met...."

තවදුරටත් විස්තර වශයෙන් මෙය කියවන්න මම කැමති නැහැ. "යුරෝපියන් කොමන් මාර්කට්" එකට ඇතුළත් වීමට තමන්ට වුවමනා කර තිබෙන්නෙ කරුණු දෙකක් උඩ බවයි මේ උදවිය කියන්නෙ. බටහිර යුරෝපයෙ තිබෙන ස්වාධිනත්වය රැකගෙන එහි වෙළෙඳාම ආරක්ෂා කර ගැනීම ඉන් පළමුවැන්නයි. දෙවැන්න, නොදියුණු රටවලට වෙළෙඳාම් කර ගන්නට කිසියම් උපක්‍රමයක් යොදා දී, විදේශාධාරද දෙන බව කියමින් ඒ නොදියුණු රටවල් අල්ලාගෙන සිටීමයි. මේ ක්‍රම දෙකම ඒ ගොල්ලන්ගෙ මොළේ නිසා ක්‍රියාත්මක කරන කරුණු දෙකක්.

මෙයින් අපට සිදුවන්නෙ කුමක්ද? බටහිර යුරෝපයෙ ධනපති රටවල් කීපයක් අත්වැල් බැඳගෙන "උඹලගෙ බඩු අපි ගන්නෙ මෙන්න මේ ගණනටයි, අපේ බඩු මෙ ගණනට උඹල ගන්නට ඕනැ" යි කියාවි. හැබැයි දේශපාලන වශයෙනුත් ටිකක් ගැටී යන වචන කීපයක් කියා තිබෙනව. අමෙරිකාවත් රුසියාවත් අතර තිබෙන තරඟයට එක්තරා විධියකින් හවුල් වෙන්නලු, ඒ ගොල්ලන් එහෙම කරන්නෙ. ඊට පසුව කුමක්ද සිදු වන්නෙ? පොල් විකුණන්ට ගියත්, තේ විකුණන්ට ගියත්, මිනිරන් විකුණන්ට ගියත්, රබර් විකුණන්ට ගියත් ඔක්කොම යුරෝපානු රටවල් කියන්නෙ "මෙන්න අපි ගන්න මිල ගණන්; උඹලට පුළුවන්නම් දීපල්ල; බැරිනම් නිකං ඉඳපල්ල" යනුවෙනුයි. අපි බඩු ගන්න විටත් ඒ උදවිය එකතු වෙලා "මෙන්න අපේ මිල" කියාවි.

රුසියාවයි, "යුරෝපියන් කොමන් මාර්කට්" එකයි, අමරිකාවයි තරඟ කරනකොට රබර් එහෙම ටිකක් අඩු වුණොත් අමෙරිකාව මොකද කරන්නෙ? යම් විධියකින් මොකක් නමුත් දේකට චීනය තරහ වෙලා ඒ අය සමග තියෙන ගිවිසුම කැඩුණොත් මොකද වෙන්නෙ? අපට රබර් ටික විකුණන්ට බැරි වෙනව. පොල් ඉවරයි. රබර් විතරයි ඉතිරි වෙලා තියෙන්නෙ. එතකොට අමෙරිකාව "ස්ටොක් පයිල්" විතරක් නොවෙයි සින්තටික් රබර් පවා මාකට් එකට දමාවි. ඒ උදවියට වුවමනා කරන්නෙ තමන්ගෙ ස්වාධිනත්වය ආරක්ෂා කිරීමටයි. අපට බොරු "ඒඩ්" ටිකක් එහෙම දීල අපව අස්වසන්ට හදනව.

ඒ ගොල්ලො මොකද කියන්නෙ?

"We cannot alone meet the needs of the Commonwealth. That is the reason why for some time now the patterns of trade have been changing. Since 1958,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

when the Community was founded, our exports to community centres have doubled in value, from nearly £500,000,000 to rather more than £1,000,000,000 . . . and this despite the tariff barrier. Similarly, our exports to E.F.T.A. have doubled in the same period."

ටිකක් දුරට ඒ උදවිය අත්හදා බැලුව. එතකොට වාසි ලැබෙන බව, තිබුණට වඩා දෙගුණයක් වෙළඳාම ගිහින් තිබෙන බව පෙනුනා. එම නිසා අපට "ඒඩ්" දෙනව. ඒ උදවිය එකතු වෙලා දැන් අපට කියන්නෙ "උඹලගෙ බඩු අපි ගන්නෙ මෙන්න මේ ගණනටයි; උඹලට වුවමනා නම් අපේ බඩු මේ ගණනට ගනිල්ල" යනුවෙනුයි.

ඒ උදවිය අපට මේව දෙන්නෙ ආධාර වශයෙන් බවයි කතාවට කියන්නෙ. රටකට ආධාර වශයෙන් යමක් දෙනව නම් ඒ රට වර්ධනය කිරීමට රුකුල් වන අන්දමට ඒ රටේ බඩු ගන්ට ඕනෑ. අපේ තේ විකුණා ඒ බඩු ලබා ගන්ට අපි ක්‍රම යොදා තිබෙන්නේ ඒකයි. වෙනත් රටවලට අපේ තේ විකුණුවාම ඒ රටවලින් ගන්ට පුළුවන් බඩු ඒ රටවලින් අපට දෙන්නෙ ආධාර වශයෙන්ය කියනව. ජර්මනියෙන් කාර්, ජීප් එහෙම ගෙන්වනව. ඊට හේතුව කුමක්ද? මෙහෙ ඒ උදවියගෙ බලගතු කොමිෂන් ඒජන්තවරයෙක් ඇති. ඒ වගේම ආධාර ක්‍රම යටතෙ ජපන් රටෙන් කාර්, ජීප්, ලැන්ඩ් රෝවර්ස් එහෙම ගෙන්වන්නෙ ඇයි? ප්‍රොයිඩන්බර්ග් එකට යනව ඒකෙ කොමිස්.

"ඒඩ්" යනුවෙන් නම් කරන්නෙ මොනවටද? "ඒඩ්" පිනට දෙන දේවල්ද? ඉරිදට පල්ලිය ලඟදි වාගෙ, මාලිගාව ලඟදි වාගෙ පිනට දෙන දේවල්ද? අඩු වශයෙන් සියයට 3 පොලියකුත් සමග අවුරුදු 25කදී වත් ආපසු ගෙවන්ට සිදු වන මුදල් වලටයි මෙසේ කියන්නෙ. "ඒඩ්" හෙවත් ආධාර යනුවෙන් මේවා නම් කරන්නෙ බොරුවටයි. ඒව ණය මුදල්. ලන්ඩන් නුවර පැවැත්වූ මුදල් ඇමති සම්මේලනයක් පිළිබඳව මට මතක් වෙනව. කැනඩාව, ඕස්ට්‍රේලියාව, එංගලන්තය කියන රටවල් තුන විශෙෂයෙන්ම ඒ "කොමන්වෙල්ත් කොන්fපරන්ස්" එකේදි කීවෙ කුමක්ද? "ඒඩ් දෙනව; ට්‍රේඩ් ගැන කතා කරන්ට එපා" කීවා. ඒ ගැන කියන්ට තිබෙන්නෙ අපට ඔක්කොම ආධාර දෙන්ට කැමතියි; නමුත් වෙළඳාම ගැන කතා කරන්ට එපා කියන එකයි. වෙළඳාම කරන්නෙ ඒ උදවියට වුවමනා හැටියටයි. පුළුවන් තරම් අඩු මිලට අරගෙන පුළුවන් තරම් වැඩි මිලට විකුණා ලබා ගන්නා ලාබයෙන් ටිකක් ආධාර හැටියට දෙනව. ධනපති ආධාර ක්‍රමය ඒකයි. ඒ උදවිය නිවන් යන්නෙ ඒ ක්‍රමයෙනුයි. පුළුවන් තරම් ගසා කාල අවසානයෙදි කරන්නෙ ඒ ටිකයි. රුපියල් 10ක වැඩ අරගෙන කම්කරුවකුට කුලී වශයෙන් රුපියලක් දික් කරන්නෙ ඒ උදවියයි. අර රුපියල් නවයෙන් නිවන් යන්ට හදනව. ඒ විධියටයි මේ ක්‍රමයත් යොදාගෙන තිබෙන්නෙ. පණ යන තුරු ගසා කාල ගසා කාල ආධාර වශයෙන් ඉන් ටිකක් දෙනව. ඒව අපිත් බාර ගන්නව. තෙල් කොම්පැනිකාරයන්ටත් කෝටි 5½ ක් දෙනව ආධාර ලැබේවිය කියල.

අපට වුවමනා කරන්නෙ ද්විපාර්ශ්වික වේවා ත්‍රිපාර්ශ්වික වේවා වෙළඳ ගිවිසුම් ඇති කරගෙන අපේ බඩු විකුණා ගන්ට සහ අපට බඩු ලබා ගන්ටයි. අපි ජපානයෙන් හුඟක් බඩු ලබා ගන්නව. ඇයි අපේ තේ ඒ උදවියට ලබා ගන්ට බැරි? අපෙන් තේ ලබා ගෙන ඒ උදවියට වුවමනා කරන බඩු වෙනත් රටවලින් ලබා ගන්නට වරදක් නැහැ. ඇයි අපෙන් තේ නොගන්නෙ? ඒ උදවියගෙ කොමිෂන් ඒජන්තවරුන් සිටින්නෙ මේ රටෙයි. මේ ආණ්ඩුවට බලවත් ලෙස උදව් කරන්නෙ කොමිෂන් ඒජන්තවරුයි. ඒඩ් හෙවත් ආධාර ලැබෙන්නෙ එම උදවියටයි. ආධාර මුදල්වලින් ප්‍රයෝජන තියෙන්නෙ මේ කොමිස් ගන්න වෙළඳ මහතුන්ටයි. ඒ ණයට ගන්න මුදල් පොලියත් සමග අවුරුදු 20 ක් තුළ ගෙවන්ට සිද්ධ වෙන්නෙ මේ ජාතියටයි. එක පරම්පරාවක් විතරක් කොමිස් ගන්නව. සමහරවිට ඒගොල්ලන්ගෙ බාල පරම්පරාව එන කොට අපි වළේ. එතකොට ඔක්කොම අරගෙන ඉවරයි.

මේ විධියට මේ වෙළඳාම කවදාවත් කරන්ට බැහැ. ඒ ගැන මුදල් ඇමතිතුමාට පමණක් දොස් කියන්ට බැහැ. "මෙන්න මේ මුදල අපි 'රිබේට්' වශයෙන් වියදම් කර තිබෙනව, කරුණාකරල ඒක ගෙවන්න" මුදල් ඇමතිතුමාට උපදෙස් දී තිබෙ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නව. ඊළඟට තවත් යෝජනාවක් ගෙනත් තිබෙනව, "රිබේට්" වෙනුවට "ටැක්ස්" එකක් ගෙවන්න. ඒ ගැන දැන් අපට කථා කරන්ට තහනම්. කොහෙද මේ තමුන්නාන්සේලා යන්නෙ? තේ කොමිසන් සභාවට කොච්චර කාලයක් යනවද? ගෙවීම කීයද? කාලසීමාවට්ද නැත්නම් දවසෙ හැටියටද? තව අවුරුදු දෙකක් ගියාම කොමිසන් වාර්තාව එයි. එතකොට "රිබේට්" දීල ජාතික ධනය ඔක්කොම ඉවරයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ කථාව මීට වඩා දීර්ඝ කරන්ට අදහස් කරන්නෙ නැහැ. ආඩම්බරයෙන් හිටිය දැන් ඇති. තමුන්නාන්සේලා කළ මෝඩකම් මොනවාදැයි ඇමති මණ්ඩලය රැස්වෙලා සොයා බලන්න. ආණ්ඩුව ආව හැටියෙම හිතුවෙ මොකක්ද? බණ්ඩාරනායක මැතිනිය කළ දේවල් ඔක්කොම අහෝසි කරන්ටයි. හැම රටවලම ඇවිදින්න යන්න කිව්ව. මේ රටේ ඇමතිවරුන් හොංකොං බලන්ටත් ගියා. නොයෙක් මාර්ගවලින් අපි ටිකක් කපා තිබුණු දේවල් ඔක්කොම නැවත ලබා දුන්න. එහෙම කළේ ඒ මිනිසුන්ගෙන් ප්‍රශංසාව ලබා ගන්ටයි. අන්තිමේදි දැන් තමුන්නාන්සේලා පිළිගෙන තිබෙනව, අපි කරගෙන ගිය ඒව හරි බව. හරි නම් කරුණාකරල ඒක කරන්න.

ඇයි, මේ එක්සත් ජාතික පක්ෂයත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් කසාද බන්දවන්ට හදන්නෙ? ඒව කරල ආර්ථික තත්ත්වය බේර ගන්න පුළුවන්ද? කසාද බඳින්න වුවමනා නම් කරුණාකරල ඇමෙරිකාවටත්, අධිරාජ්‍යවාදයටත් විරුද්ධයි කියා කෙළින්ම ප්‍රකාශ කරල අර ප්‍රතිපත්තිය අනුගමනය කරන්න. එතකොට අපි වෙනුවට සමහරවිට තමුන්නාන්සේලා මෙහෙ ඉඳියි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
කවුද කපුව?

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)
මම කරන්නම්. මමනෙ පුරුදුකාරයා. [බාධා කිරීමක්] තමුන්නාන්සේලාගේ ඇමතිවරුන් අගමැතිතුමාගෙන් අවසර අරන් ගිහින් කථා කරල දැන් නැහැ කියනව. මොකක්ද කියා අපි දන්නෙ නැහැ. [බාධාකිරීමක්] අපි කොමිස් ඉල්ලන්නෙත් නැහැ; ඇමතිකම් ඉල්ලන්නෙත් නැහැ.

අපේ සමාජ සේවා ඇමතිතුමා දැන් මේ ස්ථානයේ නැහැ. දැන් එතුමාට ඇමතිකම් ඕනෑ නැතිලු. ඇමතිකම් අරහංලු. ආර්ථික ප්‍රශ්න විසඳන්ටලු තිබෙන්නෙ. විසඳන හැටි අපි දන්නව. මේක ජාතික ප්‍රශ්නයක් නිසා වුවමනා සහයෝගය අපි දෙන්ට ලැහැස්තියි. වෙළඳ ඇමතිතුමා මාව කැඳවල සමහර ප්‍රශ්න ගැන සාකච්ඡා කළා. කොයිතරම් එතුමාට දොස් කිව්වද? දොස් කිව්ව විතරක් නොවෙයි නිලයත් මාරු කළා. ඒ නිලයට දැන් රාජ්‍ය ඇමතිතුමා ඇවිත් ඉන්නව. දැන් රටේ බඩු හිඟයක් නැහැ; බහුලව තිබෙනව. ඇයි? "ඩේලි නිවුස්" පත්‍රයේ කොටස්කාරයෙක් ඇමතිතුමා. මේ විධියට නියම තත්වය වහගෙන තව කල් කරන්ට බැහැ. එම නිසා තමුන්නාන්සේලාගේ ආඩම්බරකම පැත්තකින් තබා මෙය ජාතික ප්‍රශ්නයක් වශයෙන් සලකා රටවල් සමග මිත්‍ර සම්බන්ධකම් ඇති කරගෙන, බණ්ඩාරනායක මැතිතුමාගේ විදේශ ප්‍රතිපත්තිය අනුව කටයුතු කරන මෙන් මා ඉල්ලා සිටිනව.

වියට්නාමයට විරුද්ධව අධිරාජ්‍යවාදීන් යුද්ධ කරද්දී, සමාජවාදී රටවල් ඒ අය සමග සම්බන්ධකම් තිබෙන තමුන්නාන්සේලාගේ තේ ගනියිද? වියට්නාමයට බෝම්බ හෙළනව. සමාජවාදී රටවල් යුද්ධයට විරුද්ධයි. ඒ අතර "අපේ තේ උඹල නොගන්නෙ ඇයි?" කියල අහනව. අන්න අර නිදාගෙන ඉන්න පත් කරනලද මන්ත්‍රී සිංගල්ටන්-සැමන් මහත්මයා වැනි උදවිය තමයි තේ අරගෙන ඇමෙරිකාවට යවල ඇමෙරිකන් රන් පවුම් ඩොලර් ආදිය ඔක්කොම එකතු කර ගන්නෙ. එම නිසා විදේශ ප්‍රතිපත්තිය සම්පූර්ණයෙන් වෙනස් කර, හැම රටක් සමගම මිත්‍රකම් ඇති කරගෙන ඒ මිත්‍ර සම්බන්ධකම් උඩ ද්විපාර්ශ්වික හා ත්‍රෛපාර්ශ්වික වෙළඳ ගිවිසුම් ඇති කරගෙන අපේ රටේ ආර්ථික තත්ත්වය නඟා සිටුවීමට කටයුතු කරන ලෙස මා ඉල්ලා සිටිනව. එසේ නැත්නම් තමුන්නාන්සේලා අපේ ජාතිය හත් මුතු


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]
පරම්පරාවකට නරකාදියට පත් කිරීම නිසා හත් මුතු පරම්පරාවකටම තමුන්නාන්සේලාට දෙස් අහන්ට සිදු වන බවට කිසිම සැකයක් නැහැ. අගමැතිතුමා ප්‍රමුඛ ඇමති මණ්ඩලය රැස්වෙලා අමුතු වෙන් හිතා බලා යම්කිසි වැඩ පිළිවෙළක් යොදන ලෙස මා ඉල්ලා සිටිනව.

අ. භා. 2.40

**රාජා කුලතිලක මයා.** (තෙල්දෙණිය)
*(திரு. ராஜ குலத்திலக்க—தெல்தெனிய)*
(Mr. Raja Kulatillake—Teldeniya)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, උඩරට ප්‍රදේශයේ ආසනයක් නියෝජනය කරන මන්ත්‍රීවරයකු වශයෙන් මේ අවස්ථාවේදී තේ සලාකය පිළිබඳව වචන කිහිපයක් කියන්නට මා අදහස් කරනව. තේ වෙළඳාම විශේෂයෙන්ම මේ රටේ ජන ජීවිතයට බෙහෙවින් බලපාන ආර්ථික ප්‍රශ්නයක් වශයෙන්ද, සංවර්ධනය කෙරෙහි බොහෝ දුර බලපාන ප්‍රශ්නයක් වශයෙන්ද, ගෙන කථා කරන කෙනකුට මේ ගැන නොයෙක් කරුණු ඉදිරිපත් කරමින් කථා කරන්න පුළුවනි. මේ ගරු සභාවේ දෙපාර්ශ්වයේම සිටින ගරු මන්ත්‍රීවරුන් කිහිප දෙනකු විසින්ම මේ ගැන සෑහෙන්න කරුණු දැනටමත් ඉදිරිපත් කර තිබෙනව. තමුන්නාන්සේ මට කථා කිරීම සඳහා දී තිබෙන කාල සීමාව මිනිත්තු දහයක් පමණක් වන නිසාත්, මගේ කථාව ඒ තරමට අදාළ වන පරිද්දෙන් කෙටි කරන්න මට සිද්ධ වෙලා තියෙනව. මගේ කථාව ඒ අනුව් හැකි තාක් ඉක්මනින් අවසන් කරන්න මා බලාපොරොත්තු වෙනව.

මේ විෂය යටතේ අතීතයෙන් ඉතා වැදගත් පාඩම් ඉගෙන වර්තමාන තත්ත්වය ගැන කල්පනා කර බලන විට හිත බලවත් වේදනාවකින් කකියන්න පටන් ගන්නව. මුඩු බිම් පණතින්, එවකට මේ රටේ සිටි ජනයාගේ ඉඩම් ටික කොල්ලකා ගෙන අධිරාජ්‍යවාදීන් මේ රටේ තේ ව්‍යාපාරය ආරම්භ කළා. ඒ මගින් මේ රටේ ජන ජීවිතයට වැදුණේ මරු පහරක් බව නොපිළිගන්න කෙනෙක් නැහැ. [illegible] තැන්වල අහිංසක උඩරට ජනතාවට මහ පොළොවේ ජීවත් වීමට පවා, මැරුණාම වළලෑමට පවා, ඉඩක් නැති පිරිසක් බවට පත් වෙන්න එයින් සිදු වුණා. ඒ අය මහ පාරටම, අගලටම, තල්ලු වුණා. මේ පිළිබඳව කල්පනා කරගෙන යන විට අප විසින් ඉතා වැදගත් ලෙස කල්පනා කළ යුත්තේ ඒ විධියට වුවත්, මේ රටේ තේ ව්‍යාපාරය—එසේ ආරම්භ කර පවත්වාගෙන ආ මේ ව්‍යාපාරය—රටේ ආර්ථික ප්‍රශ්න විසඳීමේ නියම වැඩ පිළිවෙළක් වශයෙන් හෝ රටේ සංවර්ධනයට ප්‍රයෝජනයක් වන ලෙස හෝ මේ රජය වැඩ කටයුතු කරගෙන යනවද යන්නයි. අපට මුලින්ම හිතන්න තියෙන්නෙ එයයි.

ඒ අනුව් හිතන විට අප ඉන්නෙ කොහෙද, අප යා යුත්තේ කොයිබටද, යන ප්‍රශ්න පැන නඟිනව. අන්න ඒ විධියෙ අවදානම් තත්ත්වයකයි දැන් අපි ඉන්නෙ. පුරාණ උපමාවකින් මට මේ කාරණය විස්තර කරන්න පුළුවනි. ගෙදර ගියොත් අඹුව නසී; මග සිටියොත් තමා නසී, යන කියමන මේ අවස්ථාවේදී මේ ආණ්ඩුවට මතක් කර දෙන්න කැමතියි. ප්‍රශ්නයක් මතු වුණාම ඒ ප්‍රශ්නය ගැන කතා කර කර, හිනා වෙවී, රණ්ඩු දබර කර කර, කල කෝලාහල කරමින් සිටීම නොවෙයි නුවණැත්තන් විසින් කළ යුතුව තිබෙන්නෙ. මේ ගරු සභාවෙ ගරු මන්ත්‍රීවරුන් කළ යුත්තෙ මෙය වැදගත් ප්‍රශ්නයක්, ජාතික ප්‍රශ්නයක්, උභතෝකෝටික ප්‍රශ්නයක් හැටියට සලකා, එය විසඳීම සඳහා නුවණින් ක්‍රියා කරන්නෙ කොයි ආකාරයටද යන්න තීරණය කිරීමට කටයුතු කිරීමයි. විධිමත් ලෙසත්, බුද්ධිමත් ලෙසත් මෙය විසඳීමට බලන්න ඕනෑ. ලෝක වෙළඳපොළේ ලැබිය හැකි ඉස්තරම්ම මිළක් මේ ඉස්තරම් ලංකා තේවලට ලබා ගන්න පුළුවන්ද යන්නත්, මේ තේ අපේ රටේ නිෂ්පාදනය කිරීමේදීත් බෙදා හැරීමේදීත් සෑම ආකාරයේම අක්‍රමිකතාවලින් සම්පූර්ණයෙන්ම තොරව හොඳ සුවඳ විහිදෙන පිරිසිදු තේ ටික ඉහළම මිළට දෙන්න විධිමත් සැලැස්මක් බුද්ධිමත් ලෙස ඇති කර ගන්න පුළුවන්ද යන්නත් සලකා බැලිය යුතුයි. මේ වැඩ පිළිවෙළ අනුව මහා කොමසාරිස්වරුන්, වෙළඳ කොමසාරිස්වරුන්, ආදි නිලධාරීන් මොනවද මෙතෙක් කර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තිබෙන්නෙ යන්නත් කල්පනාවට භාජන කළ යුතුයි. ලෝකයේ මෙතෙක් තේ ප්‍රචාරය සම්බන්ධයෙන් මේ රටේ ටී ප්‍රොපගැන්ඩා බෝඩ් හෙවත් තේ ප්‍රචාරක මණ්ඩලය කර තිබෙන වියපැහැදම් කල්පනාවට ගෙන එයින් සාධාරණ ප්‍රයෝජනයක් සිදු වී තිබෙනවද යන්නත්, වියපැහැදම් වූ ප්‍රමාණය අනුව් සලකා බලන විට සෑහෙන වැඩ කොටසක් එයින් කෙරෙනවද කෙරී තිබෙනවද යන්නත්, සලකා බලන්න ඕනෑ. සතුටුදායක වැඩ කොටසක් ඒ හා සම්බන්ධ නිලධාරීන්ගෙන් සිදු වෙනවද යන්නත් කල්පනාවට ගත යුතුව තිබෙනව. නියම සේවයක් නොසිදුවෙයි නම් අප යන මේ ගමනේ තේරුම මොකක් දැයි කල්පනා කර බලන්න ඕනෑ.

අපේ ආර්ථික ප්‍රශ්න විසඳීමේදී ගත යුතු නියම වැඩ මාලාවක් හෝ ගත යුතු පියවරක් හෝ මෙතෙක් තීරණය කරගෙන නැත්නම් එය භයානකයි. රෝගයේ තත්වය බොහොම භයානකයි කියන්න පුළුවනි. කාසරෝගියා පින්පඩි ඉල්ලන්නා වගේ තව තවත් ආධාර දීමටය කිය කියා තව තවත් මුදල් ඉල්ලීමෙන් වැඩක් වන්නේ නැහැ. කෝටි තුනක් ඕනෑය කියන මේ ඉල්ලීම ගැනත් කියන්න තියෙන්නෙ එයයි. පිළියම් කරන නියම ක්‍රමයක් නැතිව නොමනා විධියට තෙල් ගල්වාගෙන රෝගියා ගොඩ ගන්න උත්සාහ කරතොත් එය නුවණට හුරු විධිමත් දෙයකැයි පිළිගන්න බැහැ.

තේ නිෂ්පාදනය කිරීමේ වැරදි වැඩ පිළිවෙළ නිසා ජන ජීවිතයට මරු පහරවල් ගණනාවක් වැදී තිබෙනව. අද මේ රටේ බහුතර ජනතාවගෙන් වැඩි දෙනා ඉතාමත්ම දුකින් ජීවත් වෙනවා. ගොවිතැනක් බතක් කරන්නට හෝ ගෙයක් දොරක් හදා ගන්නට හෝ තබා මිනියක් වළලා ගන්නටවත් සමහරුන්ට මහ පොළොවේ අයිතියක් නැහැ. ඉන්දියානුවන් ලක්ෂ ගණනක් මේ රටට ගෙන්වා ගැනීමෙන් මේ රටට උග්‍ර ප්‍රශ්න ගණනාවක් ඇති කරවීමට තේ ව්‍යාපාරය හේතු වුණු බව දන්නවා. බහුතර ජනතාවගේ ජන ජීවිතයට පහර වදින අන්දමට කට යුතු සලස්වා තිබීම ගැන තේ ව්‍යාපාරිකයන්ට මා චෝදනා කරනවා. මේක කන ගාටුදායක තත්ත්වයක්. මා නියෝජනය කරන කොට්ඨාශයේ ලොකු තේ වතු තිබෙනවා. නමුත් අපේ අහිංසක සිංහල ජනතාවට ඒ වතුකරයේ රැකියා ලබා ගන්නට බැහැ. දේශීය දුගී ජනතාවට රැකියා වල් ලැබෙන අන්දමට අප ක්‍රියා කරන්නට ඕනෑ. වතුවල සිටින ඉන්දියානු ජනතාවට ලැබෙන වරප්‍රසාද සිංහල ජනතාවට නැහැ. වතුවල සිටින දෙමළ මිනිසුන්ට නිවාස, ලැබෙනවා; වෛද්‍යාධාර ලැබෙනවා. ඔවුන්ගේ දරුවන්ට නොමිළයේ කිරි ලැබෙනවා, පාඨශාලා ලැබෙනවා. නමුත් සිංහල කම්කරුවන්ට මේ පහසුකම් නැහැ. මේ අන්දමට අසාධාරණ අන්දමින් සැලකුම් ලබන දේශීය සිංහල ජනතාවට යහපතක් වන විධියට ක්‍රමවත් සැලැස්මක් ඇතිව අපේ තේ ව්‍යාපාරය ගෙන යා යුතුයි. දේශීය ජනතාවටත් වරප්‍රසාද ලැබෙන ලෙස අපේ තේ කර්මාන්තය පවත්වාගෙන යා යුතුයි. ඒ වගේම තේ වතුවල අපේ දේශීය ජනතාවට රැකියා ලැබිය යුතුයි.

1965 දී තේ වෙළෙඳාමෙන් අපට රුපියල් කෝටි 121 ක විදේශ විනිමයක් ලැබුණා. නමුත් 1966 දී එය කෝටි 102 දක්වා බැස්සා. එක් අවුරුද්දක් තුළදී අපට කෝටි 19 ක පාඩුවක් දරන්නට සිදු වුණා. මේ ගැන කල්පනා කර බලා රටට ආදායමක් ලැබෙන පරිදිත් දේශීය ජනතාවට සහනයක් වන පරිදිත් අපේ තේ ව්‍යාපාරය අලුතෙන් සකස් කරන්නට ඕනෑ.

තේ නිෂ්පාදනය පිළිබඳ විශේෂ උද්‍යෝගයකින් දූන් ඉන්දියාව කටයුතු කරගෙන යනවා. "ඉන්ඩියන් ටී බෝඩ්" නමින් එක්තරා ආයතනයක් පිහිටුවා විධිමත් සංවිධානයක් යටතේ තේ කර්මාන්තය පිළිබඳව එහි වැඩ කරගෙන යනවා. එහි නිපදවන තේවලට ඉහළ මිළක් ලබා ගැනීම සඳහා මිසරය වැනි රට වල් සමග සාකච්ඡා පවත්වා කටයුතු කර ගෙන යනවා. ලංකාවේත් ඒ විධියේ ක්‍රමවත් සංවිධානයක් ඇතිව වැඩ කරගෙන ගොස් දියුණුවක් ලබා ගත යුතුයි.

ඊළඟට වෙනස් වන ලෝකය අනුව අප ද හිතන්නට පුරුදු විය යුතුයි. අපේ අනාගතය පිළිබඳ අවදානමක් පෙනෙනවා නම් ඊට පිළියම් වශයෙන් අප කුමන පියවරවල් ගත යුතුදැයි කල්පනා කරන්නට ඕනෑ. මේ දෙන්නට යන සහනාධාරයට සහනාධාරයක් සුළු තේ වතු හිමි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

PUBLIC LIBRARY
JAFFNA

පරිපූරක මුදල: තේ අපනයන තීරු ප්‍රතිදාන යෝජනා ක්‍රමය

[රාජා කුලතිලක මයා.]

යන්ට දිය යුතුව තිබෙනවා. සුළු තේ වතු හිමියන් අද වැටී සිටින්නේ අබල දුබල තත්ත්වයකටයි. අද ඔවුන්ගේ වතුවල තේ දලු කඩන්නට බැරි තත්ත්වයක් පවතිනවා. දලු කැඩුවාට ඒවා මිළයට ගන්නට ඉදිරිපත් වන්නන් නැහැ. මේ තත්ත්වය නිසා සමහර තේ වතු කැළෑවට ගොස් තිබෙනවා. කර්මාන්ත ශාලා ක්‍රියා විරහිත තත්ත්වයක පවතිනවා. අබලන් වූ තේ කර්මාන්තකාරයන් සොයා බලා වැඩි ආධාරයක් දෙන ලෙස මා රජයෙන් ඉල්ලා සිටිනවා.

ඉහළ පංතියේ ව්‍යාපාරිකයන්ට සැම අයුරින්ම තේ සහනාධාර දීම ගැන අපේ කණගාටුව ප්‍රකාශ කරනවා. ඇද වැටී සිටින, දුර්වල වී සිටින, ක්‍රියා විරහිත වී සිටින අංශවලට විශෙෂයෙන් ඒ සහයෝගය දිය යුතුයි. ඒකාධිකාරී තත්ත්වයකින් ක්‍රියා කරන බ්‍රෝකර්වරුන්ගෙන් සහ කූට ව්‍යාපාරිකයන්ගෙන් තොරව, යම් කිසි සාර්ථක සැලැස්මක් උඩ සංස්ථාවක් මගින් මෙම තේ ව්‍යාපාරය පවත්වාගෙන යන්නේ නම් එය අපේ රටටත් තේ නිෂ්පාදකයන්ටත් විශාල සහනයක් වෙනවා ඇති. එම නිසා විධිමත් වැඩපිළිවෙළක් උඩ මෙම ව්‍යාපාරය නව සැලැස්මක් මගින් පණ ගන්වා දියුණු කර මීට වඩා වැඩි ආදායමක් රටට ලබාගැනීමට කටයුතු කරන ලෙස මම අවසාන වශයෙන් ඉල්ලා සිටිනව.

අ. භා. 2.51

**ගරු වන්නිනායක**

*(கௌரவ வன்னிநாயக்க)*

(The Hon. Wanninayake)

I do not propose to speak at length in reply for two reasons. Firstly, time is running short, and secondly, I think the Hon. Minister of Agriculture and Food has more than adequately replied to most of the points that were raised in the course of the discussion.

I can quite appreciate and understand the warmth and feeling with which the hon. Members on both sides of the House spoke. As we all know, tea plays an important role in the economy of our country. I must say, as the Hon. Minister of Agriculture and Food pointed out, that the decline in prices of tea was not a thing that came upon us suddenly. We know that the prices of tea had been declining during the last eight to ten years continuously. Perhaps, if adequate action had been taken at the early stage, this snowballing effect that we are feeling today would not have been felt. I agree that the accumulated force of the declining prices over a number of years is being felt at the moment and that some action should quickly be taken to retrieve the tea industry from the morass into which it has fallen.

In the course of their speeches hon. Members of the Opposition attempted to create the impression in this House, as well as in the country, that nothing is being done about the tea industry by this Government excepting the appointment of a commission. That is not quite correct. It is true that a commission has been appointed. Some hon. Member wanted to know how many years it would take for the commission to submit its report. It will take one to two years. The Government has in view the idea of referring some aspects of this problem to the commission and of getting interim reports and taking action to implement them in order to improve the tea industry. Apart from this, the tea commission has been appointed with a view to solving the problem on a rather long term basis. But a number of *ad hoc* committees have been set up by the Minister of Commerce and Trade to look into the various aspects of the problem and to see whether remedies even of a short-term nature can be applied.

Various remedies were suggested, and one was that we blend and pack the tea here and then export it. Well, the possibilities of it, I must say, are being examined at the moment by the Ministry of Commerce and Trade. Another suggestion was that we enter into bilateral barter agreements and multilateral agreements. I must say that action is being taken on those lines particularly by the Ministry of Commerce and Trade. Various other suggestions too were made. Then there was a suggestion

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

that the C. W. E. on behalf of the Government, or the Government directly may engage in or enter into the business of purchasing tea. The possibility of that measure too is being examined and, I am sure, that the Government will not wait till the ultimate recommendations of this commission are made to it; it will take some action to relieve the distress in which the tea industry finds itself today.

I must say once again that an attempt was made either consciously or unconsciously to create an impression in the House and the country that this Government is sleeping over the problem and that it is doing nothing about it excepting the appointment of a commission. That is not true.

As far as this Supplementary Estimate goes, Sir, I must say that with the exception of the hon. Member for Habaraduwa (Mr. Prins Gunasekera), who had a unique solution of his own, all the other hon. Members on both sides of the House agreed that this kind of relief was necessary in a temporary way. In fact, this Government launched on this relief scheme or rebate scheme on representations made by hon. Members both of the Government and of the Opposition and also some other sectors in the country. So that this was not haphazardly undertaken.

The Member for Habaraduwa (Mr. Prins Gunasekera) had a solution of his own: The tea industry is in trouble; uproot the tea and there will be no need for a rebate scheme. But I find that other hon. Members of the Opposition are not in agreement with his view.

About the rebate scheme, the point was made that there is a certain amount of waste or, rather, that there is some kind of racket operating. It is with a view to correcting that situation that the Tea (Sales Tax) Bill is being introduced.

I want to assure the House that everything possible is being done, particularly by the Minister of Commerce and Trade, to relieve the distress in which the tea industry finds itself today. We are as conscious as, or even more conscious than, the Members of the Opposition of the important role that tea plays in our day to day economy as well as in the development projects which the Government has in view.

The suggestion was made that perhaps the buyers have got together and are operating in a concerted way and it was asked why we, the producers, should not get together and operate in a similar concerted way, so that we will be able to dispose of our produce at a higher price. Even that suggestion is being examined. The Government is alive to that problem too.

I do not want to go into all the remedial suggestions that have been made, but I should like to wind up by saying that the Government is fully alive to the situation, particularly the Ministry of Commerce and Trade. All suggestions made in this House and outside will be examined in the way they should be examined and remedies as effective as possible will be applied in the shortest possible time.

I move that the Supplementary Estimate be now passed.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

## තේ (විකුණුම් බදු) පනත් කෙටුම් පත

## தேயிலை (விற்பனை வரி) மசோதா

## TEA (SALES TAX) BILL

දෙවනවර කියවීමේ නියෝගය කියවන ලදී.

இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.

*Order for Second Reading read.*

අ. භා. 3

ගරු වන්නිනායක
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)

We are again on the subject of tea and I do not think we should traverse the entire ground that we have been

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

traversing in connexion with the Supplementary Estimate which was just passed, but I should like to outline briefly the purpose of this Bill.

When the question of relief to smallholders and even estates in the low country and mid-country areas, due to the falling prices, was being examined, the Government agreed to the refund of the difference between Rs. 1.50 and the price subject to an upper limit of 35 cents. It was also decided that the teas which would qualify for this rebate would be teas that fetched at the auctions certain minimum prices and these minimum prices would be fixed as follows:

(*a*) 70 cents per pound from about 24th September when Cabinet approval was received;

(*b*) 80 cents per pound from 1st November;

(*c*) 90 cents per pound from 1st December.

The intention was that the minimum should be increased to Re. 1 from about March, 1967, but since prices realized at the auction were very low the decision was that the 90 cents rate be applicable up to and including the auctions held on 9th and 10th May, 1967.

There was the experience in 1959 or so when in the application of a similar rebate scheme, there appeared to be many malpractices whereby the rebate on the same parcel of tea was enjoyed over and over again. Since checks on factory output etc. were difficult or had their limitations, it was felt that this could be overcome by doing away with the 35 cents. export duty and instead introducing it as a Sales Tax which will have to be paid by the buyer at the time of the auction. This was approved of and hence the draft Bill. There was the question as to whether this legislation should take the shape of an amendment to the existing Tea (Tax and Control of Export) Act, No. 16 of 1959, or instead whether it should be a new Act. A new Act was considered more preferable since if at any stage it was decided to do away with this procedure, the work involved was only a repeal of the Act.

When the Bill was being drafted provision was made for the collection of 35 cents. per pound of tea sold at the auctions. It was then suggested that the better course would be to make no mention of the amount and instead to keep it open for a decision by the Minister of Finance in consultation with the Minister of Commerce and Trade. In other words, if at any stage the Ministers felt that the amount should not be 35 cents. but istead, say, 25 cents or, maybe even 45 cents, there should be provision in the law for the Minister of Finance to be able to fix this new rate by a notification in the Gazette. This was agreed to and, accordingly, the draft Bill, in Clause 3, provides for the alteration or variation of the tax from time to time.

Other clauses in the draft Bill provide for:

(*a*) the payment of other taxes, cesses, etc. which are payable under the various Acts or regulations,

(*b*) the payment of the export duty of 35 cents in the case of teas intended for the London auctions, or in the case of other teas not sold at the auction but being exported on the basis of private sales, etc.

I think that both the Hon. Minister of Agriculture and Food and the Hon. Parliamentary Secretary to the Minister of Commerce and Trade are here. Any further matter on which more enlightenment is required may be referred to them who, I am sure, will give that enlightenment.

I move the Second Reading of the Bill.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

வினா எடுத்தியம்பப்பெற்றது.

*Question proposed.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 3.3

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

ගරු සභාපතිතුමනි, මේ විෂය ගැනම කලින් දීර්ඝ වශයෙන් සාකච්ඡා වී තිබුණත් මේ පිළිබඳවත් ප්‍රශ්න ගණනාවක් ඉදිරිපත් කරන්නට තිබෙනව. මෙයට අදාළ අතීතය පිළිබඳව ගරු ඇමතිතුමාගේ කථාවේදී සඳහන් වුණා. 1956 දී පටන් යම් යම් අක්‍රමිකතා සිද්ධ වුණාය, එවැනි අක්‍රමිකතා සිදු වීම වැළැක්වීම සඳහා මෙය ඉදිරිපත් කර තිබෙනවාය, බදු අය කිරීම එක්තරා තැනකින් අර ගෙන වෙනත් තැනකට දැමීමෙන් බදු වංචා හොරකම් යනාදිය බොහෝ දුරට නවතින්නට ඉඩ තිබෙනවාය කියා එතුමා ප්‍රකාශ කළා. ඒ කියන්නෙ මෙපමණ කල් බද්ද අය කෙළේ රේගුවෙන්. දැන් මේ බද්ද අය කරන්නේ වෙන්දේසියෙන්. මේ විධියට කල්පනා කරගෙන යන විට බදු සම්බන්ධයෙන් සැහෙන වෙනස් වීමක් ඇති කිරීමටයි ගරු ඇමතිතුමා මේ පනත ඉදිරිපත් කර තිබෙන්නෙ. මෙවැනි දෙයක් කළ විට ඇත්ත වශයෙන්ම මේ බදු වංචා නවතීවිද කියන ප්‍රශ්නයයි අපට කල්පනා කරන්න තිබෙන්නෙ.

මෙපමණ කල් තේ රාත්තලකට ශත 35 බැගින් බද්දක් අය කරන්න යෙදුණා. ඒ එක්කම සියයට 9.3 ක සෙස් බද්දක් එයට එකතු කරනව. ඒ කියන්නෙ රාත්තල් සියයකට රුපියල් 35ක බද්දකුත්, රුපියල් 9.30ක සෙස් බද්දකුත් අය කිරීමයි. එතකොට රේගුවේදී තේ රාත්තල් සියයකට රු. 44.30ක බද්දක් අය වුණා. ඒ එක්කම ඇඩ්වැලෝරම් කියන බද්දක් ක්‍රියාත්මක කරගෙන ගියා. එය ක්‍රියාත්මක වුණේ වෙන්දේසිවලදීයි. ඒ නිසා ඒ බද්දත් රේගුවේ තිබුණ බද්දත් සම්බන්ධ කර රේගු බදුපොළ සම්පූර්ණයෙන්ම වසා දැමීමටයි දැන් මේ පනතින් බලාපොරොත්තු වන්නේ.

ඒ සමගම මෙහි බදු අය වන තවත් ස්ථානයක් තිබෙනව. අපි තේ පිටරට පැටවීමේදී අපේ තේ වලින් විශාල ප්‍රමාණයක් මම හිතන හැටියට මින්සිං ලේන් වෙළඳපොළටයි යන්නෙ. ඒ මින්සිං ලේන් වෙළඳපොලේදී අය කරගන්නා බද්ද ඒ ස්ථානයේදීම අයකර ගන්නා අතර වෙනත් මාර්ගයකිනුත්, එනම් ගැණුම්කාරයාගෙනුත්, අය කරනවාය කියා අදහසක් ඉදිරිපත් වී තිබෙනවා. 6 වන වගන්තිය යටතේ ගැණුම්කාරයගෙන් අය කරන අතරම සීමාසහිත ඉංග්ලිෂ් හා ස්කොටිෂ් ඒකාබද්ධ සමුපකාර තොග වෙළෙඳ සමිතිය විසින් නිෂ්පාදනය නොකරන ලද නම් ඒ අයගෙන් ඒ බද්ද අය කිරීම නවත්වා තිබෙනවා. ඒ හැර අනික් සමිතියක් හෝ සමාගමක් විසින් නිෂ්පාදනය කරන ලද නම්, ඒ තේ අයිතිකරුවන්ගෙන් එම බද්ද අය කර ගත යුතුයි කියා සඳහන් කර තිබෙනව.

ඒ අනුව බලා ගෙන යන විට එක් කාරණයක් මෙයින් මතු වෙනවා. ඒ කාරණය නම්, පිටරට පටවන ද්‍රව්‍යවල මිලෙහි කිසිම වෙනසක් ඇති වන්නේ නැත කියන හැඟීමක් ඇතිවන අතර මේ රටේ අලෙවි වන තේ වල මිළ ඉහළ නගින්න ඉඩ තිබෙන බවයි. මෙපමණ කාලයක් බද්දක් අය කළේ රේගුවෙන් නිසා මේ රටේ තේ පැකට් කර විකුණන අයට කිසිම අන්දමකින් එය බලපෑවැත්වූයේ නැති වුණත්, වෙන්දේසියේදීම—ඔක්ෂන් රූම් එකේදීම—බද්දක් අය කිරීමේ වැඩ පිළිවෙළ නිසා රට ඇතුළේ තේ මිල ඉහළ නගින්න ඉඩ තිබෙනව. ඒ අන්දමට බලන විට අපේ රටේ තේ බොන පුද්ගලයන්ට පෙරට වඩා වැඩි මිලක් ගෙවන්න සිද්ධ වෙනව. මීට පෙර විවාදයේදී කථා කළ ගරු මන්ත්‍රීවරයකු ප්‍රකාශ කළා, පිටින් ශත 06 කට තේ කෝප්පයක් ලබාගන්න පුළුවන් වන අතර තේ කෝප්පයක් සඳහා අපේ භෝජනාගාරයට ශත 25 ක් ගෙවන්න සිද්ධ වෙනවාය, හොඳ හෝටලයකට ගියාම තේ කෝප්පයකට ශත 50 ක් පමණ ගෙවන්න වෙනවාය කියා. මේ අන්දමට බද්දක් ඇති කරන්න යාමෙන් රට ඇතුලේ තේ මිල තවත් ඉහළ නගින්න ඉඩ තිබෙනවා. මෙවැනි තත්ත්වයක් නිසා අලුතෙන් තේ ව්‍යාපාරයට සම්බන්ධ වුණු ලාංකිකයන්ට, කුඩා ව්‍යාපාරිකයන්ට, දුෂ්කරතාවයකට මුහුණ දෙන්න වෙනවා.

දැනට තේ ව්‍යාපාරයට සම්බන්ධ වුණු ලාංකිකයන් රාශියක් ඉන්නවා. පහතරට තේ, මැදරට තේ පිටරට පටවන්න බැරි නිසා, මේ තේ වර්ග බීම, පුළුවන් තරම් අපේ රට ඇතුළෙ වර්ධනය කිරීමට ඕනෑය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයකොඩි මයා.]

කියන හැඟීම ඇතුව නොයෙකුත් ලාංකික ව්‍යාපාර ඊයෙ පෙරේදා බිහිවෙන්න පටන් ගත්ත; කුඩා ලාංකික ව්‍යාපාරික යින් එක්වී තේ පැකට් කර විකිණීම ආරම්භ කළා. අපේ රට තුළ තේ වෙළඳාම ඒ තරම් විශාල දෙයක් නොවෙයි; මම හිතන්නෙ අවුරුද්දකට තේ රාත්තල් තුන් කෝටියකට වඩා අපේ ජනතාව බොන්නෙ නැහැ. වෙනදා සුදු කොම්පැනිකාරයින් නිෂ්පාදනය කළ "ලිප්ටන්", "බෲක් බොන්ඩ්" වැනි තේ සමග තරඟකාරී තත්ත්වයකින් ලාංකික නිෂ්පාදකයින් නිපදවූ තේ පැකට් අලෙවි කිරීමෙහි යෙදුණා. මම කියන්න කැමතියි, "සිල්වබෝන්" වැනි තේ වර්ග අප අතර දැන් අලෙවි වන බව. මගේ කොට්ඨාශයෙත් එක්තරා පුද්ගලයෙක් මෙවැනි සුළු ව්‍යාපාරයක යෙදී සිටිනවා. නමුත් දැන් මෙම බද්ද ඊගුවේ සිට අපේ දේශීය වෙළඳපොල දක්වා ගෙන ඒම නිසා තේ මිල ඉහළ යන්න පුළුවන්කම තිබෙනවා. තේ මිළ ඉහළ නැංවීමේ බර පැටවෙන්නෙ මෙ වැනි නිෂ්පාදකයින්ටයි. අන්න ඒ නිසා රට ඇතුළෙ තේ මිල දැනට වඩා ඉහළ යාමට ඉඩ තිබෙන බව රජයට මතක් කර දෙන්න ඕනෑ. මෙයට ප්‍රතිකර්මයක් යෙදීමටත්, හොඳ තේ දැන් තිබෙන මිලට වඩා අඩුවෙන් ලබාගැනීමට මාර්ගයක් සකස් කර දීමටත් ක්‍රියා කරන ලෙස රජයෙන් ඉල්ලා සිටිනව.

"අඩ් වැලෝරම්" බද්ද ගැන නොයෙකුත් මත ප්‍රකාශ කරනව. මෙය හොඳය කියා, බොහෝ දෙනා තර්ක කරන අතර තවත් කොටසක් මෙය හොඳ නැතැයි කියා තර්ක කරනව. මෙය නියම සාධාරණ බද්දක් නොවෙයි කියා තවත් උදවිය තර්ක කරනව. සමහරු තර්ක කරනවා මෙම "අඩ් වැලෝරම්" බද්ද නිසා ලංකාවට ලැබිය යුතු ආදායම ලැබෙන්නෙ නැතැයි කියා. නොයෙකුත් තර්ක ඉදිරිපත් කළත් මේ දක්වා කර ගෙන ආවේ ඒ ක්‍රමයයි. ඒ ගැන දීර්ඝ වශයෙන් කථා කරන්න මම අදහස් කරන්නේ නැහැ. නමුත් අලුතෙන් ඇති කරන්න යන බද්ද නිසා මේ රටේ සිටින තේ නිෂ්පාදකයින්ට වැඩි බරක් පැටවෙන්න යනවා නම් අන්න ඒ ගැනත් මේ රජයට වග බලාගන්න සිද්ධ වෙනවා.

විශේෂයෙන්ම දැනට තේ මිලදී ගන්නා තැනැත්තන් කව්ද? තේ නිෂ්පාදකයො තමන්ගෙ තේවල සාම්පල් එකක් මොකක් හෝ කොම්පැණියක වී ටෙස්ටර්ට යවනව. ඔහු තමයි, ඒ තේවල රහ ගුණ බලන්නෙ. ඊට පස්සෙ ඒ තේ සාම්පල් එක උඩ බ්‍රෝකර්වරුන් මාර්ගයෙන් තේ වෙළඳපොළට ඉදිරිපත් කරනව. එතැන ඉන්න ගැනුම්කරුවන්ගෙන් එහෙම නැත්නම් තේ පිටරට පටවන්නන් ගෙන් තමයි, අපි මේ බද්ද අය කර ගන්නට බලාපොරොත්තු වන්නෙ. මේ පනත් කෙටුම්පතේ 6 වන වගන්තියෙ මෙසේ සඳහන් වෙනව:

"Where any tea is sold at any authorized Ceylon tea sale, the person who is the purchaser of such tea..."

ඔහු එතැන "පර්චසර්" වෙනව. නමුත් පිටරටට—එංගලන්තයට—මේ රටින් තේ යවන අවස්ථාවෙ එතැන "පර්චසර්" වන්නෙ කවුද? මින්සිං ලේන් එකේ ඉන්න පුද්ගලයා "බයර්" වන්ට පුළුවන්. ඒ නිසයි, මා ඒ ගැන පාර්ලිමේන්තු ලේකම් තුමාට කියන්නෙ——

**ගරු අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල (අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති)**

*(கௌரவ ஐ. எம். ஆர். ஏ. ஈரியகொல்ல—கல்வி, கலாசார விவகார அமைச்சர்)*

(The Hon. I. M. R. A. Iriyagolle—Minister of Education and Cultural Affairs)

තේ ගැනද, පොල් ගැනද කථා කරන්නෙ?

**ජයකොඩි මයා.**

*(திரு. ஜயக்கொடி)*

(Mr. Jayakody)

තේ, පොල්, රබර් යන ඕනෑ එකක් ගැන. පනත හදා තිබෙන්නෙ, මේ බද්ද "පර්චසර්" කියන පුද්ගලයාගෙන් අය කර ගන්නටයි. මින්සිං ලේන් එකට ගෙන යන තේ සම්බන්ධයෙන් ඊට ප්‍රතිවිරුද්ධ මතයක් ඇති වන්නට ඉඩ තිබෙනව. එය මේ පනත් කෙටුම්පතින් පැහැදිළි කර නැහැ. රජය විසින් අපට එය පැහැදිළි කර දීම යුතුකමක් බව මා මතක් කරන්නට කැමතියි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එපමණක් නොවෙයි. දැන් අලුත් වෙළඳ පොළවල් ඇති වේගන එනව. මුලදී මින්සිං ලේන් කියන ස්ථානයයි, අපට පුරුදු වී තිබුණේ. ඉන් පස්සෙ ලංකාවෙත් වෙළඳ පොළක් ඇති කළා. ඉතා වැදගත් තේ වෙළඳපොළක් කල්කටාවෙ තිබෙනව. දැන් ඉන්දියාවෙ කොචින්වලත්, නයිරෝබිවලත් සුළු සුළු තේ වෙළඳපොළවල් හදන්ට යනව. මෙසේ තේ වෙළඳ පොළවල් වැඩියෙන් ඇති කිරීම නවීන තේ වෙළඳාමේ අලුත් අංගයක් හැටියට කල්පනා කරගන අපි කටයුතු කරන්ට ඕනැ. ලංකාවෙ පමණක් නොවෙයි, එංගලන්තයෙ පමණක් නොවෙයි, කල්කටාවෙ පමණක් නොවෙයි, අලුතෙන් තේ නිෂ්පාදනය පටන් ගත් රටවල පවා අද මේ වෙළඳ පොළවල් ඇති වේගන යනව.

මේ ප්‍රශ්නය ගැන කල්පනා කරන විට ඒ සමඟම අපට පෙනී යනව, තේ වෙළඳාම සම්බන්ධයෙන් අලුත් ක්‍රමයක් බිහි කරන්ට බලාපොරොත්තු වන බව. එනම් තේ මිශ්‍රණයට සහභාගි වීමට අලුත් රටවල් ගණනාවක් බලාපොරොත්තු වෙනව. මම හිතන්නෙ, සමහර සුදු කොම්පැණි ලංකාවටත් මේ සම්බන්ධයෙන් යෝජනා ඉදිරිපත් කර තිබෙනව. ඇත්තෙන්ම අපේ රේගුපොළේදී මේ මිශ්‍රණය කරන්ට පුළුවන්. ඒ අදහස ක්‍රියාත්මක කිරීම සුදුසුය කියා මේ රජයට යෝජනා කර තිබෙනවාය කියා මා හිතනව. ඒ ඉල්ලීම රජයට ඉදිරිපත් කිරීමෙන් ඔවුන් බලාපොරොත්තු වන්නෙ මෙයයි: ලංකාවෙ තිබෙනව, ඉතා වටිනා උඩරට තේ. ඒ උඩරට තේ අපේ වෙළඳපොළින් අරගන රේගුව දක්වා ගෙන යනව. ඒ වගේම අනෙකුත් රටවලින් බාල තේ අරගන ලංකාවට ගෙනැවිත් ලංකා රේගුවෙ ගබඩා කරනව. එතැනදී තමන්ට වුවමනා කරන "බ්ලෙන්ඩ්" එක උඩ අර පිටරට බාල තේවලට ලංකාවෙ හොඳ තේ මිශ්‍ර කරනව. එසේ මිශ්‍ර කරන්නටත්, ඒ මිශ්‍ර තේ පිටරට යවන්නටත් ඉල්ලීම් ගණනාවක් ලැබී තිබෙනව. ඒ යෝජනාව රජයටත් ඉදිරිපත් කරන්න යනවලු. "බ්ලෙන්ඩ්-ඉන්-බොන්ඩ්" කියන ඔය ප්‍රතිපත්තිය දැන් හැම තැනම අනුගමනය කරගෙන යනව. අද ටියුනීසියාවේ ඔය ප්‍රතිපත්තියයි ගෙන යන්නේ. ලංකාවේ උඩරට ප්‍රදේශයේ හොඳ වත්තක තේ ටික එංගලන්තයේ මින්සිං ලේන් එකෙන් ගන්නව. එසේ නැත්නම් ලංකාවෙන් ටියුනීසියාවට පටවනව. ලෝකයේ තියෙන රොඩු විධියේ වෙනත් නරක තේ ටියුනීසියාවට අරගෙන ගිහින් අර තේ සමග මිශ්‍ර කරල විකුණනව. මේක ගැඹුරු ව්‍යාපාරයක් නිසා විශේෂයෙන් බද්ද අය කර ගන්න යන අවස්ථාවේදී අපි පරෙස්සම් වන්න ඕනැ. ඒ ව්‍යාපාරය ගෙන යන වංචනික පුද්ගලයන්ට අසු නොවී අපට ලැබිය යුතු බද්ද සාධාරණ පිළිවෙළට ලබා ගැනීමට අපි පරෙස්සම් වන්න ඕනැ. වංචනික ක්‍රියා වැළැක්වීමට රජය මේ පනත මගින් උත්සාහ දැරුවත් මේ පනත නිසා වංචනික ක්‍රියා සර්ව සම්පූර්ණ ලෙසම නැති වෙනවාය කියන හැඟීම ඇති කර ගන්න එපා.

මේ පනතේ 11 වැනි වගන්තිය යටතේ වැරදි කරන අයට දඬුවම් දීම ගැන මෙසේ සඳහන් කර තිබෙනව:

"Where any offence under this Act is committed by a body of persons, then,......shall be guilty of such offence."

මොකක්ද "ඔෆෙන්ස්" එක කියන එක 10 වැනි වගන්තියෙන් පෙන්වා තිබෙනවා:

"10. (1) Any person who contravenes any provision of this Act shall be guilty of an offence and shall, on conviction after summary trial before a Magistrate, be liable to a fine not exceeding one thousand rupees, or to imprisonment of either description for a term not exceeding six months, or to both such fine and such imprisonment.

(2) Upon the conviction of any person for the failure to pay any sales tax under this Act, the Magistrate may, in addition to any other punishment which he may impose, order such person to pay such tax, and such tax may be recovered as though it were a fine imposed by the Magistrate."

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ පනතේ සඳහන් කර තිබෙන පිළිවෙළට දඩ ගහන්නට පුළුවන් රුපියල් 1,000 ක් පමණයි. ඒ වගේම මාස 6 කට හිරේ අරින්න පුළුවන්. අර වංචා කළ ප්‍රමාණයට බද්දක් අය කර ගන්න පුළුවන්. මගේ කල්පනාවෙ හැටියට නම් මේ දඬුවම මදි. රුපියල් 1,000 ක් කියන්නෙ තේ රාත්තල් කීයක වටිනාකමද? අද ගණන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයකොඩි මයා.]

වල හැටියට තේ රාත්තලක් රුපියල් දෙකක්ය කියා ගණන් ගත්තොත් රුපියල් දාහක් කියන්නෙ තේ රාත්තල් 500 ක වටිනාකම පමණයි. නමුත් අද කෙනකුට රුපියල් දස ලක්ෂයක්වත් නැතුව මේ ව්‍යාපාරයට ඇතුළත් වෙන්න බැහැ. විශාල මුදලක් වියදම් කරන්න පුළුවන් සැහෙන ගැනුම්කාරයකුට පමණයි, මේ ව්‍යාපාරයට ඇතුළත් වෙන්න පුළුවන්. නමුත් වංචාවක් කළොත් දඩ ගසන්න පුළුවන් රුපියල් දාහක් පමණයි. ඒ මදි. නොයෙකුත් කපටිකම් කරනව නම්, නොයෙකුත් සූත්‍ර යොදනව නම්, ඒවාට සැහෙන පිළිවෙළට දඬුවම් කරන්නට ඕනෑ. මේ කපටිකම් නිසා, සූත්‍ර නිසා, අපට විදේශ විනිමය නැතිව යනව. අඩු ගණනේ මේ දඩය රුපියල් දහ දාහක් වත් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වෙළඳ පොලේ කෙරෙන වංචා ගැන තමුන්නාන්සේලා දන්නෙ නැහැ. පත්‍රයක් කියෙව්වම අපට සමූපකාරයේ සිදු වන වංචා ගැන දැනගන්න ලැබෙනව; රජයේ නිලධාරීන් කරන වංචා ගැන දැන ගන්න ලැබෙනව. නමුත් පෞද්ගලික අංශයේ වංචා මොනවාද කියා කව්රුවත් දන්නේ නැහැ. මට මිනිත්තු 5 ක කාලය දුන්නොත් එක්තරා භයානක වංචාවක් තමුන්නාන්සේට විස්තර කරල දෙන්න පුළුවන්. වංචාව කළ නැනැත්තාත් බේරුනා, ගැනුම්කාරයත් බේරුනා. ඒ වංචාව අහක තිබුණු රක්ෂණ සමාගමක් උඩට වැටුණ.

ගරු මුදල් ඇමතිතුමාට මා රේගුවෙ සිදු වූ වංචාවක් ගැනත් මතක් කරන්ට සතුටුයි. රබර් ටොන් 25ක් රැගත් ලොරි පහක් රේගුවට ඇතුළු වුණා. පළමුවැනි පියවරව තිබුණේ ගේට්ටුවෙන් කාඩ් ශීට් එකක් ගැනීමයි. ලොරි පහට ඒකත් ලැබුණ. ලොරි පහේ අංකත් කාඩ් ශීට් එකේ තිබුණ. ඊට පසු රබර් ටොන් 25 ක් රැගත් මේ ලොරි පහ රබර් සර්වෙයර් මහත්මය ළඟට ගියා. ඒ මහත්මයත් පරීක්ෂා කළා. ලොරි පහයි, රබර් ටොන් 25 යි. ඒකත් හරි. ඊළඟට මේ රබර් ටොන් 25 බත්තල්වලටත් පැටෙව්ව. බත්තල් වලින් නැවටත් ගත්ත. නැවට පැටෙව්වාට පසු මේ රබර් ටොන් 25 ට මේට් රිසිට් එකත් ලැබුණ. ඒ අන්දමට නැවටත් පැටෙව්වාට පසු පැටවුම්කරු බැංකුවෙන් තමාට අය විය යුතු මුදලුත් ගත්ත.

ඊට පසු මේ රබර් ටොන් 25 එක්තරා රටකට ගියා. ඒ රටේදී බැලුවාම රබර් ටොන් 20 යි තිබුණේ. කෝ ඉතිරි රබර් ටොන් පහ? මෙහෙදි රේගුවෙ සිට නැව දක්වාම හරියට ටොන් 25 ක් ගියා. නමුත් අර රටට යන විට ටොන් 20 යි. එසේ නම් නැවේදී ටොන් 5 ක් නැති වෙන්නට ඕනෑ. නැත්නම් අර ටොන් පහට මොකද වුණේ ? ඇත්ත වශයෙන්ම මෙහෙදි නැවට ටොන් 20 කට වැඩියෙන් රබර් පැටෙව්වෙ නැහැ. ටොන් 20 යි තිබුණේ. දිගටම හැම අංශයකින්ම ටොන් 25 ක් තිබෙනවාය කියා පාස් කරගෙන ගියා. ඒ සැම කඩදාසියකම ටොන් 25 ක් තිබෙනවාය කියා සටහන් වී තිබෙනව.

අන්තිමේදී මොකද වුණේ ? අහක තිබුණු රක්ෂණ සමාගමක් ටොන් පහේ මුදල ගෙවා ඒක අවසානයක් කළා. එවැනි තීක්ෂණ වංචා රාශියක් ඔය රේගුවෙ සිදු වෙනව. එම නිසා මේ මුදල ප්‍රමාණවත් නොවන බවයි මා කියන්නෙ. මීට වඩා බරපතළ චෝදනා තිබෙනව. ඒවායේ සීමාවක් නැහැ. මේ ඊයෙ පෙරේදා හංගපු බඩු අල්ලන්න ගිහින් මොකද වුණේ කියා ගරු ඇමතිතුමා දන්නව. ජැෆර්ජීලාගෙ බඩු වගයක් ඇල්ලුව. මේ රජයත් දැන ගෙන හිටිය ඔවුන් වංචාවක් කරන්ට යන බව. ඇත්ත වශයෙන්ම මේ රජය ඒ ගැන ක්‍රියා කළා. ඉදිරිපත් වුණා. අන්තිමේදී සේල්ස්මන් කෙනෙකුද කවුද වැරදිකාරය හැටියට පරිවර්තනය වුණා. නියම අයිතිකරුවන් අයින් වුණා. ඒකයි තත්ත්වය.

දැන් මෙතැන තමුන්නාන්සෙ හිලක් තබා තිබෙනව :

" 11. Where any offence under this Act is committed by a body of persons, then,—

(a) if that body of persons is a body corporate, every director and officer of that body corporate ;

(b) if that body of persons is a firm, every partner of that firm ; and

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

(c) if that body of persons is the English and Scottish Joint Co-operative Wholesale Society Ltd., the person for the time being holding the office of manager in Ceylon of that Society,

shall be guilty of such offence :

Provided . ....”

අන්න හිල තියපු තැන. මෙතැන තමයි ප්‍රශ්නය තියෙන්නෙ.

“that a director or an officer of such body corporate, or partner of such firm, or the person for the time being holding the office of manager in Ceylon of that Society, shall not be deemed to be guilty of such offence if he proves that such offence was committed without his knowledge or that he exercised all due diligence to prevent the commission of such offence.”

එපමණක් නොවෙයි. ආණ්ඩුවේ ගණන් පරීක්ෂක කාරක සභාවේ පරීක්ෂා කර ගෙන යන විට විෂමතා රාශියක් අහුවෙනව. කා පිටින්ද මේව යන්නෙ? ඔය සුලු නිලධාරියකු උඩින් තමයි අවසානයෙදි මේව යන්නෙ. එකම විධායක නිලධාරියකු පිටින්වත් මේ විෂමතා යන්නෙ නැහැ. මක්නිසාද ? Delegation of powers කියා එකක් දමා තිබෙනව. එම නිසා නියම හොරා කවදාවත් අල්ලාගන්න ලැබෙන්නෙ නැහැ. නායකයා කොයි තරම් වංචා කළත්, විධායක නිලධාරීන් කොයි තරම් වංචා කළත්, කොම්පැනියක අධ්‍යක්ෂවරුන් කොයි තරම් වංචා කළත් අන්තිමේදී ඒව පැටවෙන්නෙ අහක සිටින සුළු නිලධාරියකු නැත්නම් කොල්ලකු මතයි. මේකෙත් එවැනි ක්‍රමයක් තිබෙනව. ඔහු දන්නෙ නැත කියල කොහොමද දන්නෙ? එය තීරණය කරන්නෙ කොහොමද ? සුදු කොම්පැනියක සිටින අධ්‍යක්ෂවරයෙක් මේ පනතේ සඳහන් අන්දමට දඩයකට යටත් විය යුතු විධියේ තේ ජාවාරමක් කළාය කියා අපි හිතමු. යම් විධියකින් එය අසුවුණොත් ඔහුට පුළුවන්කම තිබෙනව රුපියල් දහසක දඩයක් විදීමට හෝ මාස 6 ක් බන්ධනාගාරයේ සිටීමට හෝ කවුරු හෝ කොල්ලෙක් කැමති කරවා ගෙන ඉදිරියට දමන්න. නඩුවක් පැවරුණු විට කත් ලංකාවේ සිටින නොම්මර එකේ ප්‍රධාන පෙළේ නීතිඥවරුන් අල්ලා දඬුවම රුපියල් දහසක දඩයකට පමණක් සීමා කරවා ගන්නටත් ඔවුන්ට පුළුවන්කම තිබෙනව. ඔය ධනපති කොම්පැනිකරුවන්ට එවැනි දඩයක් කියන එක සුළු දෙයක්. කවුරු හරි කොල්ලෙකුට රුපියල් දාහක් දඩ ගහවි. කොම්පැනිය ඒ දඩ මුදල ගෙවාවි. ඒ නිසා වංචා කරන අයට දඬුවම් පමුණුවනවාය කියා මේ පනතෙහි සඳහන් වී ඇතත් මෙන්න මේ වගන්තිය නිසා එය හරියාකාර කරන්න බැරි වෙනව. මෙන්න මේකයි වගන්තිය :

“... . shall not be deemed to be guilty of such offence if he proves that such offence was committed wihtout his knowledge...”

දන්නෙ නැහැ කියල තමුන්නාන්සේ දන්නෙ කොහොමද ? මා අහන ප්‍රශ්නය ඒකයි. ඔහු කොල්ලෙකුට කියාවි වැඩේ කරන්න කියල.

“...or that he exercised all due diligence to prevent the commission of such offence.”

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ විධියේ පනත් ක්‍රියාත්මක කරන්න බැහැ. මේවා උසාවියකට ගිය විට අහක දමනව. මේ වගන්තිය මෙයට ඇතුළත් කරනවාට වඩා හොඳයි මේ පනත සම්පූර්ණයෙන්ම අහක දමන එක. වෙළඳ වංචා මැඩලන්නට වුවමනා කරනවා නම් අඩු විශයෙන් වෙළඳ බලපත්‍රයවත් අවලංගු කරනවාය කියා කියන්න ඕනෑ. මෙවැනි යම් වෙළඳ වංචාවක් කර අසු වුණොත් වෙළඳ බල පත්‍රය අවලංගු කර ඒ වෙළඳ ව්‍යාපාරය ගෙනයෑම තහනම් කරනවාය කියන්න ඕනෑ. මුදල් ඇමතිතුමා “ඔව්” කියල ඔළුව වනනව. එහෙම නම් ඒ කරුණ මේ පනතට ඇතුළත් නොකරන්නේ ඇයි? කොයි විධියේ වෙළඳ වංචාවක් කළත් දඩය රුපියල් 1,000 යි. කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමා (වී. බී. ඉලංගරත්න මයා.) යෝජනා කරනව පුරවැසිකම නැති කරන්නය කියල.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දවසක් මිනුවන්ගොඩ මන්ත්‍රීතුමා (එම්. පී. ද සොයිසා සිරිවර්ධන මයා.) කළ හොඳ බුද්ධිමත් වැඩක් මට මතක් වුණා. වෘත්තීය සමිති ප්‍රශ්නයකදී එය සමථයකට පත් කිරීම සඳහා බැරිංටන් කියා මහත්මයෙක් පැමිණ සිටි බව තමුන්නාන්සේලාට මතක ඇති. ආණ්ඩුවත් ඒ මහත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයකොඩි මයා.]

මයාට කන්තලව් කළා එය සමථයකට පත් කරන්නය කියල. එහෙත් ප්‍රශ්නය විසඳුණේ නැහැ. අන්තිමේ මිනුවන්ගොඩ මන්ත්‍රීතුමා කිව්ව "බැරිංටන් මහත්මයගෙ පාස්පෝට් එකේ නොම්මරය ගෙනත් දෙන්න" කියල. එහෙම කියල දවස් දෙකයි ගතවුණේ ප්‍රශ්නය විසඳුණා. ඇහුවෙ පාස්පෝට් එකේ නොම්මරය පමණයි. වැඩේ කෙරුණා. පකිස්ථානයේ පැවති බැංකු ස්ට්‍රයික් එකක් සමථයකට පත් කරන්න ගිහින් එහිදී ජයග්‍රහණය කළ නිසයි ඒ මහත්මයා මෙහාටත් එව්වෙ. අන්තිමේ පාස්පෝට් එකේ නොම්මරය ඇසීමෙන් පමණක් ප්‍රශ්නය විසඳුණා. ඒවගේ ස්ථානෝචිත ප්‍රඥව කියන එකත් ටිකක් තිබෙන්නට ඕනැ. මේ රටේ වෙළඳාමේ තිබෙන වංචා සහගත ක්‍රියා නැති කිරීමට තැත් කළ රජයකට මුහුණපාන්නට සිදුවූ අමාරුකම් ගැන හොඳ අවබෝධයක් ලැබී තිබෙන නිසා මෙවැනි හිල් ඇති පනත් ඉදිරිපත් කර මේ ප්‍රශ්න විසඳන්නට බැරි බව මා කියනවා. ඔය තත්ත්වය උඩ මේ පනත ක්‍රියාවට පරිවර්තනය කරන්න පුළුවන් කමක් නැත්නම් එය සකස් නොකිරීමෙන් කරන්නේ භාණ්ඩාගාරයට ලැබිය යුතු විශාල මුදලක් නොලැබී යන්න ඉඩ හැරීමයි. එහෙම වුණොත් තත්ත්වය හොඳද ?

ඉදිරිපත් කර තිබෙන මෙම පණතට අප එක් අතකින් විරුද්ධ නැතත්, මෙවැනි හිල් ඇති වීමට ඉඩකඩ නොතබන ලෙස අප ඉල්ලා සිටිනවා. තවත් ගරු මන්ත්‍රීවරුන් ගණනාවක් කථා කරන්නට බලාපොරොත්තුවෙන් සිටින නිසා මා මීට වඩා දීර්ඝ වශයෙන් කථා කරන්න අදහසක් නැහැ. රේගුවෙන් අය කෙරෙන "අඩ් වැලෝරම්" බද්ද ආදී බදු අය කිරීම සම්බන්ධවත් ඒවායෙහි ඇති වන වංචාවන් සම්බන්ධවත් රජය අඩු ගණනේ කල්පනා කරවත් තිබීම ගැන අපි ඇත්ත වශයෙන්ම සන්තෝෂ වෙනව. බදු සම්බන්ධයෙන් මේ රටේ නොයෙකුත් විධියෙ වංචාවන් සිදුවන බව මෙහි වෙළෙඳ ව්‍යාපාරවල යෙදී සිටින බොහෝ දෙනා—අධිරාජ්‍යවාදී කොම්පැනිවල සිටින සුදු මහත්වරුන් පවා—පිළිගෙන තිබෙනව. ඒ බව පෙන්වා දෙන්න මට පුළුවනි. මැණික් වෙළෙඳාම ඇතුළු සෑම වෙළෙඳ ව්‍යාපාරයකම ඒ තත්ත්වය පවතිනව. වංචාවෙන් තොරව කිසිම වෙළෙඳාමක් මේ රටේ කෙරෙන්නෙ නැ. එක් අතකින් කොම්පැනි කාරයින්ගෙ ගසාකෑම, තවත් අතකින් රජයට අය විය යුතු මුදල් නියම වශයෙන් අය නොවීම, තවත් පැත්තකින් පනතක හිලක් දුටු විට එයින් රිංගා යන ඇතැම් ව්‍යාපාරිකයින් රජයට ගෙවිය යුතු මුදල් හදල් නොගෙවා සිටීම ආදී වූ නොයෙක් විධියෙ වංචා හැම තැනකම තිබෙනව. මෙවැනි වංචා නතර කිරීමේ අදහසින් මෙම පනත ඉදිරිපත් කළානම්, වංචාවන් දෙගුණ තෙගුණ වීමට ඉඩ ඇති 11 වැනි වගන්තිය වැනි කොටස් මෙයින් ඉවත් කරන ලෙස මම කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

මෙවැනි පනතක් සලකා බැලීමේදී, අප පිටරටවල වෙළෙඳ පොළවල් සමග කරන ගනුදෙනු ගැනත් සලකා බැලිය යුතුව තිබෙනව. මින්සිං ලේන් එකට යවනු ලබන අපේ තේ එහි විකිණෙන මිළ අනුව අපේ රටට ලැබිය යුතු නියම මිළ, නියම ආදායම, ලැබෙනවද නැද්ද යන්නත් මෙහිදී අපේ සැලකිල්ලට භාජන විය යුතුයි. ආනයන ද්‍රව්‍ය සම්බන්ධයෙන් "Overloading of Invoices" නමැති ක්‍රමයකුත් අපනයන ද්‍රව්‍ය සම්බන්ධයෙන් "Underloading of Invoices" නමැති ක්‍රමයකුත් තිබෙන බව කවුරුනුත් දන්නවා. විශේෂයෙන්ම, තේ වැනි අපනයන ද්‍රව්‍යයක් සම්බන්ධව කථා කරන විට, තේ පැළය සිටුවීමේ පටන් තේ කෝප්පය පිළියෙළ කිරීම දක්වා වූ සෑම අංශයක්ම එක් පුද්ගලයකුගේ එක් පැලැන්තියක තනි අයිතියට අසු වී තිබීම විශාල වංචාවන් දිගින් දිගටම පැවැතීමට හේතුවක් වන බව රජය ඇනගත යුතුයි. රාත්තල් 100 කට රු. 44.90 බැගින් අය කෙරෙන අඩ් වැලෝරම් බද්ද සම්බන්ධයෙන්ද කිසියම් ක්‍රියා මාර්ගයක් ගන්නට අදහස් කර තිබෙනවා. බදු වශයෙන් කීයක්වත්ම නොගෙවා මේ රටින් තේ යවනවයයි මා කියන්නෙ නැ. එහෙත් අඩ් වැලෝරම් බද්ද වශයෙන් ලැබිය යුතු නියම මුදල නිසියාකාර ලැබෙනවද යන්න විපරම් කළ යුතුයි. එංගලන්තයෙ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සිටින වෙළෙඳ කොමසාරිස්වරයට වැඩිපුර නිලධාරීන් ලබා දී හෝ මෙම වැඩේ හරි හැටි කෙරෙනවද යන්න ගැන නිසි පරීක්ෂණයක් කරන ලෙස මා ඉල්ලා සිටිනව. එසේ කළොත්, තේ වෙළෙඳාම සම්බන්ධයෙන් කෙරෙන වංචනික ක්‍රියා සෑහෙන තරම් දුරට වළක්වා ගන්න පුළුවනි. තේ වෙළෙඳාමෙහි ඇති මේ වංචනික ක්‍රියාවන් දිගින් දිගටම වැඩි වේගෙන ගියොත් තේ ගස නිසා නඩත්තු වන අපේ ආර්ථික ජීවිතය අඩපණ වීයාමෙන් අප අන්ත ප්‍රපාතයකට ඇද වැටෙන්නට ඉඩ තිබෙනව. එම නිසා, මේ බදු හුවමාරු කරන අවස්ථාවේදී මේ ප්‍රශ්නය ගැන ඉතා ඕනෑකමින් සලකා බලන ලෙස මම ඉල්ලා සිටිනව.

අ. භා. 3.37

**සිංගල්ටන්-සැමන් මයා.**
*(திரு. சிங்கல்டன்-சமன்)*
(Mr. Singleton-Salmon)

Mr. Deputy Chairman, I have several questions I would like to ask the hon. Parliamentary Secretary.

Before I do that I would like to refer to one or two interesting points raised by the hon. Member for Divulapitiya (Mr. Jayakody) which showed his complete ignorance of certain matters. He says we should collect certain data from Mincing Lane. In fact, the data is being collected. On every shipment of tea that goes out export duty has to be paid, and under the new Bill this sales tax has to be paid. After the sale in London, a return has to be made to Ceylon showing the amount realized on the sale so that the *ad valorem* duty can be collected from the buyers. So, there is no question of this Bill affecting that matter at all.

The questions, however, that I would like to ask the hon. Parliamentary Secretary—I have sent him a copy of the questions so that he would have the answers ready—are these: (1) Will the rebate scheme which presently applies to teas sold at auctions at prices below a certain figure continue to operate when the sales tax replaces the export duty? (2) Is it the intention to levy the sales tax on teas bought at a tea sale by tea-packers for sale in the local market? These teas do not now pay the export duty. (3) Will the sales tax be fixed at a flat rate as is the case with the export duty? (4) How will the sales tax be payable, or recoverable, in the case of private sales which are now permitted to the U. S. A. and Canada; and what will be the position in respect of forward contracts if and when permitted?

I think I shall support the hon. Member for Divulapitiya as regards clause 10 and the penalty of only Rs. 1,000 or six months' imprisonment of either description. I too agree that whenever frauds or offences against a law of this sort are detected, the penalty should act as a real deterrent to others who might be tempted to commit the same offence. I would certainly support the hon. Member to have that penalty enhanced.

අ. භා. 3.40

**එස්. ඒ. පීරිස් මයා.**
*(திரு. எஸ். ஏ. பீரிஸ்)*
(Mr. S. A. Peeris)

fපැක්ටරිවලින් තේ ගෙනැවිත් එක් වරක් වෙළඳපොලේ විකුණුවාට පසු නැවත වරක් ඒවා විකිණීමේදී මෙම ශත 35 ක වෙනස ලබා ගැනීමට ඉඩ නොදීමටයි අපි අදහස් කරන්නෙ. මෙම හොර වංචාව නැති කරන්නට අප මෙම පනතට අනුව බලාපොරොත්තු වෙන බවත්, මෙයින් එම බලාපොරොත්තුව ඉටු වන බවත් මතක් කරන්ට කැමතියි. මේ රටේ පැකට් කරන තේවලටත් මෙම තීරු බද්ද අය කරන්ට බලාපොරොත්තු වන්නෙ වෙන විශෙෂයක් කරන්ට බැරි නිසයි. එනිසා තේ පාවිච්චි කරන උදවියට වැඩි කරදරයක් වේවිය කියා අපි සිතන්නේ නැහැ. මීට මාස හය කට, අවුරුද්දකට, තරම ඉහත විකුණන ලද ගණනටමයි තේ විකිණෙන්නෙ. එම නිසා එමගින් වැඩි වෙනසක් ඇති වේවිය කියා අපි විශ්වාස කරන්නෙ නැහැ. දැනට තේ විකුණන පිළිවෙළ අනුව විශේෂ අමුත්තක් සිදු වේවිය කියා සිතන්නෙ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එස්. ඒ. පීරිස් මයා.]

රුපියල් දහසේ දඩයත් හය මාසයේ දඬුවමත් මදිය කියා අපි පුද්ගලික වශයෙන් කල්පනා කරනව. දැනට මෙය ස්ථිර කර ගත්තායින් පසුව වෙනම අවස් ථාවකදි ඉඩ ලැබුණොත් එය වෙනස් කරන්ට බලාපොරොත්තු වෙනව. තීරු බදු පනත යටතෙ මෙවැනි අසාධාරණකම් කරන උදවියගෙ බලපත්‍ර අවලංගු කරන්ට හැකිවේය කියායි අපි කල්පනා කරන්නෙ. මීට කලින් රේදි ගෙන්වන ලද වෙළෙන් දන් 46 දෙනෙකුගෙ ලයිසන්ස් තාවකාලිකව අවලංගු කළා. ඒ අයට විරුද්ධව පැමිරු නඩුවල තීන්දුවෙන් පසුව නැවත ඒවා දෙන්ට සිදු වුණා.

දිවුලපිටිය ගරු මන්ත්‍රීතුමා (ජයකොඩි මයා.) කී අන්දමට "අඩ් වැලෝරම් ඩියුටි" එකේ කිසි වෙනසක් වෙන්නෙ නැහැ. ඒ අයකිරීම ඒ විධියටම කරන්ට ඉඩ තිබෙනව.

Sir, with regard to the questions raised by the hon. Appointed Member (Mr. Singleton-Salmon), I shall repeat each question and follow it up with the answer.

*Question 1.*

Will the rebate scheme for teas sold at auctions at prices below a certain figure continue to operate when the sales tax replaces the export duty ?

*Answer*

Yes. In other words the rebate scheme will not be affected by this Bill. In fact the object of this Bill is to prevent the rebate being paid over and over again for the same parcel of tea.

*Question 2.*

Is it the intention to levy the sales tax on teas bought at a tea sale by tea-packers for sale in the local market ? These teas do not now pay an export duty.

*Answer*

Yes. This question in fact has been raised, and a point emphasized is that, if this tax has to be paid, the prices of local teas will have to be correspondingly increased. The reply to this has been that since prices of local teas have dropped considerably the need for an increase in the sale price of local teas should not arise.

*Question 3.*

Will the sales tax be fixed at a flat rate as is the case with the export duty ?

*Answer*

Yes. According to the present plans, the decision is to fix it at the same level as the export duty, namely 35 cents.

*Question 4.*

How will the sales tax be payable, or recoverable, in the case of private sales which are now permitted to U. S. A. and Canada ; and what will be the position in respect of forward contracts if and when permitted ?

*Answer*

Where private sales are concerned, and in the case of forward contracts if and when permitted, the buyers will have to pay the export duty instead of the sales tax.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

කෙටුම්පත් පණත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

அதன்படி, மசோதா இரண்டாம் முறையாக மதிப்பிடப்பெற்றது.

*Question put, and agreed to.*

*B.ll accordingly read a Second time.*

මතු පළවන යෝජනාව සභාසම්මත විය.

"කෙටුම්පත් පණත පූර්ණ මන්ත්‍රී මණ්ඩල කාරක සභාවට පැවරිය යුතුය"—[ගරු වන්නිනායක]

பின்வரும் பிரேரணை ஏற்றுக்கொள்ளப்பட்டது.

"மசோதா முழுச்சபைக் குழுவுக்குச் சாட்டப்படுமாக" —[கௌரவ வன்னிநாயக்க.]

*Resolved :*

"That the Bill be referred to a Committee of the Whole House."—[*The Hon. Wanninayake.*]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**කාරක සභාවේදී සලකා බලන ලදී.**

[කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනාරූඪ විය.]

முழுச் சபைக் குழுவில் ஆராயப் பெற்றது.

[குழுக்களின் உப அக்கிராசனர் தலைமை தாங்கினார்.]

*Considered in Committee.*

[MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *in the Chair.*]

**1 වන වගන්තියේ සිට 9 වන වගන්තිය තෙක් කෙටුම්පත් පණතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.**

1 ஆம் வாசகத்திலிருந்து 9 ஆம் வாசகம் வரை மசோதாவின் பகுதியாக இருக்க வேண்டுமென ஆணை யிடப்பட்டது.

*Clauses 1 to 9 ordered to stand part of the Bill.*

CLAUSE 10.—(*Offences.*)

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

I have an amendment to this clause. If my amendment is accepted clause 10 (1) will read thus :

"Any person who contravenes any provision of this Act shall be guilty of an offence and shall, on conviction after summary trial before a Magistrate, be liable to a fine not exceeding ten thousand rupees, or to imprisonment of either description for a term not exceeding one year, or to both such fine and such imprisonment."

**සිංගල්ටන්-සැමන් මයා.**
*(திரு. சிங்கல்டன்-சமன்)*
(Mr. Singleton-Salmon)

The hon. Member's amendment is :

"In page 3, line 37, leave out the word 'one' and substitute therefor the word 'ten'."

"In page 3, line 39, leave out the word 'six' and substitute therefor the word 'twelve'."

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

I must speak on my Amendment.

I move,

In pages 3, lines 37 to 39, to leave out "one thousand rupees, or to imprisonment of either description for a term not exceeding six months," and insert "ten thousand rupees, or to imprisonment of either description for a term not exceeding twelve months,".

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අප එකඟ වූවත් නැතත්, වංචා සිදු වන මේ අවස්ථාවේදී, ඒවා නැති කිරීමට පත් කරන ලද මන්ත්‍රී සිංගල්ටන්-සැමන් මහත් මයා මහන්සි වීම ගැන අප සන්තෝෂ වෙනවා. එහෙත් වංචා සම්බන්ධයෙන් උසාවියට යෑම ප්‍රජාතන්ත්‍රවාදී ස්වරූප යක් ගත්තත්, මේ රටේ වෙළඳ ව්‍යාපාරි කයන් ප්‍රජාතන්ත්‍රවාදීව කටයුතු කරනවා දැයි යන්න ගැන අප තුළ කුතුහලයක් තිබෙනවා. මෙවැනි වැරදි කරන අයට මුද ලින් දඩ ගැසීමටත්, ඔවුන් හිරේ යැවීම ටත් අප මේ ගරු සභාවේදී නොයෙක් විධියේ පනත් සම්මත කළත් එක් එක් උසාවිවල විනිශ්චයකාරවරුන්ට එකිනෙ කට පටහැනි නොයෙක් මත ඉදිරිපත් කරන්ට පුළුවන්කම තිබෙන නිසා ඒවා හරිහැටි ක්‍රියාත්මක වෙන්නෙ නැහැ. මහේස්ත්‍රාත්වරයකු සෑහෙන වැදගත් විනිශ්චයකරුවකු හැටියට සලකන්ට පුළු වන් වුණත්, ඒ අයගේ තීරණයන්ට විරුද්ධව ඇපෑල් ගන්න පුළුවනි. මෙවැ නි වංචා සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් උසාවියේදී වැරදිකරුවන් වන පුද්ගල යින්ට ඇපෑල් ගැනීමට ඉඩ තැබීමෙන් ඇත්ත විශයෙන්ම රජයට ලොකු හානි සිදු වන්ට ඉඩ තිබෙනවා. එම නිසා මෙම සංශෝධනය ඉදිරිපත් කරන අතරම ඒ තත්ත්වය අනාගතයේදී ඉදිරිපත් කරන් ට අදහස් කරන පනත් වලින් ඉවත් කරන්ට වග බලාගන්නා මෙන් ඉල්ලා සිටිනවා.

**කාරකසභා නියෝජ්‍ය සභාපති**
*(குழுக்களின் உப அக்கிராசனர்)*
(The Deputy-Chairman of Committees)

Is the hon. Parliamentary Secretary accepting that amendment ?

**එස්. ඒ. පීරිස් මයා.**
*(திரு. எஸ். ஏ. பீரிஸ்)*
(Mr. S. A. Peeris)

No. It can be considered later, when the necessity arises. When there are serious cases of cheating or fraud they will be looked into and an amendment will be brought up at that stage.

As I said, we are considering the question of cancelling the licences of people who commit these offences.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ද සොයිසා සිරිවර්ධන මයා.
(திரு. டி சொய்ஸா சிறிவர்தன)
(Mr. de Zoysa Siriwardena)
On top of this ?

එල්. සී. ද සිල්වා මයා.
(திரு. எல். சீ. டி சில்வா)
(Mr. L. C. de Silva)
Will the hon. Parliamentary Secretary agree to include it at this stage ?

එස්. ඒ. පීරිස් මයා.
(திரு. எஸ். ஏ. பீரிஸ்)
(Mr. S. A. Peeris)
No, it cannot be done now. Under the Customs Ordinance there is provision to cancel the import or export licences of those people.

ජයකොඩි මයා.
(திரு. ஜயக்கொடி)
(Mr. Jayakody)
ඇයි, 10 වෙනි වගන්තියෙ 49 වෙනි පේළියට "and such imprisonment and cancellation of such licence" කියන එක දාන්න බැරි ?

එල්. සී. ද සිල්වා මයා.
(திரு. எல். சீ. டி சில்வா)
(Mr. L. C. de Silva)
You can include at the end of it the words "and such imprisonment and cancellation of such licence."

එස්. ඒ. පීරිස් මයා.
(திரு. எஸ். ஏ. பீரிஸ்)
(Mr. S. A. Peeris)
The duty will be recovered. If it is found that they have not paid the duty, it can be recovered. The provision for a fine of Rs. 1,000 and six months imprisonment can stand. If there is default or non-payment of this sales tax, then it can be recovered through the magistrate.

එල්. සී. ද සිල්වා මයා.
(திரு. எல். சீ. டி சில்வா)
(Mr. L. C. de Silva)
You are going before the magistrate only to recover the fine you failed to recover and not to punish the wrongdoer ?

එස්. ඒ. පීරිස් මයා.
(திரு. எஸ். ஏ. பீரிஸ்)
(Mr. S. A. Peeris)
Here the words and/or are used.

එල්. සී. ද සිල්වා මයා.
(திரு. எல். சீ. டி சில்வா)
(Mr. L. C. de Silva)
The word is "or"; it can be the fine.

කාරකසභා නියෝජ්‍ය සභාපති
(குழுக்களின் உப அக்கிராசனர்)
(The Deputy-Chairman of Committees)
Is the hon. Parliamentary Secretary prepared to accept that amendment ?

එස්. ඒ. පීරිස් මයා.
(திரு. எஸ். ஏ. பீரிஸ்)
(Mr. S. A. Peeris)
No.

ඇත් හැරීමට යෝජනා කළ වචන වගන්තියේ කොටසක් හැටියට තිබිය යුතුය, යන ප්‍රශ්නය විමසන ලදී.

කටහඬවල් අනුව "පක්ෂ" මන්ත්‍රීන්ට ජය බව කාරක සභා නියෝජ්‍ය සභාපති විසින් ප්‍රකාශ කරන ලදී.

விடப்படவேண்டுமெனப் பிரேரிக்கப்பட்ட சொற்கள் வாசகத்தின் பகுதியாக இருக்குமாக என்னும் வினா விடுக்கப்பட்டது.

குரல்களின்படி "ஆம்" என்பவர்களுக்கு வெற்றி யென குழுக்களின் உப அக்கிராசனரால் பிரகடனப்படுத் தப்பட்டது.

*Question, that the words proposed to be left out stand part of the Clause, put.*

THE DEPUTY CHAIRMAN OF COMMITTEES, *having collected the Voices, declared that the "Ayes" had it.*

ද සොයිසා සිරිවර්ධන මයා.
(திரு. டி சொய்ஸா சிறிவர்தன)
(Mr. de Zoysa Siriwardena)
Divide !

කාරක සභාව 48 වන ස්ථාවර නියෝගය යටතේ—පක්ෂව 28; විරුද්ධව 9; යනුවෙන්—බෙදුණේ ය.

சபை, 48 ஆம் நிலையற் கட்டளையின் கீழ் பிரிந்தது. சார்பாக 28 ; எதிராக 9.

*The Committee divided (under Standing Order No. 48) : Ayes 28; Noes 9.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

I move,

In page 3, line 44, after "pay" insert "thousand times."

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ සංශෝධනය මා ඉදිරිපත් කරන්නෙ මේ ගරු සභාවෙ දහස් වාරයක් කියා පාන, "පුළුවන් තරම් දූෂණ වැඩ නවත්තන්න උත්සාහ කිරීම තමයි අපේ ප්‍රතිපත්තිය" යනුවෙන් ඇති පාඨය ගැන කල්පනා කර ලයි. මීට පෙර තිබුණු දූෂණකම් නවත්වන්නටයි මේ විධියෙ දඬුවමක් දෙන්න යන්නෙ. රුපියල් පණස් දාහක පමණ වංචාවක් කර රුපියල් දාහක් පමණක් දඩයක් හැටියට ගෙවන්නට සිදු වුණොත් එය නියම දඬුවමක් වෙන්නෙ නැහැ. ඒ තරම් සුළු මුදලක් දඩ ගැසීම ප්‍රමාණවත් නොවෙයි. රුපියල් පණස් දාහක වංචාවක් කළත් පාඩු විඳින්න වෙන්නෙ රුපියල් දාහක් පමණයි නේද යන හැඟීම කෙනෙකුට ඇති වුණොත් එයින් වන්නෙ තව තවත් වංචා කිරීමට පෙළඹීමයි. වංචාව හා සම්බන්ධ මුදල ගැන සලකා බලා මා ඉදිරිපත් කළ සංශෝධනය භාර ගත්තොත් ගෙවිය යුතු දඩය රුපියල් කෝටි දහයක් වෙන්න පුළුවනි. ඒ තරම් මුදලක් දඩයක් හැටියට ගෙවන්න වුණාම එක්කෝ වෙළඳාම කරාවි, එහෙම නැත්නම් අත්හැර දමා යාවි. එහෙම නොකළොත් නැවතත් වරක් මීටත් වඩා භයානක තත්ත්වයකට ගරු වෙළඳ ඇමතිතුමාට මුහුණ පාන්නට සිදු වෙනවා ඇති.

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අවස්ථාවේදී වංචාවන් ගැන කථා කරන්න මා බලාපොරොත්තු වන්නේ නැහැ. එහෙත් අද මේ රටේ වෙළඳම් කරන බොහෝ දෙනා අනන්ත අප්‍රමාණ වංචාවල් කරනවය යන්න කවුරුත් දන්නවා. යම් යම් අවස්ථාවලදී පසුගිය කාලයේදී මේ රටේ යම් යම් වෙළෙන්දන්ගේ බල පත්‍ර පවා අවලංගු කර තිබෙන අවස්ථාවල් ගැන අපි දන්නවා. වංචාසහගත ලෙස කට යුතු කළ උදවියට—1955 යුගයෙදි විශාල වශයෙන් වංචාවල් කළ උදවියට—විඳින්නට සිදු වූ දඬුවම් ගැන මේ අවස්ථාවෙදි ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාට මතක් කර දෙන්න මා කැමතියි. මට කොම්පැනියේ නම හරියට මතක නැහැ. හේජ් තුල්ලා සමාගමට නැත්නම් ජෑපර්ජි සමාගමට වෙන්න ඕනෑ. මට මතකයි දන්. කොහු කර්මාන්තය සම්බන්ධයෙන් දූෂණ ක්‍රියාවල යෙදීම නිසා මුසාජී සමාගමට ලයිසන්ස් එක පවා නැතිව ගියා. මම ඒ සිද්ධිය කොටින් කියන්නම්.

කොහු කර්මාන්තය සම්බන්ධයෙන් ඒ කාලයේදී තිබුණා "ෆ්ලෝ ප්‍රයිස්" යන නමින් හඳුන්වනු ලැබූ හිලක්. මේ සිදුර නිසා කොහු කර්මාන්ත සම්බන්ධව විශාල වංචා හෙවත් දූෂණ ඇති වුණා. කොහු ගෙනාවාම මේ අය කරන්නෙ එය අඩුවෙන් කිරා භාර ගැනීමයි. කොහු හොඳ නැත කියා හෝ වේන යම් අඩුපාඩුවක් තිබෙනවය කියා හෝ නියම බර ප්‍රමාණය සඳහන් කරන්නෙ නැතිව ඊට අඩුවෙන් බර සඳහන් කර මුදල් ගෙවනවා. නොයෙක් ප්‍රශ්න දමා නියමිත මිල ගෙවීම නොකර හරිනවා. ඒ හේතුකොටගෙන ඒ අය නියම මිල නොගෙවන නිසා හොණ්ඩර දහයක ප්‍රමාණයක් ගත්තොත් හොණ්ඩර හතක් වෙනුවෙන් පමණයි මුදල් ගෙවන්නෙ. රිසිට් නිකුත් කරන්නෙත් ඒ ආකාරයට මිස නියම ප්‍රමාණයට නොවෙයි. මුසාජී කොම්පැනිය වෙත කොහු හොණ්ඩර පණහක් ගෙනැවිත් තිබුණා. එහෙත් මුදල් ගෙව්වෙ හොණ්ඩර හතළිහකට පමණයි. එහෙත් ඒ සඳහා නිකුත් කළ රිසිට් පත්‍රයේ හොණ්ඩර හතළිහක්ය කියා තිබුණේ වී නමුත්, එහි අනෙක් පැත්තේ පැන් සලයකින් ලියා තිබුණා නියම ප්‍රමාණය. එය ගරු ඇමතිතුමාට ඉදිරිපත් කළා. ඒ අවස්ථාවේ ගරු ඇමතිතුමා ඔවුන්ගෙ ලයිසන්ස් පත්‍රය අවලංගු කළා. එදා සිට අද වන තුරු කොහුවල ඒ තරම් වංචාවක් නැහැ. මෙවැනි වංචාවල් අනන්ත අප්‍රමාණ සිදු වෙනවා. ඒවා ගැන වෙන් වෙන් වශයෙන් කියන්නෙ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයකොඩි මයා.]

අ. භා. 4

ඊයෙ පෙරේදා තමුන්නාන්සේ කළ දේ ගැන මා ආඩම්බර වෙනව. මේ රටට අහිතකර පුද්ගලයන් මේ රටට අල ප්‍රමාණයක් ගෙන ආවා. දැන් මෙම සිද්ධියට අවුරුදු එකහමාරක් පමණ වයසයි. මේ ආණ්ඩුව බලයට පත් වුණායින් පසු ඒ කූට වෙළදුන් අල හිඟයක් ඇති කිරීමේ බලාපොරොත්තුවෙන් රේගුවෙන් නියම වේලාවට අල ටික පිටකොටුවට ගෙනාවේ නැහැ. එහෙත් වෙළඳ කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්තුමා ඒ අවස්ථාවේදී එයින් එක වෙළෙන්දකුට කළ තර්ජනයෙන්ම ඒ කූට ක්‍රියා මාර්ගය වෙනස් කළා පමණක් නොව අල ගෙන්වූ අනිකුත් වෙළඳුන්ද ඊට පසු ඒ දූෂණය කළේ නැහැ. වෙළෙඳ කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්තුමා ඒ අවස්ථාවේදී කළ ඒ තර්ජනය ගැන මා එතුමාට ප්‍රශංසා කළා. අන්න ඒ විධියේ තර්ජනයක් හැම විටම තිබෙන්න ඕනෑ. මේවැනි අංශ සඳහා එවැනි තර්ජනයක් නැති නිසා මේ ආණ්ඩුව බලයට පත් වුණ දා සිට ලොකු අපහසුකම් ඇති වී තිබෙනවා. ඒ විධියේ තර්ජන නැති විට වෙළඳුන් බඩ පුරවා ගන්න අතර දුප්පත් මිනිසුන් අමාරුවෙ වැටෙනවා. ඒ නිසා දූෂණ වැඩවල යෙදෙන අයට වැඩිපුර දඩයක් ගැසීමට හැකි වන අයුරු අධිකරණයට ඉඩකඩ සලසන්න. මහෙස්ත්‍රාත්වරුන්ට ඒ විධියේ බලයක් තිබුණොත් ඒ අයගේ තත්ත්වය ගැන සලකන විට ඒ අය අසාධාරණයක් කළා යයි කිසිවකුට කියන්නට බැහැ. දහස් වාරයක් වැඩිපුර දඩ ගැසීමේ තර්ජනයක් මෙම පනතටම ඇතුළත් කළහොත් අද මේ රටේ ඇති වෙළඳ වංචනිකකම්වලින් භාගයක් පමණ අඩු වී යන්නට පුළුවනි. එසේ හෙයින් කොළොන්නාවේ ගරු මන්ත්‍රීතුමා (පී. බී. ඉලංගරත්න මයා.) විසින් ඉදිරිපත් කරන ලද සංශෝධනය භාර ගන්නා ලෙස මා ඉල්ලා සිටිනවා.

**එල්. සී. ද සිල්වා මයා.**
*(திரு. எல். சீ. டி சில்வா)*
(Mr. L. C. de Silva)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තේ වෙළඳ පොළේ ඇති වංචනික ක්‍රියා මෙම රජය පිළිගෙන ඇති බව මෙම විවාදයට කලින් සිදු වූ පරිපූරක මුදල පිළිබඳ විවාදයේදී ගරු ආහාර ඇමතිතුමා විසින් කරන ලද ප්‍රකාශයෙන් පෙනී යනවා. එකම තේ කොටස කීප වරක් වෙළඳ පොළට ඉදිරිපත් කිරීමේ දූෂණයක් තිබෙන බව රජය පිළිගන්නවා නම් ඒ වගේම එබඳු දූෂණ වැළැක්වීම සඳහා රජය සූදානම්ව සිටිනවා නම්, ඉදිරිපත් කර ඇති සංශෝධනය පිළිගන්නට බැරි මන්දැයි අප දැන ගන්නට කැමතියි. වුවමනා කරන්නේ තේ වෙළඳ පොළෙහි ඇති දූෂණ නැති කරන්නට නම් මෙම සංශෝධනය භාර ගන්නට අපහසුකමක් නැහැ. රුපියල් පණස් දාහක නැත්නම් ලක්ෂයක මුදලක් ලබන කෙනකුට රුපියල් දාහක දඩයක් ගෙවීම ඉතාමත්ම සුළු කාරණයක්. එසේ හෙයින් දූෂණයෙන් තොර වෙළෙඳ පොළක් ඇති කිරීමට ආශාවක් තිබෙනවා නම් කරුණාකර මෙම සංශෝධනය පිළිගන්න.

**එස්. ඒ. පීරිස් මයා.**
*(திரு. எஸ். ஏ. பீரிஸ்)*
(Mr. S. A. Peeris)

දැනට ඒක පිළිගන්නට අමාරුයි. අවශ්‍යතාවක් වුණොත් පසුව ඒ ගැන යෝජනාවක් ගේනවා.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

වැරදි කරන්නන්ට බරපතළ දඬුවමක් නොදුන්නොත් තමුන්නාන්සේලා බලාපොරොත්තු වන පරමාර්ථය ඉෂ්ට වන්නේ නැහැ. ඒ නිසා දහස් වාරයකින් වැඩි වූ දඩයක් වෙනුවට "සියක් වාරයකින් වැඩි වූ දඩයක්" යන්න යෙදීමෙන් වත් මෙය සංශෝධනය කරනවා නම් හොඳයි. එසේ නොකළහොත් මෙයින් ප්‍රයෝජනයක් වන්නේ නැහැ.
I do not mind if "one thousand times" is reduced to "one hundred times."

එම වචන එතැනට එකතු කළ යුතුය, යන ප්‍රශ්නය විමසන ලදී.

குறித்த சொற்கள் சேர்க்கப்படவேண்டுமெனும் வினா விடுக்கப்பட்டது.

*Question, that those words be there inserted, put.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**කටහඬවල් අනුව "විරුද්ධ" මන්ත්‍රීන්ට ජය බව කාරක සභා නියෝජ්‍ය සභාපති විසින් ප්‍රකාශ කරන ලදි.**

குரல்களின்படி "இல்லை" என்பவர்களுக்கு வெற்றியென உப அக்கிராசனர் அவர்களால் பிரகடனப் படுத்தப்பட்டது.

THE DEPUTY CHAIRMAN OF COMMITTEES *having collected the Voices, declared that the "Noes" had it.*

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்ஸா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

Divide!

**මන්ත්‍රී මණ්ඩලය 48 වන ස්ථාවර නියෝගය යටතේ—පක්ෂව 10; විරුද්ධව 34; යනුවෙන්—බෙදුණේ ය.**

*சபை, 48 ஆம் நிலையற் கட்டளையின் கீழ் பிரிந்தது. சார்பாக 10; எதிராக 34.*

*The House divided (under Standing Order No. 48): Ayes 10; Noes 34.*

**10 වන වගන්තිය කෙටුම්පත් පණතෙහි කොටසක් හැටියට තිබිය යුතුය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

**10 වන වගන්තිය කෙටුම්පත් පණතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදි.**

10 ஆம் வாசகம், மசோதாவின் பகுதியாக இருக்க வேண்டுமெனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப் பட்டது.

10 ஆம் வாசகம், மசோதாவின் பகுதியாக இருக்க வேண்டுமென ஆணையிடப்பட்டது.

*Question, that Clause 10 stand part of the Bill, put, and agreed to.*

*Clause 10 ordered to stand part of the Bill.*

## CLAUSE 11.—(*Offences by a body of persons.*)

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

I move,

"In page 4, leave out all words in lines 14 to 20."

ගරු සභාපතිතුමනි, මේ සංශෝධනය මා ඉදිරිපත් කරන්නට යෙදුණේ මේ නිසයි. යම් කිසි අවස්ථාවකදී යම් කොම්පැනියක කළමනාකාරවරයකුගේ අනු දැනුම නොමැතිව වරදක් සිදු වුණා නම් හෝ, වරදක් සිදු වීම වැළැක්වීම සඳහා කටයුතු කිරීමට ඔහු අපොහොසත් වුණා නම් හෝ, කොම්පැනියෙන් ඒ දඬය ගසන්න උපාය කියා තිබෙනවා. මම ඒ කොටස ඉංග්‍රීසියෙන් කියවන්නම්:

"Where any offence under this Act is committed by a body of persons, then—

(a) if that body of persons is a body corporate, every director and officer of that body corporate;

(b) if that body of persons is a firm, every partner of that firm; and

(c) if that body of persons is the English and Scottish Joint Co-operative Wholesale Society Ltd., the person for the time being holding the office of manager in Ceylon of that Society,

shall be guilty of such offence:

Provided that a director or an officer of such body corporate, or partner of such firm, or the person for the time being holding the office of manager in Ceylon of that Society, shall not be deemed to be guilty of such offence if he proves that such offence was committed without his knowledge or that he exercised all due diligence to prevent the commission of such offence."

කවුද මේක මනින්නෙ? පෞද්ගලික ආයතන ක්‍රියා කරන පිළිවෙළ ගැන තමුන් නාන්සෙ දන්නවා ඇති. කොම්පැනිවල කටයුතු කෙරෙන හැටි මම දීර්ඝ වශයෙන් විස්තර කරන්න යන්නෙ නැහැ. එහෙත් අපි දන්නවා, යම් කිසි කොම්පැනියක් වුණොත් එහි අධ්‍යක්ෂ මණ්ඩලයක් සිටින බව. ඔය අධ්‍යක්ෂ මණ්ඩලයෙ සිටින සමහර අධ්‍යක්ෂවරුන් ඒ ව්‍යාපාරයෙ එදිනෙදා කටයුතු සහ ගණන්හිලව් ආදිය බලා ගැනීම, බඩු ගැනීම, විකිණීම, පිටරට යැවීම, පිටරටින් ගෙන්වීම යනාදී එදිනෙද කටයුතු බලා ගැනීමට පත් වී සිටිනවා. ලංකාවෙ තිබෙන මොනම කොම්පැනියක වුවද, අධ්‍යක්ෂ මණ්ඩලයෙන් එක්කෙනෙක් දෙන්නෙක්වත් ඒ පිළිවෙළට එදිනෙදා කෙරෙන කටයුතු පිළිබඳව බලා කියා ගැනීමට පත් කර සිටිනවා. එසේ පත් කර සිටීමට වුවමනාමයි. ඒ මොකද? ඒ කොම්පැනියෙ වැඩ කටයුතු හරියාකාර කෙරෙනවාද නැද්ද කියා බලා ගැනීම අවශ්‍ය නිසයි. ඒ අධ්‍යක්ෂවරයා යටතේ විධායක බලතල තිබෙන විධායක නිලධාරීන් නොහොත් "එක්සකටිව්ස්" කියා තවත් නිලධාරි පිරිසක් ඉන්නවා. ඔය විධායක නිලධාරි පිරිස යටතේ තවත් කණිෂ්ඨ විධායක නිලධාරීන් සිටිනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයකොඩි මයා.]

කණිෂ්ඨ විධායක නිලධාරීන් යටතේ ලිපිකරුවන් පිරිසක් සිටිනවා. ලිපිකරුවන් යටතේ සුළු සේවක පිරිසක් සිටිනවා. ඔන්න ඔය ස්වරූපය තමයි ලංකාවෙ සෑම කොම්පැනියකම වාගෙ තිබෙන්නෙ.

මා දන්නා තරමට කොම්පැනියක, ව්‍යාපාරයක හෝ සමිතියක එදිනෙදා වැඩ කටයුතු ගැන කිව්වු සම්බන්ධතාවයක්, අවබෝධයක් නොමැති කිසිම අධ්‍යක්ෂවරයෙක් එම සමිතිවල ව්‍යාපාරවල නැහැ. ඒ අන්දමින් කටයුතු නොකරන එක අධ්‍යක්ෂවරයෙක්වත් නැති කිසිම ව්‍යාපාරයක් මේ රටේ නැහැ. එම නිසා තේ ව්‍යාපාරයේ ඕනෑම වංචාවක් කළොත්, ඕනෑම කැත වැඩක් කළොත්, මේ පනතෙ මේ වගන්තියෙ මා සඳහන් කළ කොටස තිබෙන තුරු, වංචාවක් කළාය කියා කවර අන්දමින්වත් ඔප්පු වුණත් නියම මිනිහ, වංචා සහගත පුද්ගලය බෙල්ලෙන්ම අල්ලා ගන්න විධියක් නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අන්දමේ උසස් නිලධාරීන් බේරන්න නීතිරීති සකස් කරන්නෙ ඇයි? කොම්පැනියක උසස් නිලධාරීන්, ඒ වාගේම රජයේ උසස් නිලධාරීන් බේරීමට නීතිරීති සකස් කරන්නෙ ඇයි?

දෙපාර්තමේන්තුවක උසස් නිලධාරියා දැනගන්න ඕනෑ, තමන්ගෙ දෙපාර්තමේන්තුවෙ අන්තිම පහත් නිලධාරියා දක්වා සිටින අය මත පැවරී ඇති වැඩ කටයුතු හරියාකාර කෙරෙනවාද නැද්ද කියා. "ඩෙලිගේෂන් ඔප් පවර්ස්" කියන ඒ විකාර ක්‍රමය නිසා වැරදිවලට අසු වෙන්නෙ සුළු නිලධාරීන් පමණයි. ඒ අන්දමටම පෞද්ගලික ආයතනවල උසස් නිලධාරීන්ට බේරෙන්න පුළුවන් විධියට නීතිරීති සකස් කරන්නෙ ඇයි? කොළඹ, සුදු කොම්පැනියක ලොකු මිනිහ එක පාරටම කීවොත්, "මගෙන් තේ ගන්න මිනිහ මොනව කළාද කියා මම දන්නෙ නැහැ, එන්ව්රි හදාපු ක්ලාර්ක් මොනව කළාද කියා මම දන්නෙ නැහැ, අඩ්වෙලෝරම් බද්ද පිළිබඳ ගණන් හිලව් හැදූ ක්ලාර්ක් මොනවා කළාද කියා මම දන්නෙ නැහැ" කියා, එතැනින් එහාට නඩුවක් නැහැ. පනතින් ඒ ආරක්ෂාව ඔවුන්ට සලසා තිබෙනවා. එහෙම නම් මම අහන්න කැමතියි, එවැනි ආරක්ෂාවක් ඔවුන්ට දුන්නෙ මන්ද කියා.

අ. භා. 4.15

මේ පනත සකස් කර තිබෙන්නෙ බොහෝ දුරට කල්පනා කර බලා බව මම දන්නවා. අප පිළිගන්නවා, "ලීගල් ඩ්‍රාෆ්ට්මන්" මහත්මය ඉතාම කල්පනාකාරිවයි මේ පනත හදා තිබෙන්නෙ. මේ රටේ තේ ව්‍යාපාරයට සම්බන්ධ සමූපකාර සමිතිවල නීතිරීති ගැන සොයා බලා, ඒ උදවියට එම නීතිරීති ගැළපෙන විධියටයි මේ පනත සකස් කර තිබෙන්නෙ. ඒ තරම් කල්පනාකාරීව පිරිසිදුව සොයා බලලයි මේ පනත සකස් කර තිබෙන්නෙ. ඒ සමගම තමුන්නාන්සෙලා ඉඩ සලසා තිබෙනවා ඕනෑම වංචාවක් කිරීමටත්. එවැනි උසස් පුද්ගලයෙක් කරන වැරදි වැරදි නොවේ යයි කියනවා. මා කලින් ඒ ගැන පැහැදිලි කළ නිසා නැවතත් ප්‍රකාශ කරන්න වුවමනා කරන්නෙ නැහැ, සිදුවන වංචාවල් මොනවාද කියා. අන්න ඒ නිසා මේ වගන්තිය සම්පූර්ණයෙන්ම ඉවත් කරන ලෙස ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

යම් වංචා ඇති වෙනවා නම් එසේ සිදුවන වංචා සුළු නිලධාරීන්ගේ ඇඟේ පටවන්න එපා. මම නිදර්ශනයක් වශයෙන් යාපනයෙ ගරු මන්ත්‍රීතුමා (ජී. ජී. පොන්නම්බලම් මයා.) පෙනී සිටි "ජැෆ්පර්ජ්" නඩුව ගැන සඳහන් කළා. යාපනයෙ ගරු මන්ත්‍රීවරයාගෙ දක්ෂකම නිසා ඒ පුද්ගලයන් බේරුණා. තෝරුන් බේරිලා භාල් මැස්සන් අසු වුණා. යාපනයෙ මන්ත්‍රීවරයා වැනි දක්ෂ නීතිඥයකු තරුණ මහෙස්ත්‍රාත්වරයා ඉදිරියට ගිහින් ඉංග්‍රීසි භාෂාවෙන් ටිකක් වේගවත්ව කථා කර කීවාම ප්‍රශ්නය එතැනින් ඉවරයි. මට මතකයි, එක් විධායක නිලධාරියෙක් සිහි නැතුව වැටුණා. මම හිතන්නෙ, තරුණ "ඇසිස්ටන්ට් කොමිෂනර්" කෙනෙක් ගියෙ. වෙළෙඳ ව්‍යාපාරිකයන්ට මේ රටේ එවැනි බලපෑමක් කරන්ට පුළුවන්. එහෙම නම් සුළු නිලධාරියෙක් එතැනට යවන්නෙ නැතිව කොමසාරිස්තුමාම ඇරියා නම් මොකක්ද වෙන්නෙ? එහෙම වුණා නම් සිහි නැතිව වැටෙන්නෙ නැහැ. මේ තරම් විශාල වංචාවක් සම්බන්ධයෙන් නිසා ස්ථිර ලේකම්තුමාම යවනව? නීත්‍යානුකූලව එසේ කරන්ට පුළුවන්ද මම දන්නෙ නැහැ. ස්ථිර ලේකම්තුමා යවන්ට බැරි නම් කොමසාරිස්තුමා යවන්ට තිබුණා. සුළු නිල

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ධාරියෙක් මේ වගෙ පතාක යෝධයෙක් ළඟට ගියාම ක්ලාන්තය හැදී වැටීමත් පුදුමයක්ද?

ලොකු වැරදි කරන්නෙ ලොකු අය බව අපි හිතේ තබා ගන්නට ඕනෑ. ලොක්කා කියන දේයි, සුළු සේවකයා කරන්නෙ. වංචාවන් නැති කිරීමේ අභිලාෂයෙන් මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කළා නම්, වංචා කරන්නට යන උදවියට නියම අන් දමට දඬුවම් ලැබෙන ආකාරයට මේ පනත් කෙටුම්පත සංශෝධනය කරන ලෙස ඉල්ලන අතර මේ සංශෝධනය භාර ගන්නා ලෙස ඉතා බැගෑපත්ව ඉල්ලා සිටිනවා.

**එල්. සී. ද සිල්වා මයා.**
*(திரு. எல். சீ. டி சில்வா)*
**(Mr. L. C. de Silva)**

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දිවුල පිටියෙ ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ සංශෝධනය ඉතා වැදගත් බව මා කියන්ට කැමතියි. ඒ මන්ත්‍රීතුමා සඳහන් කළ පරිදි ඒ කොටස එසේම තිබියදී මේ පනත් කෙටුම්පත සම්මත වුණොත්, ඒ පනතෙ කිසිම තේරුමක් නැතුව යනවා. මේ පනත් කෙටුම්පත අනුව යම් කිසි දූෂණයක් සම්බන්ධයෙන් වරදකරු ඒ දූෂණය මෙහෙයවූ විධායක නිලධාරියා නොවෙයි; කොම්පැණිය අයිතිකරුවන් නොවෙයි; සාමාන්‍ය සුළු සේවකයායි. මෙවැනි වංචාවලට වරදකරුවන් වන අයට දඬුවම් පැමිණවීමක් වශයෙන් රේගු නීති යටතේ ඔවුන්ගෙ බලපත්‍ර පවා අවලංගු කරන්නට බලාපොරොත්තු වෙනවාය කියා ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා කිව්වා. නමුත් මේ කොටස මෙම පනත් කෙටුම්පතින් ඉවත් නොකළහොත් නම් එසේ බලපත්‍ර අවලංගු කරන්නට කිසිම අවස්ථාවක් ලැබෙන්නෙ නැහැ. මේ පනත් කෙටුම්පත අනුව වරදකරු වන්නෙ අයිතිකරුවන්වත්, අධ්‍යක්ෂවරුන්වත් නොවෙයි; සාමාන්‍ය සුළු සේවකයනුයි. ඇත්ත වශයෙන්ම වරදකරුවන්ට දඬුවම් කිරීමේ බලාපොරොත්තුවෙන් මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කළා නම් එතුමා මේ සංශෝධනයට එකඟ වනවාට කිසිම අඩමානයක් නැහැ. එතුමාගෙ බලාපොරොත්තුව ඒ අයට මේ දූෂණ එසේම කරගෙන යන්නට ඉඩ තැබීම නම් ඒ කොටස එසේම තිබෙන්නට ඉඩ හැරියාට කමක් නැහැ. එවිට පුළුවන්කම ලැබෙයි නඩු පවරා සාමාන්‍ය සුළු සේවකයකුට සුළු දඬුවමක් ලබා දෙන්නට. නමුත් දූෂණ නම් එසේම පවතියි. එහෙම නැතුව එතුමා අදහස් කළ ආකාරයට බලපත්‍ර පවා අවලංගු කරන්නට බලාපොරොත්තු වෙනවා නම් මේ කොටස සම්පූර්ණයෙන්ම ඉවත් කරන්නට ඕනෑ. ඒ දූෂණ මෙහෙයවන අධ්‍යක්ෂවරුන් නිදහස් කිරීමට, ඒ කොම්පැණි ආරක්ෂා කිරීමට මේ කොටස මෙම පනත් කෙටුම්පතට ඇතුළත් කර තිබෙන බව අප කියා සිටිනවා. ඒ අතරම අප ඉල්ලා සිටිනවා, මේ කොටස මෙම පනත් කෙටුම්පතින් ඉවත් කරන හැටියට.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
**(Mr. Ilangaratne)**

මෙය ඉතා වැදගත් සංශෝධනයක්. මේ ගැන කල්පනාවෙන් කටයුතු කරන ලෙස මා ගරු ඇමතිවරුන් සියලු දෙනාගෙන්ම ඉල්ලා සිටිනවා. මේ පනත් කෙටුම්පතේ 11 වන වගන්තිය, 10 වගන්තියට අදාළයි. යම්කිසි කෙනෙක් වංචාවක් කළොත් ඔහුට කරන දඬුවම මොකක්ද කියා 10 වන වගන්තියෙන් කියා තිබෙනවා. අපේ අදහස නම් දඬුවම ප්‍රමාණවත් නොවන බවයි. එය නමුත්නාත්සේලාත් පිළිගත්තා. ඒ වගේම, ඒ සම්බන්ධයෙන් ක්‍රියා කරනවාය කියාත් කීවා. අපි එයින් සෑහීමට පත් වුණා. ඒ දඬුවම ලිහිල් වාගේම, 11 වන වගන්තිය අනුව ඒ වංචාකාරයන් අල්ලා ගන්නටත් බැරි වෙනවා. වරදකරුවන් අල්ලා ගන්නටත් බැරි නම්, දඬුවමත් බොහොම සැහැල්ලු නම් මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමේ කිසිම තේරුමක් නැහැ. මේ පනත් කෙටුම්පතේ 4 වන පිටුවේ 14 වන පේළියේ සිට 20 වන පේළිය දක්වා මෙසේ සඳහන් වෙනවා:

> "Provided that a director or an officer of such body corporate, or partner of such firm, or the person for the time being holding the office of manager in Ceylon of that Society, shall not be deemed to be guilty of such offence if he proves that such offence was committed without his knowledge or that he exercised all due diligence to prevent the commission of such offence."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

මේ සංශෝධනයෙන් කියන්නෙ, ඒ කොටස සම්පූර්ණයෙන්ම ඉවත් කරන ලෙසයි.

මේ වගන්තිය මෙහෙම තිබ්බොත් තමුන්නාන්සෙ පණින පිළවුන්ට ඉණිමං බැඳීමක් පමණයි, කරන්නෙ. මේ සියල්ලක්ම ඉදිරිපත් කර තිබෙන්නේ විශේෂයෙන්ම තේ ජාවාරමේ යෙදී සිටින මහත්වරුන්ගේ ඕනෑකම උඩයි. ඔබතුමාටත් හොඳට වැටහී තිබුනා, කලින් තිබුණු රේගු බද්ද හරියාකාර ක්‍රියාත්මක කරන්න බැරි නිසා ඊට වඩා හොඳින් ක්‍රියාත්මක කරන්න පුළුවන් එකක් ඇති කළ යුතු බව ගැනුම් කාරයාගෙන් අය කරගෙන ගැනුම් කාරයාගෙන් ඒක අය කළාය කියා රේගුවට කිව්වම රේගු අවසරය දෙනව. යම් කිසි වංචාවක් වුනොත් රේගුවෙන් වුණු වංචාවට වඩා දහස් ගුණයක පාඩුවක් රටට වෙනව. දිවුලපිටියේ මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මයා.) කිව්වා වගේ 'මැනේජර්' අල්ලන්නෙත් නැත්නම්, 'පාට්නර්' කෙනකු අල්ලන්නෙත් නැත්නම්, 'ඩිරෙක්ටර්' කෙනකු අල්ලන්නෙත් නැත්නම් කව්රු හරි පියන් කෙනකු ඉදිරිපත් කරයි, මෙයා තමයි මේක කළේ, මේ ගැන අපේ කිසිම වගකීමක් නැත කියා. ඒ පුද්ගලයත් වරද පිළිගන්න ඉදිරිපත් වෙයි; ඇයි, දඩ ගැහුවොත් රුපියල් දාහේ දඩය මහත් මයා පිටිපස්සෙන් ඇවිත් ගෙවන නිසා.

ඒ නිසා මේක වැදගත් යෝජනාවක්. තමුන්නාන්සේලාගේ හෘදය සාක්ෂිය කොයි විධියේ එකක්ද කියා මැණ ගන්න පුළුවන් යෝජනාවක් මේක. ඉස්සෙල්ල එක භාර ගත්තෙ නැති නිසා මේකෙන් වත් ඒ පාපය වසා ගන්න හොඳ අවස්ථාවක් ලැබිල තියෙනව. ඒ නිසා අපි තරයේ ඉල්ලා සිටිනවා, මේ 'ප්‍රොවයිසෝ' එක සම්පූර්ණයෙන්ම කපා දමන්නය කියා. එතකොට 'මැජිස්ට්රේට්' කෙනකුට හෝ පුළුවන් වෙයි, වැරදි කාරයා කව්ද කියා සොයා ගන්න. එතකොට තමයි, වෙළඳ ඇමතිතුමාට හෝ පාර්ලිමේන්තු ලේකම් තුමාට හෝ ඒ ලයිසන්ස් එක අවලංගු කරන්න පුළුවන් වන්නෙ. නැත්නම් කියයි, කොහොමද ලයිසන්ස් එක අවලංගු කරන්නෙ ඩිරෙක්ටර් කෙනෙක් අහුවෙලා නැත, අහු වෙලා තියෙන්නෙ කොල් ලෙක්ටය, රුපියල් දාහේ දඩයක් ගෙවා තිබෙනවය කියා. වංචා කාරයන්ට ඉණිමං බැඳීමක් මේ වගන්තියෙන් කෙරෙන්නෙ. මේක නිසා මේ පනතේ අදහස සම්පූර්ණයෙන්ම අහෝසි වෙනව. ඒ නිසා මම තරයේ ඉල්ලා සිටිනව, පක්ෂ භේදයෙන් තොරව කල්පනා කර බලා මේකට එකඟ වෙන්නය කියා.

**සිංගල්ටන්-සැමන් මයා.**

*(திரு. சிங்கல்டன்-சமன்)*

(Mr. Singleton-Salmon)

This is a provision that is usual in Bills of this sort and, although I cannot remember any particular Bill, I would almost guarantee to bring forward one that was passed during the regime of the hon. Member for Kolonnawa (Mr. Ilangaratne). I am willing to bet that some of the Bills passed during his regime contained this same proviso.

The mistake they are making, in my opinion, is that the directors or the partners are considered to be guilty unless they can prove themselves not guilty. That is very different from the Commissioner having to prove them guilty. Under the Bill as it stands they are guilty of the offence unless they can prove their innocence. It is opposite to most of our laws where you are presumed to be innocent unless the prosecution can prove you guilty. In these cases you are presumed to be guilty because the offence has been committed by your company or firm unless you can prove that it was done without your knowledge or that you exercised due diligence. That proof lies on the director or the partner and it has got to be very good proof to convince the magistrate. I am certainly dead against this amendment.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ජයකොඩි මයා.**
(திரு. ஜயக்கொடி)
(Mr. Jayakody)

ගරු සභාපතිතුමනි, පත් කළ මන්ත්‍රීතුමාගේ කථාව පුදුම කථාවක්. එතුමා වෙළඳ ව්‍යාපාරයක අධ්‍යක්ෂ වරයෙක්. වෙළඳ ව්‍යාපාර ගැන හොඳ අවබෝධයක් ඇති කෙනෙක්. මම එතුමාගෙන් එක ප්‍රශ්නයක් අහන්න කැමතියි. එතුමාගේ කොම්පැනියෙන් රජයට වංචාවක් සිදු වෙලා තියෙනවා නම් තමාගේ ඇඟ බේරා ගෙන තමා යටතේ සේවය කරන පුද්ගල යාව බැම්මට දෙන්න එතුමා කැමතිද කියා මම අහන්න කැමතියි. වගකීමක් ඇති විධායක නිලධාරියෙක් නම් තමන් සූදානම් වන්න ඕනෑ ඒ වගකීම භාර ගන්න. මෙයින් පෙනෙන්නෙ රජය ඉතාමත්ම ඕනෑකමින් මේ වගන්ති ඇතුළත් කර තිබෙන්නේ මේ ව්‍යාපාරයේ ඉන්න ලොකු මිනිසුන් ටික බේරා ගන්න බවයි.

**සිංගල්ටන්-සැමන් මයා.**
(திரு. சிங்கல்டன்-சமன்)
(Mr. Singleton-Salmon)

This provision is found in other Bills of this type.

**ජයකොඩි මයා.**
(திரு. ஜயக்கொடி)
(Mr. Jayakody)

එහෙම නම් එවැනි පනත් මොනවාද කියා මම දැන ගන්න කැමතියි. කරුණා කර ඒවා නම් කරන්න. එතකොට අපටත් පෙනෙයි තමුන්නාන්සෙ ඉදිරිපත් කරන තර්කයෙ සත්‍යතාවයක් තිබෙනවාද කියා. There are other Bills කිව්වට මදි. විධායක නිලධාරියකු ඉන්නව නම් ගනුදෙනුවක සෑම පියවරක් ගැනම ඔහුට අවබෝධයක් තියෙන්න ඕනෑ. පොල් තෙල් ජාවාරමක් කරනව නම් ඒ ජාවාරමේ සෑම වෙළඳ කටයුත්තක් ගැනම අවබෝධයක් විධායක නිලධාරිය ලබා ගන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වංචාවල් සිදුවී තිබෙනවා නම්, රජයට හොරෙන් වංචාවල් සිදුවී තිබෙනවා නම් ඒ සෑම වංචාවක්ම කෙරී තිබෙන්නෙ ඔය කොම්පැනිවල අධ්‍යක්ෂවරුන්ගෙ අනුදැනුම ඇතිවයි. එය දැන් මේ ගරු සභාවෙ ඔප්පු වෙනවා. ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාත් එය පිළිගන්නවා. එමනිසා අවසානයේදී සුළු සේවකයකුගෙ කරපිටට, යතුරු ලියන්නෙකුගෙ කර පිටට එහෙම නැත්නම් එන්ට්‍රියක් පාස් කරන්ට යන රේගුවෙ මහත්මයෙකුගෙ නැත්නම් රිසිට් හදන පුද්ගලයකුගෙ කර පිටට මේව දමා ඒ අයව මේවට අල්ල ගන්න ඉඩ තබන්න එපා. වංචාවල් කරන මූලිකයින්, මහ මෝරුන් අල්ලා ගැනීමට මේ ආණ්ඩුව තුළ අභිලාෂයක් තිබෙනවා නම් අප මේ ඉදිරිපත් කළ සංශෝධනය පිළිගන්නවා ඇති.

**ඉලංගරත්න මයා.**
(திரு. இலங்கரத்னே)
(Mr. Ilangaratne)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ කාලෙත් මේ විධියටම තමයි තිබුණේ කියා ගරු පත් කළ මන්ත්‍රීතුමා කිව්වා. ඒ ගැන උදාහරණයක් පෙන්වා දෙන්නට මට මේ අවස්ථාවේදී පුළුවන්කමක් නැහැ. හොඳයි, ඒ කාලෙ එහෙම තිබුණත් අපි දැන් පාඩම් රාශියක් ඉගෙන ගෙන තිබෙනවා. නොයෙකුත් ප්‍රෝඩාවල් කරන්නෙ මේ විධියෙ සිදුරු තිබීම නිසයි. එමනිසා මේ සංශෝධනය පිළිගන්නා මෙන් මා ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා. [බාධා කිරීමක්] පත් කළ ගරු මන්ත්‍රීතුමා (සිංගල්ටන්-සැමන් මයා.) ඉතින් හැමදාම රජකම් කළා නොවැ. සමාජවාදී ප්‍රශ්නවලදී එතුමා ඒ කාලෙ හීන් සැරේ නාන කාමර යට යනව. අද නම් කෙළින්ම ඇවිත් වාඩිවී ඉන්න පුළුවන්කම තිබෙනවා.

මේ සිදුර වසා දමන මෙන් මා ඉල්ලා සිටිනවා. දූෂණකම් කළ මිනිසුන්, වංචා කළ මිනිසුන් කව්ද කියා අපි දැන් දන්නවා. ඔවුන්ට තවදුරටත් දූෂණ ක්‍රියා කරන්ට ඉඩක් නොලැබෙන සේ නීතියෙහි තිබෙන සිදුරු වසා දමන්ටයි අපි ආවෙ. අපි බලයට පත් වුණොත් මීටත් වැඩි උනන්දුවකින් ඒ සිදුරු වහනවා. අල්ලස් ගත් මිනිසුන් දැන් කෙලවරක් නැතිව ඉන්නවා. කවුද අහු වෙලා ඉන්නෙ? ඒ පැත්තෙ අය තමයි වැඩි පිරිස. සමුපකාර තොග වෙළඳ ආයතන කොමිෂන් සභාවෙ වාර්තාවක් දැන් තිබෙනවා. හොර චෙක්පත් දුන්නෙ කව්ද, බ්ලැන්ක් චෙක්පත් දුන්නෙ කව්ද යනාදී සියලුම විස්තර දැන් හෙළි වෙනවා. පාත්තර හොරු කවුද කියා අපි දන්නවා. ඔවුන් තවමත් මේ ආණ්ඩුවෙ උසස් තැන්වල ඉන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

නව. එමනිසා ඒ සිදුරු වහන්නයි අපට වුවමනා කරන්නෙ. තව දුරටත් මේ සිදුරු තිබීමට ඉඩ හැරියොත් වංචනික පුද්ගල යින් තව තවත් මේවායින් අයථා ප්‍රයෝජන ගන්නව. අප ඉදිරිපත් කරන මේ සංශෝධනය භාර ගත්තොත් තමයි තමුන් නාන්සේලාට මේ පනත නියම විධියට ක්‍රියාත්මක කරන්ට පුළුවන් වෙන්නෙ. දූෂණ ගැන කථා කළ බොහෝ දෙනා ගැන අපි දන්නව. අද ඒ අයගෙ කටවල් වැහිල. ඇයි, ඒ අය අද ඉන්නෙ ඔය පැත්තෙ. තමුන්නාන්සේලාගේ ආධාර කාරයින්ට මේ සිදුරුවලින් අයථා ප්‍රයෝජන ගැනීමට ඉඩ දෙන්ට වුවමනා නම් මේ වගන්තිය මේ ආකාරයටම තබා ගත්තාට කමක් නැහැ. එහෙම නොවෙයි නම් අප ඉදිරිපත් කරන මේ සංශෝධනය භාර ගන්න. මේ සංශෝධනය භාර ගන්නා මෙන් අප තදින්ම ඉල්ලා සිටිනවා.

**කාරකසභා නියෝජ්‍ය සභාපති**
*(குழுக்களின் உப அக்கிராசனர்)*
(The Deputy Chairman of Committees)

Is the hon. Parliamentary Secretary accepting this amendment ?

**එස්. ඒ. පීරිස් මයා.**
*(திரு. எஸ். ஏ. பீரிஸ்)*
(Mr. S. A. Peeris)

No. This is a provision that is found in Bills of this type.

අත්හැරීමට යෝජනා කළ වචන වගන්තියේ කොටසක් හැටියට තිබිය යුතුය යන ප්‍රශ්නය විමසන ලදී.

කටහඬවල් අනුව "පක්ෂ" මන්ත්‍රීන්ට ජය බව කාරක සභා නියෝජ්‍ය සභාපති විසින් ප්‍රකාශ කරන ලදී.

விடப்படவேண்டுமெனப் பிரேரிக்கப்பட்ட சொற்கள் வாசகத்தின் பகுதியாக இருக்குமாக எனும் வினா விடுக்கப்பெற்றது.

குரல்களின்படி "ஆம்" என்பவர்களுக்கு வெற்றியென குழுக்களின் உப அக்கிராசனரால் பிரகடனப் படுத்தப்பட்டது.

*Question, that the words proposed to be left out stand part of the Clause, put.*

THE DEPUTY CHAIRMAN OF COMMITTEES, *having collected the Voices, declared that the "Ayes" had it.*

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி சொய்ஸா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

Divide !

කාරක සභාව 48 වන ස්ථාවර නියෝගය යටතේ —පක්ෂව 26 ; විරුද්ධව 9 ; යනුවෙන්—බෙදුණේය.

குழு, 48 ஆம் நிலையற் கட்டளையின் கீழ் பிரிந்தது. சார்பாக 26 ; எதிராக 9.

*The Committee divided (under Standing Order No. 48) : Ayes 26 : Noes 9.*

11 වන වගන්තිය කෙටුම්පත් පණතෙහි කොටසක් හැටියට තිබිය යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

11 වන වගන්තිය කෙටුම්පත් පණතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

11 ஆம் வாசகம், மசோதாவின் பகுதியாக இருக்கவேண்டுமெனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப் பட்டது.

வாசகம், மசோதாவின் பகுதியாக இருக்கவேண்டுமென ஆணையிடப்பட்டது.

*Question, that Clause 11 stand part of the Bill, put, and agreed to.*

*Clause ordered to stand part of the Bill.*

එකල්හි වේලාව අ. භා. 4.30 වූයෙන්, මන්ත්‍රී මණ්ඩලයට ප්‍රගතිය වාර්තා කරනු පිණිස කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් විය.

කාරක සභාව ප්‍රගතිය වාර්තා කරයි; නැවත රැස් වීම 1967 ජූනි 2 වන සිකුරාදා.

நேரம் பி. ப. 4.30 மணியாகிவிடவே, குழுவின் பரிசீலனை பற்றி சபைக்கு அறிவிக்கும் பொருட்டு குழுக்களின் உப அக்கிராசனர், அக்கிராசனத்திலிருந்து நீங்கினார்.

குழுவினது பரிசீலனை அறிவிக்கப்பட்டது ; மீண்டும் கூடுவது: 1967 ஜூன் 2 ஆம் தேதி வெள்ளிக்கிழமை.

*It being 4.30* P.M., THE DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair to report progress.*

*Committee report Progress ; to sit again on Friday, 2nd June 1967.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## කල් තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

යෝජනාව ඉදිරිපත් කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදි:

"මන්ත්‍රී මණ්ඩලය දැන් කල් තැබිය යුතුය"—[ගරු ජේ. ආර්. ජයවර්ධන].

"சபை இப்பொழுது ஒத்திவைக்கப்பெறுமாக".—[கௌரவ ஜே. ஆர். ஜயவர்தன] எனும் பிரேரணை பிரேரிக்கப்பட்டு, வினா எடுத்தியம்பப்பெற்றது.

*Motion made, and Question proposed.*

"That the House do now adjourn".—[*The Hon. J. R. Jayewardene.*]

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ප්‍රශ්නයක් මතු කළ යුතුව තිබෙනවා. කෘෂිකර්ම අධ්‍යාපනයක් දීම පිණිස අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් එක එක මන්ත්‍රී කොට්ඨාශයෙන් එක එක ගුරුවරයා බැගින් තෝරා ගත්ත. ඒ අනුව 1967 සිට හොරණ, වල්පිට හා ලබුදූව කියන ස්ථානවලදී එසේ තෝරා ගනු ලැබූ අයට ඒ අධ්‍යාපනය දුන්නා. ඒ අන්දමට එක එක ඡන්ද කොට්ඨාශයෙන් එක එක ගුරුවරයා බැගින් තෝරා ගන්නා විට ඒ සඳහා ශිෂ්‍ය ගුරුවරුනුත් තෝරාගනු ලැබුවා. එසේ ඔවුන් කෘෂිකර්ම පාසැල්වලට බඳවාගෙන මාස ගණනක් අධ්‍යාපනයත් දීගෙන ගොස් ටික කලක් ගතවුණාට පසුව දැන් නීතියක් හදා තිබෙනවා ශිෂ්‍ය ගුරුවරුන්ට ඒවාට ඇතුළත් වන්නට බැරිය කියල. 1967 ජනවාරිවල සිට එසේ ඇතුළත් කර ගනු ලැබූ ශිෂ්‍ය ගුරුවරුන් විසින් නේවාසික ගාස්තුව වශයෙන් මසකට රුපියල් 40 බැගින් ගෙව්ව. ඔවුන්ට මසකට ලැබුණේ රුපියල් 100 යි. නේවාසික ශිෂ්‍යයින් වශයෙන් මසකට රුපියල් 40 බැගින් "හොස්ටල්" එකට ගෙව්ව. එමෙන්ම ඒ සඳහා අවශ්‍ය පොත්පත් රාශියකුත් ඔවුන්හට මිල දී ගන්නට සිදු වුණා. එසේ කර මාස 4 කට පසුව දැන් නියමයක් කර තිබෙනව එම අධ්‍යාපනය දීම සඳහා ශිෂ්‍ය ගුරුවරුන් බඳවා ගැනීම තහනම්ය, ඒ නිසා ඒ අය ආපසු ගෙදර යා යුතුය කියල. ඔවුන් මේ මාස 4 ට රුපියල් ණය සියයක් හත් සියයක් පමණ ණය වී සිටිනව. පොත්පත් ගැනීමටත් "හොස්ටල්" එකට ගෙවීමටත් ණය වී සිටින නිසා ඔවුන් දැන් අනාථ තත්ත්වයකට පත් වී සිටිනව. ඒ නිසා ගරු අධ්‍යාපන ඇමතිතුමා හෝ ගරු කෘෂිකර්ම ඇමතිතුමා මේ ගැන සොයා බලා යම්කිසි සහනයක් සලසන්න.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

මොකකටද ගත්තේ ?

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

කෘෂිකාර්මික අධ්‍යාපනයක් දීම සඳහා ශිෂ්‍ය ගුරුවරුන් බඳවා ගත්ත. මාස 4 කට පසුව නීතියක් දමා තිබෙනව ඒ සඳහා ශිෂ්‍ය ගුරුවරුන් බඳවා ගන්න බැරිය කියල.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

බඳවා ගත්තෙ අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන්ද ?

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

ඔව්. දැන් ඒ අය අනාථවෙලයි සිටින්නෙ. ඔවුන් මාස 4 ක් වැඩ කරලත් තිබෙනව. දැන් ඔවුන් ණය වී සිටිනව. ඒ නිසා ඔවුන්ට යන්නය කියනවා නම් ඒ සඳහා අලාභය හෝ වෙනයම් දීමනාවක් හෝ දෙන්න.

අ. භා. 4.35

**ආර්. ජේ. ජී. ද මැල් මයා.** (දෙවිනුවර)
*(திரு. ஆர். ஜே. ஜீ. டி மெல்—தெவினுவர)*
(Mr. R. J. G. de Mel—Devinuwara)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ටොන් 3½ රේ ධීවර යාන්ත්‍රික බෝට්ටු 250 ක් මේ රටේ ධීවර ප්‍රදේශ අතර බෙදා හැරීමට යන බවට නිවේදනයක් ධීවර අධ්‍යක්ෂතුමා විසින් නිකුත් කර තිබෙනව. ඒ නිවේදනය අනුව මේ ධීවර යාන්ත්‍රික බෝට්ටු දෙකක් මැයි මස 1 වැනි දිනට වයස

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ද මැල් මයා.]

අවුරුදු 21 ට වැඩි නියම ධීවර කාර්මිකයින්ට පමණයි. මේ ප්‍රශ්නය සම්බන්ධව ගරු ධීවර ඇමතිතුමාගේ අවධානය යොමු වීම පිණිස කරුණු දෙක තුනක් ඉදිරිපත් කිරීමට මා බලාපොරොත්තු වෙනව.

පළමුවැනි කරුණ නම් සමහර ප්‍රදේශවලට ප්‍රමාණවත් ඉල්ලුම් පත්‍ර සංඛ්‍යාවක් ලැබී නැති එකයි. විශේෂයෙන්ම දෙවිනුවර. ගන්දර, කෝට්ටෙගොඩ, දික්වැල්ල, නිල්වැල්ල, කුඩාවැල්ල ආදී ප්‍රදේශවලට ප්‍රමාණවත් ඉල්ලුම් පත්‍ර සංඛ්‍යාවක් ලැබී නැති බව සඳහන් කරන්නට ඕනෑ. ඒ නිසා ඒ ප්‍රදේශවලට ඇති තරම් ඉල්ලුම් පත්‍ර ප්‍රමාණයක් යවන ලෙස මා ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිනව.

ඊළඟ කරුණ නම් මේ ඉල්ලුම් පත්‍ර බාර ගන්නා අවසාන දිනය වශයෙන් නියම කර තිබෙන්නේ ජූනි මස 1 වැනි දායි. ඒ අනුව ඉල්ලුම් පත් එවීමට දී ඇති කාලය මදිය කියා මා හිතනව. ඒ නිසා ඉල්ලුම් පත්‍ර කැඳවීමේ අවසාන දිනය ජූලි මස 1 වැනි දා දක්වා දික් කරන්නය කියා මා ඉල්ලා සිටිනව. මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් සිංහල පුවත්පත් මගින් එතරම් හොඳ ප්‍රචාරයක් කෙරී නැති නිසා ඒ අඩුපාඩුව සම්පූර්ණ කිරීම පිණිස සිංහල පුවත්පත් මගින් පුළුල් ප්‍රචාරයක් කරන ලෙස ඉතා කරුණාවෙන් මා ඉල්ලා සිටිනව. රජයේ නිලධාරීන්ගේ මොලය ගමන් කරන්නේ මොන ආකාරයටද යන්න රජයේ නිලධාරියකු වශයෙන් සිටි මම හොඳ හැටි දන්නව. මෙවැනි දේවල් සම්බන්ධ දැන්වීම් රජයේ ගැසට් පත්‍රයෙහි පමණක් පළ කිරීම සෑහෙනවයයි රජයේ නිලධාරීන් කල්පනා කරනව. එහෙත්, දුප්පත් ධීවර කාර්මිකයින් ගැසට් පත්‍රය කියවන්නෙ නෑ. සිංහල පුවත්පත් මගින් මේ ගැන හොඳ ප්‍රචාරයක් කරන ලෙස මා ඉල්ලා සිටින්නෙ ඒ නිසයි.

මෙහි තවත් කරුණක් පෙන්වා දිය යුතුව තිබෙනව. දැන් අලුත් බෝට්ටු දීමේ අදහසක් ඇති වී තිබෙන නමුත් 1965 දී ආධාර මුදල් සම්මත වුණු බෝට්ටු තවමත් දීල නැහැ. නොයෙක් හේතු නිසා එය ප්‍රමාද වී තිබෙනව. මා මෙය කියන්නෙ කිසිවකුට චෝදනාවක් කරන්න නොවෙයි. 1965 දී සම්මත වුණු බෝට්ටු ගන්දර, කෝට්ටෙගොඩ, නිල්වැල්ල ආදී ප්‍රදේශවලට තවමත් ලැබී නැහැ. ඉල්ලුම් පත් කැඳවීමේදී, කලින් සම්මත වුණු බෝට්ටුවලට ප්‍රමුඛත්වය දීම හොඳ යයි මම අදහස් කරනව.

අලුත් බෝට්ටු බෙදා හැරීමෙදි පසුගිය වතාවේ ගත් ණය ඉක්මනින් ගෙවූ ප්‍රදේශවල අයට ප්‍රමුඛත්වය දෙන බවක් අපට ආරංචි වී තිබෙනව. එය ඉතාම හොඳ වැදගත් අදහසක් වුවත් ඒ ගැන වචනයක් කිව යුතුව තිබෙනව. යාන්ත්‍රික බෝට්ටු ලබාගත් ඇතැම් පළාත් වල අය ඒව යෙදවූයේ ධීවර කර්මාන්තය සඳහා නොවෙයි. වැල්වෙට්ටිතුරේ ආදී ප්‍රදේශවල යාන්ත්‍රික බෝට්ටු පාවිච්චි කරන ලද්දේ ධීවර කර්මාන්තයට නොව ඊට වඩා විශාල ලාභ ගන්නට පුළුවන් වෙනත් කර්මාන්ත සඳහායි. ඒ නිසා එම ප්‍රදේශවල අය ඉක්මණින් ණය ගෙව්වා. එම නිසා, ඒ අනුව ප්‍රමුඛත්වය නොදී, සාධාරණ කරුණු කල්පනාවට ගෙන කටයුතු කරන ලෙස මා මතක් කරනව. මුළු රටටම බෙදා දෙන්නට යන්නෙ බෝට්ටු 250 යි. ධීවර ඇමතිතුමා එතුමගෙ දෙපාර්තමේන්තුව ඉතා හොඳින් පාලනය කරන බව කවුරුත් දන්නව. පසුගිය වතාවල බෝට්ටු බෙදා හැරීමේ දී නොයෙක් විධියෙ දූෂණ ඇති වුණු බව ප්‍රචාරය වී තිබෙනව. එම නිසා මේ අවස්ථාවෙදි ඉතාමත් හොඳින්, සාධාරණ පිළිවෙළට, නියම සැලැස්මක් හා ක්‍රියා මාර්ගයක් ඇතිව මේ බෝට්ටු බෙදා දෙන ලෙස මම ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිනව.

I would also like to raise the question of the alarming decline in the prices of natural rubber in the world market. The alarming decline in the prices of natural rubber has been due to a number of causes. For instance, there is supposed to be a strike of the rubber workers in the United States and, in addition, there is the usual release from the stockpile by the General Services Administration of the U. S. A. Further, there is a great deal of cheap Indonesian rubber available in the Singapore market. In fact, but for the Chinese and Russians buying in Singapore, the market would be depressed further.

I raised this question a few days ago on the Adjournment and said that we would like to have a detailed

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

and complete statement from the Government on the implications for Ceylon of Britain's proposed entry into the European Economic Community and the successful conclusion of the Kennedy Round of Tariff Talks in Geneva. We have still not got such a statement. We understand that Malaya is very alive and alert to this problem and that the Minister of Commerce of Malaya has already addressed the nations that signed the agreement at GATT in the Kennedy Round Talks asking that a minimum price be set for natural rubber in the same way as the United States has got a minimum price fixed for their wheat.

I do not know whether our Ministry of Commerce is asleep or awake. I would ask the Ministry of Commerce to take this matter up. The Minister of Commerce of Malaya has already taken this question up after the successful conclusion of the Kennedy Round of Tariff Talks. They have asked for a minimum guaranteed price for natural rubber. If the United States can get a minimum guaranteed price for her wheat from the 54 nations assembled at GATT in Geneva, why should we not ask for a minimum guaranteed price for our natural rubber ? I would earnestly ask the hon. Parliamentary Secretary to take this question up in consultation with Malaya and make a joint approach on the subject.

ප. භා. 4.43

ලෙස්ලි ගුණවර්ධන මයා.

(திரு. லெஸ்லி குணவர்தன)

(Mr. Leslie Goonewardene)

It has been brought to my notice that, in connection with the Agricultural-Industrial Exhibition scheduled to be held in Jaffna towards the end of July, the management of a private educational institution, namely, St. John's College, had signed an agreement which would result in considerable financial gain to that private institution. I am informed that the Additional Government Agent, Jaffna, is the person who has done this. I have no objection to the Additional Government Agent trying to do something for his old school, but I do not see any reason why this advantage should not accrue to a Government institution.

I understand that under the agreement that has been entered into between the Government and St. John's College, St. John's College is to get the rents from private stall holders, the profits from gambling stalls, and the profits from refreshments including alcoholic drinks. All these collections, in their entirety, are to go to the St. John's College Welfare Association.

There are a large number of other State institutions in this area. For example, there is the Jaffna Central College, which is even more central for the purpose of the exhibition than St. John's College. There are other institutions which are equally central —Vembodi Girls' School, Jaffna Hindu College, and so on. I believe the reason given by the Ministry is that this is to take place during the school term and that St. John's College has agreed to close early.

But I do not know whether that is a valid reason, because even St. John's College will have to get the permission of the Education Department to close early as they have to stick to the curriculum, and so on. There is no difficulty about one of the State institutions closing early. I have been informed that the proceeds are likely to amount to nearly a lakh of rupees. Therefore I would like the Hon. Minister who is concerned in this matter—maybe either the Hon. Minister of Industries or the Hon. Minister of Agriculture—to look into this question and see whether one of the State schools cannot be closed a little earlier than the usual time and allow this money to come to the State and not let it go to a private institution.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 4.46

**එච්. ජී. ඒ. කාරියවසම් මයා.** (බෙන්තර-ඇල්පිටිය)

*(திரு. எச். ஜீ. ஏ. காரியவசம்—பெந்தர—எல்பிற்றிய)*

(Mr. H. G. A. Kariyawasam—Bentara-Elpitiya)

ජනසතු සේවා ඇමතිතුමාගෙන් මීට කලිනුත් අසන ලද ප්‍රශ්නයක් නැවත වරක් අසන්ට තිබෙනව. පිටිගල, ඉදිපලේගොඩ, කේ. අයි. ධර්මසේන මහත් මයා ලංගමයෙ සේවය කළ රියැදුරෙක්. ජනවාරි 8 වන දින ඔහුට නඩුවක් තිබුණු නිසා සේවයට එන්ට බැරි වුණා. ඒ හේතුව උඩ ඔහු සේවයෙන් අස් කළා. ඔහුට උසාවියෙන් ලැබුණු ලියකියවිලිත් රැගෙන මම ගිහින් ගරු ඇමතිතුමා හමු වෙලා මේ ගැන කිව්ව. එතුමා ඒ ලියකියවිලි බලා වහාම ඔහුට රැකියාව දෙන්ටය කියා නියෝග කළා. අර සේරම ලියවිලි අමුණා සභාපති තුමාට යැව්ව. නමුත් අද වන තුරු ඔහුට රක්ෂාව ලැබී නැහැ. දැන් මාස 5ක් විතර ගත වෙලා තියෙනව. මේ පිළිබඳව මීට ප්‍රථමත් මවිසින් මතක් කර දෙන්ට යෙදී තිබෙනව. මා කියා සිටිනව එදා ගත්ත ලියවිලි ටිකවත් ආපසු ලැබෙන්ට සලස්වන්ටය කියා. ඔහුට රක්ෂාව දෙන්ටය කියා ඇමතිතුමා නියෝග කළත් සභාපතිතුමා එම ඉල්ලීම සම්පූර්ණයෙන්ම පැත්තකට විසිකර තිබෙන බවයි පෙනෙන්නෙ. මේ මහත්මයාට නීත්‍යනුකූලව ක්‍රියා කිරීමටවත් අද ලියකියවිලි ළඟ නැහැ. එම නිසා ඒ ලියවිලි ටිකවත් ලැබෙන්ට සලස්වන්ටය කියා ගරු ඇමතිතුමාට දන්වන මෙන් මා මෙතන සිටින ඇමතිතුමන්ලාගෙන් ඉල්ලා සිටිනව.

**ගරු ආචාර්ය ඩබ්ලිව්. දහනායක (ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති)**

*(கௌரவ கலாநிதி டபிள்யூ. தகநாயக்க—உள்நாட்டு விவகார அமைச்சர்)*

(The Hon. Dr. W. Dahanayake—Minister of Home Affairs)

With regard to the question raised by the hon. Member for Panadura (Mr. Leslie Goonewardene), I have been trying to get information but we have not been able to do so. I will call for an immediate report and inform the hon. Member for Panadura what the correct position is.

අ. භා. 4.48

**ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන (කර්මාන්ත හා ධීවර ඇමති)**

*(கௌரவ டீ. பீ. ஆர். குணவர்தன—கைத்தொழில், கடற்றொழில் அமைச்சர்)*

(The Hon. D. P. R. Gunawardena—Minister of Industries and Fisheries)

දෙවිනුවර ගරු මන්ත්‍රීතුමා (ද මැල් මයා) අසන ලද ප්‍රශ්නයට පිළිතුරු දෙන්ට කැමතියි. පසුගිය වැඩ පිළිවෙළ අනුව ටොන් තුනහමාරේ යාන්ත්‍රික බෝට්ටු දීමට සකස් කර තිබුණු ක්‍රියා මාර්ගය එතරම් සතුටුදායක නොමැති නිසා එය වෙනස් කරන්ට ඕනෑය කියා පිළිගෙන තිබෙනව. ඒ මන්ද, එම බෝට්ටු බොහොමයක් ලැබිල තිබුණේ මුදලාලිලාටයි. තමන් විසින්ම බෝට්ටු පාවිච්චි කරමින් මස් මරන්ට යන අයට නොවෙයි, එම බෝට්ටු ලැබී තියෙන්නෙ. එම නිසා අපි ඒ ගැන කල්පනා කර බලා දැනට අමුතු වැඩ පිළිවෙළක් යොදාගෙන යනව. එම බෝට්ටුවල ගොස් වැඩ කරන, මස් මරන්ට වෙහෙසෙන උදවිය අතටම එම බෝට්ටු ලැබෙන්ට කටයුතු පිළිවෙළ කරන්ට යනව.

මීට පෙර එම බෝට්ටු දුන්නෙ ලොතරැයි ක්‍රමයටයි. එක පවුලෙම තිදෙනකුට මෙම ලොතරැයි මගින් බෝට්ටු ලැබී තිබෙන බව සමහර අවස්ථාවලදී දැන ගන්ට ලැබී තිබෙනව. එය කොහොම වුණාද කියන්ට දන්නෙ නැහැ. ලොතරැයි 3ක් එක පවුලකට ලැබෙන්ට ඒ පවුල බොහොම වාසනාවන්ත වෙන්ට ඕනැ. එම නිසා අපි කල්පනා කළා එම වැඩ පිළිවෙළ වෙනස් කරන්ට ඕනෑය කියා.

මස් මැරීමෙහි යෙදෙන කොටස්වලට සුදුසුකම් අනුව මේ බෝට්ටු දීමෙ වැඩ පිළිවෙළක් ක්‍රියාවට යොදාගෙන යනව. හැබැයි, මෙම වැඩ පිළිවෙළ පිළිබඳව දී ඇති ප්‍රචාරය මදි නම් අපි ලැස්තියි තව ටිකක් කල් දමා තව දුරටත් ප්‍රචාරයක් දෙන්ට. ඒ සඳහා අවශ්‍ය ප්‍රචාරක කට යුතු කරන්ට ධීවර දෙපාර්තමේන්තුව සූදානමින් සිටිනව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරණ බෝට්ටුවලින් තව 95 ක් පමණ ඉතිරිව තිබෙනව. ඒව ඒ පරණ විධියටම දෙන්ට අපි කල්පනා කරනව. අළුත් විධියට දෙන්ට අදහස් කරන්නෙ 250සි. දුන් වෙනදට වඩා කවුරුත් යාන්ත්‍රික බෝට්ටු පාවිච්චි කරන බව පේනව. මාලු ඇල්ලීමට ඉස්සර තිබුණු බෝට්ටුවලට වඩා යාන්ත්‍රික බෝට්ටු ආධාරකාරී වන බව අපට දැනගන්ට ලැබී තිබෙනව. ඒ සඳහා දෙන ප්‍රචාරය මදි නම් තව ටිකක් කල් දී ප්‍රචාරය කරන්ට අපි ලෑස්තියි.

අ. භා. 4.50

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමා (ඉලංගරත්න මයා.) ඉදිරිපත් කළ කරුණ සම්බන්ධයෙන් කෘෂිකර්ම අමාත්‍යාංශයට වගකීමක් නැහැ. අපි කර තිබෙන්නෙ අධ්‍යාපන දෙපාර්තමේන්තුවට ගුරුවරුන් පුහුණු කිරීමට සමහර කර්මාන්ත පාසැල්වල පහසුව දී තිබීම විතරයි.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

අධ්‍යාපන ඇමතිතුමාට දැනුම් දුන්නොත් ඇති.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

එතුමා ඉදිරිපත් කළ කරුණ අධ්‍යාපන ඇමතිතුමාට ඉදිරිපත් කරන එකයි මට තිබෙන්නෙ.

පානදුරේ මන්ත්‍රීතුමා (ලෙස්ලි ගුණවර්ධන මයා.) ඉදිරිපත් කළ ප්‍රශ්නය සම්බන්ධයෙන් මට ලැබී තිබෙන තොරතුරු මා ඊයේ එතුමාට ලැබෙන්න සැලැස්සුව. ප්‍රදර්ශනය පැවැත්වීමේ තීරණය අරගෙන තිබෙන්නෙ දිස්ත්‍රික්ක කෘෂිකර්ම කාරක සභාව මගිනුයි. 1967 ජූලි මාසයේ 27 වැනිදා සිට 31 වැනිදා දක්වා දිනවල රජයේ පාසල් සියල්ලම වැඩ කටයුතුවල යෙදෙනව. නිවාඩු කාලයක් නොවෙයි. එහෙත් සෙන්ට් ජෝන්ස් විද්‍යාලය එකහවී තිබෙනව, ප්‍රදර්ශනය සඳහා ඒ දිනවල ඉඩ පහසුකම් ලබා දෙන්න. සමහරවිට වෙන දිනවල පන්ති පවත්වා ඒ අඩුපාඩුව පිරිමසා ගන්ට පුළුවන් වෙයි. මා හිතන්නෙ වර්ෂයකට දින 180 ක් හෝ 185 ක් පාසැල් පන්ති පවත්වන දින වන්න ඕනැ. මම හිතන්නෙ සෙන්ට් ජෝන්ස් විද්‍යාලය ඒ දින වෙනුවෙන් වෙන දිනවල පන්ති පවත්වා, ඒ අඩුපාඩුව සම්පූර්ණ කර ගන්න තීරණය කර ඇති. අනික් කාරණය, රජයට මේ නිසා කිසිම වියදමක් සිදු වෙන්නෙ නැහැ. දිස්ත්‍රික්ක කෘෂිකර්ම කාරක සභාව මේක නගරය අසලම තිබිය යුතුය කියන තීරණයට බැස තිබෙනව. ඒ වගේම සෙන්ට් ජෝන්ස් විද්‍යාලය නගරයේ හොඳට ඉඩ කඩ තිබෙන පාසලක් බව පෙනී යනව. මෙම විද්‍යාලය කච්චේරිය ළඟම පිහිටා තිබීම නිසා නිලධාරීන්ටත් වැඩි වෙලාවක් ගත නොකර තමන්ගේ රාජකාරි කටයුතුවලට බාධාවක් නොවන අන්දමට මෙම කටයුතුවල යෙදෙන්ට පුළුවන් බවත් විශ්වාස කරනව. මේ ආදී පහසුකම් රාශියක් ගැන කල්පනා කර බලලයි, දිස්ත්‍රික් කෘෂිකර්ම කාරක සභාව මේ තීරණයට බැහැල තිබෙන්නෙ.

ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ කරුණු සම්බන්ධයෙන් මා තවදුරටත් කරුණු විමසා බලන්නම්. මේ ප්‍රදර්ශනය දිස්ත්‍රික්ක කෘෂිකර්ම කාරක සභාවේ තීරණයක් අනුව පවත්වන්ට අදහස් කරන ප්‍රදර්ශනයක් නිසා මෙය වෙන පාසලකට ගන්න යයි මෙහෙන් නියෝගයක් කරන්න මට පුළුවන් කමක් නැහැ. කෙසේ වෙතත් මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ කරුණු ගැන තවදුරටත් විමසා බලනව.

අ. භා. 4.54

**එස්. ඒ. පීරිස් මයා.**
*(திரு. எஸ். ஏ. பீரிஸ்)*
(Mr. S. A. Peeris)

The sheet rubber market reached the lowest level in recent years when the Singapore Market closed at 54⅝ Dollar cents on the 16th of this month. This works out at 84¾ Ceylon cents f.o.b. or 78 cents per pound to the producer inclusive of the incentive of 2 cents.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පීරිස් මයා.]

The chief reason for this unfortunate situation has been attributed to the strike in the United States rubber industry where the major tyre producers—Goodrich, Firestone and Uniroyal—are affected, causing a tendency to a decline in world market prices.

Another vital factor was the earlier announcement from Djakarta that exports would be allowed from Indonesia to Singapore.

A further point that might have aided the downward trend was the "no change" in the General Services Administration of the United States of America stock-pile programme. The hoped-for reduction in the quantity to be sold in the second quarter did not materialize.

There is no duty imposed on rubber shipments now.

With regard to the request made by the hon. Member I shall convey it to the Hon. Minister in order that he may consider whether we could get in touch with Malaya and try to come to some agreement with the other countries.

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

*வினா விடுக்கப்பெற்று ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

**මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව ප. ව. 4.50ට අද දින සභා සම්මතිය අනුව 1967 ජූනි 2 වන සිකුරාදා ප. ව. 2 වනතෙක් කල් ගියේ ය.**

*அதன்படி பி. ப. 4.50 க்கு, சபை அதனது இன்றைய தீர்மானத்துக் கிணங்க, 1967 ஜூன் 2, வெள்ளிக் கிழமை பி. ப. 2 மணிவரை ஒத்தி வைக்கப்பெற்றது.*

*Adjourned accordingly at 4.50 P.M. until 2 P.M. on Friday, 2nd June 1967, pursuant to the Resolution of the House this Day.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු

## வினாக்களுக்கு எழுத்துமூல விடைகள்

## WRITTEN ANSWERS TO QUESTIONS

### අ. පො. ස. (සාමාන්‍ය) විභාගය, දෙසැම්බර් 1964 හා 1965 : සමත්වීම්

பொ. க. த. ப. (சாதாரணதர) பரீட்சைகள், 1964, 1965 : சித்தியடைந்தோர்

### G. C. E. (ORDINARY LEVEL) EXAMINATIONS, 1964 AND 1965 : PASSES

671/67

**එම්. සිවසිතම්පරම් මයා.** (උඩුප්පිඩ්ඩි)

*(திரு. எம். சிவசிதம்பரம்—உடுப்பிட்டி)*

(Mr. M. Sivasithamparam—Uduppiddi)

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: 1964 දෙසැම්බර් මාසයේදී සහ 1965 දෙසැම්බර් මාසයේදී පැවැත්වුණු අධ්‍යාපන පොදු සහතික (සාමාන්‍ය) විභාගයෙන්, ඒ ඒ මාධ්‍යයෙන් පහත සඳහන් විෂයයන්හි සාමාර්ථ්‍යය ලැබූවන්ගේ ප්‍රතිශතය එතුමා ඉදිරිපත් කරනවාද ? රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, ජීව විද්‍යාව, ශුද්ධ ගණිතය, උසස් ගණිතය.

*கல்வி, கலாசார விவகார அமைச்சரைக் கேட்ட வினா: 1964 ஆம் ஆண்டு டிசெம்பர் மாதத்திலும், 1965 ஆம் ஆண்டு டிசெம்பர் மாதத்திலும் நடத்தப்பட்ட பொதுக்கல்வித் தராதரப்பத்திர (சாதாரண தர)ப் பரீட்சைகளில், பின்வரும் பாடங்களில் ஒவ்வொரு மொழி மூலமும் சித்தியடைந்தவர்களின் விகிதத்தை அவர் தருவாரா :—இரசாயனம், பௌதிகம், உயிரியல், தூய கணிதம், உயர் கணிதம் ?*

asked the Minister of Education and Cultural Affairs : Will he give the percentage of passes, medium by medium, in the following subjects, at the G.C.E. (Ordinary Level) Examinations held in December 1964 and December 1965 :—Subjects : Chemistry, Physics, Biology, Pure Mathematics, Advanced Mathematics ?

**ගරු අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල (අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති)**

*(கௌரவ ஐ. எம். ஆர். ஏ. ஈரியகொல்ல—கல்வி, கலாசார விவகார அமைச்சர்)*

(The Hon. I. M. R. A. Iriyagolle—Minister of Education and Cultural Affairs)

(I) 1964 දෙසැම්බර් මස පැවැත්වුණු අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගයෙන් ඒ ඒ මාධ්‍යයෙන් පහත සඳහන් විෂයන්හි සමාර්ථ්‍යය ලැබූවන්ගේ ප්‍රතිශතය පහත දක්වේ :

| විෂයය | සිංහල | දෙමළ | ඉංග්‍රීසි |
|---|---|---|---|
| රසායන විද්‍යාව | 35.97 | 28.97 | 32.29 |
| භෞතික විද්‍යාව | 34.65 | 39.18 | 26.81 |
| ජීව විද්‍යාව | 45.84 | 37.4 | 38.78 |
| ශුද්ධ ගණිතය | 24.73 | 22.77 | 34.34 |
| උසස් ගණිතය | 27.12 | — | 38.13 |

(II) 1965 දෙසැම්බර් මස පැවැත්වුණු අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගයෙන් ඒ ඒ මාධ්‍යයෙන් පහත සඳහන් විෂයයන්හි සාමාර්ථ්‍යය ලැබූවන්ගේ ප්‍රතිශතය පහත දක්වේ :—

| විෂයය | සිංහල | දෙමළ | ඉංග්‍රීසි |
|---|---|---|---|
| රසායන විද්‍යාව (අළුත් නිර්දේශය) | 38.4 | 33.5 | 21 |
| රසායන විද්‍යාව (පරණ නිර්දේශය) | 47.3 | 50 | 54 |
| භෞතික විද්‍යාව (අළුත් නිර්දේශය) | 41.5 | 36.7 | 41.5 |
| භෞතික විද්‍යාව (පරණ නිර්දේශය) | 25.4 | 26 | 33.2 |
| ජීව විද්‍යාව (අළුත් නිර්දේශය) | 48.1 | 37.6 | 35.5 |
| ජීව විද්‍යාව (පරණ නිර්දේශය) | 50.5 | 44 | 41.3 |
| ශුද්ධ ගණිතය | 29.2 | 27.6 | 47.7 |
| උසස් ගණිතය | 28.9 | 30.5 | 36.2 |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඊරියගොල්ල]

(i) 1964 டிசெம்பரில் நடைபெற்ற க.பொ.த.ப. (சாதாரணதர)ப் பரீட்சையில் பின்வரும் பாடங்களில் ஒவ்வொரு மொழிமூலமும் பெற்ற சித்திகளின் சத வீதம் கீழே தரப்பட்டுள்ளது :

| பாடம் | சிங்களம் | தமிழ் | ஆங்கிலம் |
|---|---|---|---|
| இரசாயனவியல் | 35·97 | 28·97 | 32·29 |
| பௌதிகவியல் | 34·65 | 39·18 | 26·81 |
| உயிரியல் | 45·84 | 37·4 | 38·78 |
| தூயகணிதம் | 24·73 | 22·77 | 34·34 |
| உயர் கணிதம் | 27·12 | — | 38·13 |

(ii) 1965 டிசெம்பரில் நடைபெற்ற க.பொ.த.ப. (சாதாரணதர)ப் பரீட்சையில் பின்வரும் பாடங்களில் ஒவ்வொரு மொழிமூலமும் பெற்ற சித்திகளின் சத வீதம் கீழே தரப்பட்டுள்ளது :—

| பாடம் | சிங்களம் | தமிழ் | ஆங்கிலம் |
|---|---|---|---|
| இரசாயனவியல் (புதிய பாடத்திட்டம்) | 38·4 | 33·5 | 21 |
| இரசாயனவியல் (பழைய பாடத்திட்டம்) | 47·3 | 50 | 54 |
| பௌதிகவியல் (புதிய பாடத்திட்டம்) | 41·5 | 36·7 | 41·5 |
| பௌதிகவியல் (பழைய பாடத்திட்டம்) | 25·4 | 26 | 33·2 |
| உயிரியல் (புதிய பாடத்திட்டம்) | 48·1 | 37·6 | 35·5 |
| உயிரியல் (பழைய பாடத்திட்டம்) | 50·5 | 44 | 41·3 |
| தூயகணிதம் | 29·2 | 27·6 | 47·7 |
| உயர் கணிதம் | 28·9 | 30·5 | 36·2 |

(i) The percentage of passes, medium by medium, in the following subjects at the G. C. E (Ordinary Level) Examination held in December 1964 is given below :

| *Subject* | *Sinhala* | *Tamil* | *English* |
|---|---|---|---|
| Chemistry | 35·97 | 28·97 | 32·29 |
| Physics | 34·65 | 39 88 | 26·81 |
| Biology | 45·84 | 37·4 | 38·78 |
| Pure Mathematics | 24·73 | 22·77 | 34·34 |
| Advanced Mathematics | 27·12 | — | 38·13 |

(ii) The percentage of passes, medium by medium in the following subjects at the G. C. E (Ordinary Level) Examination held in December 1965 is given below :

| *Subject* | *Sinhala* | *Tamil* | *English* |
|---|---|---|---|
| Chemistry (New Syllabus) | 38·4 | 33·5 | 21· |
| Chemistry (Old Syllabus) | 47·3 | 50· | 54· |
| Physics (New Syllabus) | 41·5 | 36·7 | 41·5 |
| Physics (Old Syllabus) | 25·4 | 26. | 33.2 |
| Biology (New Syllabus) | 48·1 | 37·6 | 35.5 |
| Biology (Old Syllabus) | 50·5 | 44· | 41·3 |
| Pure Mathematics | 29·2 | 27·6 | 47·7 |
| Advanced Mathematics | 28·9 | 30·5 | 36·2 |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දායක මුදල් : මුදල් ගෙවන දිනෙන් පසුව ඇරඹෙන මාසයේ සිට මාස 12ක් සඳහා රු. 32.00යි. අශෝධිත පිටපත් සඳහා නම් රු. 35.00යි. මාස 6 කට ගාස්තුවෙන් අඩකි. පිටපතක් ශත 30යි. තැපෑලෙන් ශත 45යි. මුදල්, කොළඹ ගාලු මුවදොර, මහලේකම් කාර්යාලයේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කලින් එවිය යුතුය.

சந்தா : பணம் கொடுத்த தேதியை யடுத்துவரும் மாதம் தொடக்கம் 12 மாதத்துக்கு ரூபா 32.00 (திருத்தப்படாத பிரதிகள் ரூபா 35.00). 6 மாதத்துக்கு அரைக்கட்டணம் ; தனிப்பிரதி சதம் 30, தபால்மூலம் 45 சதம், முற்பணமாக அரசாங்க வெளியீட்டு அலுவலக அத்தியட்சரிடம் (த. பெ. 500, அரசாங்க கருமகம், கொழும்பு 1) செலுத்தலாம்.

Subscriptions : 12 months commencing from month following date of payment Rs. 32.00 (uncorrected copies Rs. 35.00). Half rates for 6 months, each part 30 cents, by post 45 cents, payable in advance to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box, 500, Colombo 1.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org